


WWW.EXPRESSLANKA.TK 

# 01

රාස්සිගේ අව්ව නැති වුන හින්දා හැන්දෑවේ තියෙන චමත්කාරයෙ පුංචි අඩුවක් තිබ්බා. ඒ වුනාට සතියෙ දවසක ටවුමෙ තියෙන සුපුරුදු කලබලයට නම් විවේකයක් තිබ්බෙ නෑ. මන්දුරම් අහසෙන් හීතියට හැලෙන වැහි බිංදු නිසා වීදිය දිගේ එහාට මෙහාට යන මිනිස්සුන්ගේ කකුල් වෙනදටත් වැඩිය කලබලයි. ඒ අතරේ කඩපේළියේ කෙලවර තියෙන සිතිදුගේ ලොතරැයි කුඩුවෙ යකඩ කටින් චන්ද්‍ර මල්ලි අයියට සහයෝගය දෙන හඬ වීදිය දිගේ ගලාගෙන ගියා.

"එන්න... ඔබේ වාසනාව උරගා බලන්න... තව ටිකට් දහයයි..."

සිතිදු දුප්පත් අම්ම කෙනෙකුට ටිකට් එකක් ගලවල දෙන ගමන් බැලුවේ කුඩුව ළගට ඇවිත් නවත්වපු බී. එම්. ඩබ්ලිව් එක දිහා. කාර්එකේ ඉස්සරහ දොර ඇරගෙන එළියට ආවේ ලස්සන අව්කන්නාඩියක් දාගෙන කකුල් වැහෙන්න දිග ගවුමක් ඇඳ ගත්තු ගෑණු ළමයෙක්. එයා ලොතරැයි කුඩුව ළහට එනකොට සිතිදුයි චන්ද්‍රයි පුදුම වෙලා වගේ බලන් හිටියා.



WWW.EXPRESSLANKA.TK 2

"අද අදින්නේ මොනවද?" මාලිගා කුඩුව ළගට ඇවිත් සිතිදුගෙන් ඇහුවා.

"අද ලොතරැයි වර්ග දෙකක් අදිනව මිස්... මොකක්ද ඕනේ...?" සිතිදු එහෙම උත්තර දුන්නම ඒ හඬ මාලිගාගේ හදවතට දැනුනෙ අමුතු විදිහට. ඒත් ඒ අමුත්තට හේතුව සසර පුරුද්ද හා බැඳුන මතකයක්ද කියල හිතන්න තරම් මාලිගාට වෙලාවක් තිබ්බෙ නෑ. ඒත් සිතිදුගෙ මූණ දිහා බලපු මාලිගාගේ ඇස්නම් තවත් ලොකුවුණා. සිතිදුගේ මූණෙන් මාලිගාට පෙනුනේ වෙළාදාමට හුරුකමක් තියෙන තරුණයෙකුගේ හැඩරුව නෙමෙයි.

"මට වර්ග දෙකෙන්ම දෙක දෙක දෙන්න..."

මාලිගා පර්ස් එක ඇරලා රුපියල් සීයේ කොලයක් අරගෙන සිතිදුට දික්කරන ගමන් කිව්වා. එතකොටම චන්දු ටිකට් හතරක් ගලවල මාලිගාට දුන්නෙ එයත් එක්ක හිනාවෙලා. මාලිගාත් ඒ හිනාවට එයාගේ කම්මුල් වලගැහෙන ලස්සන හිනාවෙන් චන්දුට සංග්‍රහ කෙරුවා.

"ඇයි මිස් ඔයා ලොතරැයි ගන්නේ?" මාලිගාව දැකපු ගමන්ම පුංචි හිතට ආව ප්‍රශ්නයක් ඒ වෙලාවේ චන්දු එළියට දැම්මා.

"ඇයි මල්ලියෝ... මට ලොතරැයි ගන්න හොඳ නැද්ද ආ...?" මාලිගා චන්දුගේ හුරතල් මූණෙ තිකටෙන් අල්ලලා හිනාවෙගෙන ඇහුවා. ඒක දැකපු සිතිදුටත් හිනාගියා.

"මෙයා හරියට පැහිලා මිස්" සිතිදු රුපියල් සීයේ ඉතුරු සල්ලි මාලිගාට දෙන ගමන් කිව්වා.

"අනේ නැහැ... මල්ලි ඇහුවේ වැදගත් ප්‍රශ්නයක්නේ. මෙයාට හොඳට යමක් ගැන හිතන්න පුළුවන්..." මාලිගා එහෙම කිව්වෙ දාගෙන හිටපු උපැස් යුවල අතට අරගෙන නළලට වැටිල තිබුණු හිසකේ



WWW.EXPRESSLANKA.TK 3

වැලක් අතින් හදන ගමන්. එතකොටයි සිතිඳුට මාලිගාගේ ඇස්වල ලස්සන පෙනුනේ... 'කේටී වින්ස්ලට් වගේ නෙමෙයි, මේ කෙල්ල ඊට වඩා හුඟක් ලස්සනයි කියල සිතිඳුට හිතුනා.

මාලිගා ආපහු කාරෙකේ දොර ඇරලා ඇතුල් වෙන ගමනුත් චන්දුයි සිතිඳුයි දිහා බලලා හිනාවුණා. චන්දු අත වැනුවා. මාලිගත් අත වැනුවා. බී. එම්. ඩබ්ලිව් එක ඉස්සරහට යනවා අයියයි මල්ලියි බලන් හිටියා. ඊට පස්සෙ සිතිඳු චන්දු දිහා බැලුවා. චන්දු එතකොට කුඩුවෙන් එළියට ඇවිත් පාර අයිනට වෙලා හිටියෙ.

"චන්දු මෙහෙ එනවා..." සිතිඳු කතා කෙරුවා.

"ඇයි...?"

"මොකද මෙතනට ටිකට් ගන්න එන අයගෙන් පණ්ඩිත වචන අහන්නේ...?"

"නෑ අයියේ... මට ඒ අක්කව දැක්කම නිකම්ම ඇහුණා... ඇයි එයා එච්චර පෝසත් කෙනෙක් වෙලත් ලොතරැයි ගන්නේ...?"

"ඔයාට ඒ පණ්ඩිත කම් වලින් වැඩක් නැහැ. මීට පස්සෙ ටිකට් ගන්න එන අයගෙන් ඕන්නැති දේවල් අහන්නැහැ... තේරුණාද?"

"හ්ම්..."

චන්දු ඔළුව හොලවල බිම බලාගත්තා. සිතිඳු චන්දුට එහෙම කිව්වට හිත යටින් මල්ලිගෙ පණ්ඩිත කම් ගැන හිනත් වුණා. එතකොටම...

"අයියේ... මේ අර මිස්ගෙ පර්ස් එකෙන්ද කොහෙද වැටිල තියෙන්නේ..." චන්දු එකපාරටම දැකපු ලොතරැයි කුඩුව ළඟ වැටිල තිබුණු හතරට නවපු රෝස්පාට කොලේ අරගෙන සිතිඳුට දික්කෙරුවා. සිතිඳු කොලය අරගෙන දිග හැරියා. සිතිඳුට අදහන්න බැරිවුණා. ඒ



WWW.EXPRESSLANKA.TK 4

කොලයේ ඇතුල් පැත්තේ ලියවිලා තිබුනේ මීට සති කිහිපයකට කලින් සිනිඳු පත්තරේකට ලියල යවපු දුක්බර කවි පත්තිය...

"චන්දු මේ කොලේ ඒ මිස්ගෙ පර්ස් එකෙන් වැටෙනවා ඔයා දැක්කද...?" සිනිඳු පුදුමයෙන් වගේ චන්දු දිහා බලලා ඇහුවා.

"නැහැ. ඒ වුනාට ඒ මිස් එන්න වුට්ටකට ඉස්සෙලා මං බිම තිබුණ ටිකට් කැලි අස් කරනකොට ඔය කොලේ මෙතන තිබ්බෙ නහැ."

"මේකෙ ලියල තියෙන්නේ ගිය සතියේ පත්තරේ පලවුන මගේ කවියක්නෙ චන්දු..."

"ආ...! කෝ බලන්න..."

එළියෙ හිටපු චන්දු ඉක්මනට කුඩුව ඇතුළට ඇවිත් අයියගේ අතේ තිබුණ කොලය අතට අරගෙන බැලුවා... චන්දුගෙ මූණටත් ලස්සන හිනාවක් ආවා...

"ඒ මොකටද අයියේ ඒ මිස් ඔයාගේ කවියක් මේ කොලයක ලියාගෙන තියෙන්නේ...?"

"මං කොහොමද දන්නෙ මල්ලී..."

එහෙම කියලා සිනිඳු මල්ලිගෙ ඔළුව අතගෑවා.

"මං හිතන්නෙ අයියගෙ කවිය ලස්සන හින්දා වෙන්න ඇති."

චන්දු හිනාවේගෙන කිව්වම සිනිඳුගේ මූණෙනුත් හිත ඇතුලේ තිබුණ සතුට හිනාවක් විදිහට එළියට ආවා.

"අයියේ ඒ මිස් ආයෙ කවදහරි ආවොත් අපි මේ කොලේ එයාට දෙමු. එතකොට මං කියන්නම් මේ කවිය ලියල තියෙන්නේ අයියයි කියලා..."

"චන්දුට පිස්සුද...? එහෙම කියන්න ඕන්නැහැ... එයා ආවොත් අපි මුකුත් නොකියා මේ කොලේ එයාට දෙමු."

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄


WWW.EXPRESSLANKA.TK 5

චන්දුයි සිනිදුයි සයිකලයෙන් එනකොට ආත්තම්මා කුප්පි ලාම්පුවත් තියාගෙන වැට ළඟට ඇවිත් ගුරු පාර දිහා බලාගෙන ඉන්නවා. දුර තියාම ආත්තම්මව දැකපු සිනිදුට දුක හිතුණා. අම්මයි තාත්තයි නැතිවුනාට පස්සෙ සිනිදුවයි චන්දුවයි බලාගත්තේ දුප්පත් ආත්තම්මා.

"ඇයි ආත්තම්මේ මිදුලට වෙලා පිනි බබා ඉන්නේ?"

සිනිදු ආත්තම්මා ළඟට ඇවිත් සයිකලේ නවත්වන ගමන් ඇහුවා.

"උඹල දෙන්න පරක්කු හින්දා බැලුවෙ පුතේ..."

"ඒ වුනාට පිනි බබා ඉඳලා ආත්තම්මට මොනවා හරි වුනොත්"

සිනිදු එහෙම කිව්වම ආත්තම්මා ඒකට මුකුත් නොකිය චන්දුගෙයි සිනිදුගෙයි පිටිපස්සෙන් කුප්පි ලාම්පුව අල්ලගෙන ආවා.

"ආ... ආත්තම්මේ..."

චන්දු ගෙට ඇතුල්වෙන්නත් ඉස්සර අතේ තිබුණ බෑග් එක ආත්තම්මට දික්කෙරුවා.

"මොනවද පුතේ?"

"අයියා ආත්තම්මට මාමයිට් කුප්පියකුයි පිටි පෙට්ටියකුයි ගත්තා..."

"අනේ මට මොකටද පුතේ මෙච්චර වියදම් කරන්නේ.?."

ආත්තම්මා සිනිදු දිහා බලලා එහෙම කියන කොට සිනිදු සයිකලේ ගෙයි බිත්තියට හේත්තු කරලා ලොක් කරනවා.

"ආත්තම්මටයි මල්ලිටයි වියදම් කරන්නැතුව මං කාට වියදම් කරන්නද ආත්තම්මේ."

සිනිදු අහිංසක විදිහට හිනාවෙලා ආත්තම්මා දිහා බලලා කිව්වා. ඒ වුනාට ඒ හිනාව කළුවර තිබුණ නිසා ආත්තම්මට පෙනුණෙ නෑ.

"එහෙනම් පුතේ ඉක්මණට ඇඟපත හෝදාගෙන එන්න කෑම කන්න. දැන් හුඟක් රෑ වෙලා..."

ආත්තම්මා එහෙම කියාගෙන කුස්සිය පැත්තට යනකොට චන්දුත් ඒ පස්සෙන්ම ගියා.

"ආත්තම්මෙ... අද මාර වැඩක් වුනානේ..."

"ඇයි... මොකද වුනේ පුතේ...?" ආත්තම්මා ටිකක් පුදුමයෙන් වගේ චන්දු දිහා බලලා ඇහුවා.

"අද ලස්සන පුංචි නෝනා කෙනෙක් ආවා ආත්තම්මේ කාරෙකකින් ටිකට් ගන්න..."

"ඉ . ති . න්?."

"ඉතිං එයා සල්ලි දෙන්න යනකොට පර්ස් එකේ තිබිල වැටිච්ච කොලයක් මං එයා ගියාට පස්සෙ ඇහුලුවා. ඒ කොලේ ලියලා තිබුණේ අපේ අයියා පත්තරේට ලියල තිබුණ කවියක්නේ..."

"හැබැට... ඉතිං ඒ නෝනා ආපහු ආවද පුතේ ඒ කොලේ ගෙනියන්න?"

"නැ, අයියා කිව්වා ආවොත් ඒ කොලේ දුන්නට ඒක ලිව්වෙ එයයි කියල කියන්න එපා කියලා..."

"ඒ මොකද?"

"දන්නැහැ... අයියා මුකුත් කිව්වේ නැහැ..."



WWW.EXPRESSLANKA.TK 7

# 02

හිරු සුපුරුදු විදිහට තවත් දවසක් අරගෙන ආවා. චන්දු ඉස්කෝලෙ ගියා. සිතිදු උදෙන්ම ලොතරැයි කුඩුවට ඇවිත් වැඩ පටන් ගත්තා. සෙනහ එකා දෙන්නා ටිකට් ගන්න එනකොට ඒ අතරේ කුඩුව ළඟට ඇවිත් නවත්වපු බී. එම්. ඩබ්ලිව් එක දිහා සිතිදුට නොබල ඉන්න බැරිවුණා.

"එයා අදත්..!" සිතිදුට හිතින් ඉබේම කියවුණා.

"මේ... ඊයේ ඔයාගෙන් ගත්තු ටිකට් එකකට දිනුමක් තියෙනවා. චුට්ටක් බලනවද...?"

ලස්සනම ලස්සන හිනාවකින් මූණ පුරවාගෙන කුඩුව ළඟට ආව මාලිගා පර්ස් එකෙන් ගත්තු ටිකට් එක සිතිදුට දික් කරන ගමන් කිව්වා. සිතිදු ටිකට් එක අරගෙන ගැළපෙන අංක මොනවද කියල බැලුවා. සිතිදුගෙ මූණෙත් හිනාව තව වැඩිවුණා.

මිස් මේකේ අංක තුනක් ගැළපෙනවා... රුපියල් පන්සීයක් තියෙනවා"

"එහෙනම් දෙන්න..." මාලිගා දහකාර විදිහට ඔළුව හොලවලා ගාණක් නැති විදිහට කිව්වම සිතිදුට හිත යටින් ආව හිනාවත්

WWW.EXPRESSLANKA.TK 8

එක්කම පුදුමත් හිතුණා.

"අනේ මිස්... දැන්නම් මගේ ළඟ පන්සීයක් දෙන්න සල්ලි නැහැනේ. හවසට ඔනි නම් දෙන්න පුළුවන්... මිස්ට හදිස්සිනම් අර බස් ස්ටෑන්ඩ් එක ළඟ තියෙන ලොතරැයි ඒජන්ට් එකට දීලා දැන්ම සල්ලි ගන්න පුළුවන්."

සිනිදු එහෙම කිව්වම මාලිගාගේ මූණ ටිකක් අමුතු වුණා. ඒ අමුත්තට හේතුව මොකක්ද කියල සිනිඳුට හරියට තේරුනේ නැහැ... ඒක දැනගෙන ඉන්න ඇත්තේ සමහර විට උඩ ඉන්න දෙවියො විතරයි.

"නෑ... මට හදිස්සියක් නෑ. මං ටිකට් එක ගත්තේ ඔයාගෙන්නේ,.. හවසට ඔයාම සල්ලි දෙන්න. එහෙනම්... මං ගිහින් එන්නම්"

මාලිගා හිනාවෙලා එහෙම කියලා යන්න හැරුණා.

"මේ... මිස් ටිකට්' එක ආ..."

"එපා... ඔයා ළඟම තියාගන්න"

මාලිගා ටිකට් එක සිනිදු අතේ තියෙද්දිම එහෙම කියල යනකොට සිනිදුට තවත් පුදුම හිතුණා. ඒ එක්කම ඊයේ වත්දු අහුලලා දීපු කොල කැබැල්ල සිනිදුට මතක් වුණා.

"මේ... මිස්.!."

කාරෙකේ දොර ළඟට යද්දිම ඇහුණු සිනිදුගේ හඬින් මාලිගා ආයෙමත් හැරිලා බැලුවා. ඒ හැරිල්ලත් එක්කම මාලිගාගේ පිට මැද්දට කඩාදාලා තිබුණු කෙස් වැටිය හුළඟේ පාවෙලා ආයෙමත් පිටට වැටෙන ලස්සන සිනිදු දැක්කා.

"ඇයි...?" මාලිගා ළඟටම ඇවිත් ඇහුවා.

"මේක මිස්ගෙද?"

සිනිදු අතේ තිබුණු කොල කැබැල්ල මාලිගාට දික්කරන ගමන් ඇහුවා. මාලිගා කොලේ අතට අරගෙන දිගහැරියා.

"හා... නේ...! මේක කොහේද තිබ්බෙ...?"

"ඊයේ මෙතන වැටිල තිබ්ල මල්ලි අහුලලා දුන්නේ..."



WWW.EXPRESSLANKA.TK 9

"ඇත්තද.?. ගොඩක් ස්තුතියි. මං මේක සෑහෙන්න හෙව්වා:.."

"මිස් ඔය කවියට හුඟක් ආසද?"

සිතිදු එහෙම ඇහුවම මාලිගාගේ ඇස් ලොකුවුණා.

"නැතුව... ඔයා කියෙව්වද මේක...?"

"ඔව්..."

"මේක මං පත්තරේකින් අරගෙන ලියාගත්තේ. මේ මං ආසම ලේඛකයෙක් ලියපු කවියක්." මාලිගා එහෙම කියනකොට සිතිදුට සතුටක් වගේම පුදුමත් හිතුණා. ඒත් ඔයා ආශා කරන මේ කවිය ලිව්වෙ මමයි කියල කියන්න තරම් උවමනාවක් සිතිදුගෙ හිතට ආවේ නෑ...

"ඇයි...?" සිතිදුගෙ මුහුණෙ අමුත්තක් දැනිල වගේ මාලිගා ඇහුවා.

"නැහැ... මුකුත් නැහැ..."

"ඒක නෙමෙයි... කෝ ඔයාගේ මල්ලි?"

"එයා ඉස්කෝලේ ගිහිං"

"ඇත්තද... එහෙනම් ඔයා මට පුංචි උදව්වක් කරනවද?"

"මොකක්ද...?"

"මට හවසට එන්න හම්බ වෙන්නෙ නෑ... ඔයා අර ටිකට් එකේ සල්ලි වලින් ඔයාගේ චූටි මල්ලිට කැමති දෙයක් අරන් දෙන්න හොඳද...?"

මාලිගා කියපු දේ ඇහුවම සිතිදුට එළොව මෙළොව ගැටගහන්න බැරුව ගියා...

"මිස්ට පිස්සුද...?" සිතිදුගේ කටින් ඉබේටම කියවුනා.

"මේ... ඒක මගේ කැමැත්ත... ඔයා මං කියපු දේ කරන්න හරිද... එහෙනම් මං යනවා..."

සිතිදුට තවත් මුකුත් කියන්න ඉඩක් ලැබුනේ නැහැ. මාලිගා ඉක්මනින් ගිහින් කාරෙකේ දකුණු පැත්තෙ ඉස්සරහ දොර ඇරගෙන ඇතුල් වුණා. මීට කලින් එක දවසක් විතරක් දකපු මේ කෙල්ලගේ අපූරු හැසිරීම සිතිදුට අදහගන්න බැහැ..." මේ මගේ ඇස් ඉදිරිපිට හිටියේ මේ ලෝකෙ හැබෑවටම ජීවත්වෙන මනුෂ්‍ය දෙව්දුවක්ද...?"

සිතිදුට එහෙම හිතුනා... මාලිගා කාර්එක පනගන්වන අතරේ ආයෙමත් සිතිදු දිහා බලලා හිනාවුණා. ඒ හිනාව, ඒ බැල්ම මොහොතකට සිතිදුගේ හිත වෙනත් ලෝකෙකට අරගෙන ගියා. සිතිදුට නොදැනීම සිතිදුගෙ ඇස් මාලිගාගේ කාර් එක නොපෙනී යනකම්ම ඒ පැත්තට හැරිලා තිබුණා.

"අයියේ... අර ඊයේ ආව මිස්ගෙ කාර් එක නේද යන්නේ...?"

චන්දු කලබලයෙන් වගේ ළගටම ඇවිත් අහනකම් සිතිදු චන්දුව දක්කෙ නැහැ.

"ආ... ඔව්... ඒ කාර්එක තමයි, ඔයා කොහොමද ඒක අඳුරගත්තේ?"

සිතිදු එකපාරටම චන්දු දිහාවට හැරිලා ඇහුවා. සිතිදු හිටියේ තාමත් කිසිම දෙයක් හිතාගන්න බැරුව. හරියට වෙනස් ලෝකෙකට ගිහින් අතරමං වුන කෙනෙක් වගේ.

"මං දුරතියාම දැක්කා ඒ කාර් එක මෙතන ඉඳන් යනවා. ඒ මිස් අදත් ටිකට් ගන්න ආවද අයියේ...?"

චන්දු අයියගෙ ප්‍රශ්නෙට උත්තර දෙන ගමන් අයියගෙනුත් ප්‍රශ්නයක් ඇහුවා.

"නෑ... එයා ඊයේ මෙහෙන් ගත්තු ටිකට් එකකට රුපියල් පන්සීයක් තියෙනවා. ඒක ගන්න ආවේ..."

"හා... නේ... ඇත්තද.? ඉතිං අයියා අර මං අහුලල දුන්නු කොලේ පෙන්නුවේ නැද්ද ඒ අක්කට.?"

"පෙන්නුවා... ඒක එයාගෙ තමයි මල්ලි..."

"ඉතිං එයා මොකද කිව්වේ...?"

"බොහොම ස්තූතියි කියල අරගෙන ගියා..."

සිතිදු එහෙම කිව්වම චන්දුට හිනාගියා. ඒ එක්කම තවත් ප්‍රශ්ණයකුත් හිතට ආවා.

"අයියා කිව්වෙ නැද්ද ඒකෙ ලියල තියෙන්නෙ අයියා ලියපු කවියක් කියලා?"

"නැහැ මල්ලි..."



WWW.EXPRESSLANKA.TK 11

චන්දු තවත් මුකුත් අහන්නැතුව පුංචි කල්පනාවකට වැටුනා. සිනිදු චන්දුගේ ඔළුව අතගෑවා.

"මල්ලී..."

"ම්"

"ආත්තම්මා බලාගෙන ඇති... පරක්කු වෙන්නැතුව යනවද...?

සිනිදු හුගක් ආදරෙන් මල්ලිට කිව්වා. එතකොට චන්දුටත් අමතක වුන දෙයක් මතක් වුනා වගේ බෑග් එකඇරලා උඩින්ම තියාගෙන ආව පුංචි පාර්සලේ අරගෙන සිනිදුට දික් කෙරුවා.

"ආ..."

සිනිදුට මුකුත්ම සිතාගන්න බැරිවුනා

"මොනවද...?"

"ඕක ලිහලා බලන්නකෝ. චූටි අක්කා ඉස්කෝලෙදි දුන්නා ඔයාට දෙන්න කියලා..."

සිනිදු කවරෙ දිග හැරියා. ඒකෙ තිබුනෙ අලුත් පිටින්ම කරුණාසේන ජයලත්ගේ "පෙම්පුවත" නවකතා පොත. පුදුම වෙලා වගේ සිනිදු පොතේ පිටු දිග හැරියා. පොත ඇතුළට ලස්සන ලේන්සු දෙකක් නවලා දලා. එක ලේන්සුවක ලස්සන අකුරෙන් "සුභ උපන්දිනයක්" කියල මහල තියෙනව දක්කම සිනිදුගේ මුණෙ තිබුණ සතුටු පෙනුම තවත් වැඩි වුණා. චන්දු අයියගේ මූණ දිහා බලාගෙන ඉන්නවා.

"මේ හෙට මගේ උපන්දිනේටනේ මුතු එවලා තියෙන්නේ. මේ බලන්නකෝ මල්ලි..."

සිනිදු මූණට ආව හිනාවත් එක්කම සුභ උපන්දිනයක් කියල මහල තිබුණු ලේන්සුව අත් දෙකෙන්ම අල්ලගෙන චන්දුට දිග ඇරලා පෙන්නුවා.

"හා... නේ... චූටි අක්කා මං ඇහුවම මටවත් කිව්වේ නෑ මොනවද තීන්නේ කියලා"

චන්දු කිව්වෙ හිනාවෙවී.

"ආ... මේක ඔයා ගන්න..."



WWW.EXPRESSLANKA.TK 12

සිනිදු ලේන්සු දෙකෙන් එකක් මල්ලිට දික්කෙරුවා.

"ලස්සනද...?"

චන්ද්‍ර ඒක අතට ගන්නකොට සිනිදු ඇහුවා. ලස්සනයි කියන්න වගේ චන්ද්‍ර හිනාවෙලා ඔළුව දෙපැත්තට වැනුවා... ඊට පස්සේ...

"අයියේ හෙට ඔයාගේ උපන්දිනේට ගිය පාර වගේ අපි දළදා මාලිගාවෙ යමුද...?"

අයියගේ මූණ දිහා බලාගෙන චන්ද්‍ර ඇහුවේ අහිංසක විදිහට. ඒ මූණ සතුටින් පිරිලා...

"හ්ම්... ආත්තම්මවත් එක්කගෙන හවසට යමු..."

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

මාලිගා කොළඹට එනකොට 'තරමක් හවස් වුණා. කාරෙක වත්තට ඇතුල් කරල පෝටිකෝව යට නතර කරන කොට රත්නායක ගේ ඇතුලේ ඉඳගෙන එළියට ආවා...

"කොහොමද දුව නුවර ගමන සාර්ථකද...?"

කාරෙකේ දොර ඇරගෙන මාලිගා බහිනකොට රත්නායක ඇහුවා.

"ඔව් අප්පච්චි මල්කි මට එහෙන් හොඳ ඩාන්සින් කරන ගුරුතුමෙක් මීට් කෙරුවා... එයා කැමති වුණා එයාගේ කට්ටියව අපේ ෂෝ එකට එවන්න..."

"ඇත්තට... එහෙනම් ෂෝක්නේ දුව නුවරින්ම ඒවගේ ගෲප් එකක් හොයාගන්න පුළුවන් වුන එක. ඒක නෙමෙයි,.. මං අන්න ඔයා කියන සිංදුව ලියව ගන්න මිස්ටර් වනිගසේකරට එන්න කිව්වා. දන්නවනේ දන් මිනිහා තමයි ලංකාවේ ඉන්න ජනප්‍රියම ගීත රචකයා..."

අප්පච්චි එහෙම කිව්වම මාලිගාගේ ඇස් දෙක ලොකු වුණා. මෙතෙක් වේලා තමන්ගේ හිතේ නලියමින් තිබුන 'අදහසක් ඒ එක්කම බිඳෙන්න යන බව මාලිගාට දැනුනා.

"අනේ මං හොඳ සිංදුවක් හොයා ගත්තනේ අප්පච්චි..."



WWW.EXPRESSLANKA.TK 13

"හොයාගත්තා... කොහොන්ද...?"

රත්නායක පුදුම වෙලා වගේ ඇහුවේ.

"පත්තරෙන්... ඒක පත්තරේට ලියල තිබුණ කවියක් අප්පච්චි. ඒ වුනාට ඒක ලියල තියෙන්නෙ ගීතයක් වගේ. ඒකෙ අදහස හරිම ලස්සනයි."

"ඉතිං කොහොමද ඔයා ඒක ගන්නේ...?"

"මං ඒක ලියපු එක්කෙනාගෙන් අවසරේ ගන්නවා..."

"ඔයා ඒ ලියපු එක්කෙනාව අඳුරනවද...?"

"නැහැ... නම විතරයි දන්නේ... මං මීට කලින් එයාගේ කවි නම් කියවලා තියෙනවා..."

"එහෙනම් කොහොමද ළමයෝ එයාව හොයාගන්නේ...?"

"මං ඒ පත්තර කන්තෝරුවට කෝල් කරලා එයාව හොයා ගන්නවා..."

මාලිගා කිසිම ගානක් නැති විදියට හිනාවෙවී එහෙම කිව්වා. රත්නායකගේ ඇස්දෙක ලොකු වෙලා නළල රැලි වැටුණා...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

පහුවෙනිදා ආයෙමත් නුවරට එන්න වෙයි කියල කලින් දවසේ මල්කිලගෙ ගෙදර ඉඳන් එනකොට මාලිගා හීනෙකින්වත් හිතල තිබුන්නැහැ. ඒත්... දෛවය අපේ ජීවිත ඉරණම් විසඳන්න අපූරු විදිහට සැලසුම් කරල තියෙනවා.

බී. එම්. ඩබ්ලිව්. එක මල්කිලගෙ වත්තට ඇතුල් වෙනකොට වෙලාව හවස 2.55 යි. මිදුලෙ නවත්වපු කාරෙකේ සද්දේ ඇහිලා මල්කි ගේ ඇතුලේ ඉඳන් එළියට ආවා.

"හා... නේ... මාලී..! ඇයි මේ ගිය පයිං...?"

කාරෙකේ දොර ඇරගෙන බහින මාලිගාව දැකපු ගමන් පුදුම වෙලා වගේ එහෙම කියාගෙන මල්කි ළඟට ආවා...


WWW.EXPRESSLANKA.TK 14

"ඇයි... මං ආයෙත් ආවට අකමැතිද...?" මාලිගා ඇහුවේ හිනාවෙලා.
"පිස්සී... මං ඇහුවේ මොකද උඹ ඊයේ මෙහේ ඉඳන් ගිහින් අද ආවේ කියලා?"
"පොඩි හදිස්සියක්"
"හදිස්සියක්..! මොකක්ද.?"
"මට මෙහෙන් තව එක්කෙනෙක් හොයාගන්න තියෙනවා."
"තව එක්කෙනෙක්..! ඒ කව්ද?"
මල්කිට මුකුත්ම හිතාගන්න බැරිවුනා.
"සිතිදු බණ්ඩාරව" මාලිගා බෙල්ල ඇල කරලා ඇස් පුංචි කරල කිව්වා.
මල්කිට හිනා ගියා.
"ආ... අර උඹ හොයන කවි ලියන මැන්ද...?"
"ඔව්... එයා තමයි..."
"ඉතිං එයා කොහෙද මෙහේ...?"
"එයා ඉන්නේ පේරාදෙණියේ..."
"පේරාදෙණියේ...?" මල්කිගේ ඇස් ලොකු වුණා
"ඔව්. මං පත්තර කන්තෝරුවට කෝල් කරල එඩ්‍රස් එක හොයාගත්තා."
"උඹනම් මාර කෙල්ලෙක් තමයි... එහෙනම් මිනිහා මේ ළඟමනෙ ඇත්තේ."
"ඔව්... හොයාගන්න අමාරු වෙන එකක් නෑ. යමුද ඉක්මණට...?"
"දැන්ම...? අපි හෙට උදේ යමු:.. උඹට මහන්සි නැද්ද පැය ගානක් ඩ්‍රයිව් කරලා..?"
"බෑ... බෑ... මං උදෙන්ම කොළඹ යන්න ඕනි..."
මාලිගා එහෙම කියනකොට මල්කිගේ අම්මත් ගේ ඇතුලෙ ඉඳන් එළියට ආවා...
"මොකද දුව හදිස්සියක්ද?" මාලිගාව දැකපු ගමන් මල්කිගේ අම්මා ඇහුවා...


WWW.EXPRESSLANKA.TK 15

"ඔව් ආන්ටි.:. මේ කොන්සට් එකේ වැඩකට අයෙමත් එන්න වුණානේ..." මාලිගා එහෙම කියාගෙන මල්කිගේ අම්මා ළඟට ගියා. ඊට පස්සෙ තුන්දෙනාම කතා කර කර ගේ ඇතුළට ගියා.

මාලිගා මල්කිට පෙන්නුවෙ නැති වුනාට සිතිදු බණ්ඩාරව දකිනකම් මාලිගාට ඉවසුමක් තිබුනේ නෑ. මහ වෙලාවක් ගියේ නෑ... බී. එම්. ඩබ්ලිව්. එක උවමනා තැනටම ඇවිත් තිබුණා.

"අතන කඩෙන් කියපු විදිහට නම් මේක තමයි ගේ."

කාරෙක තාරපාරෙන් හරවලා ගුරු පාර දිගේ ඇවිත් නවත්වපු ගමන් දකුණු පැත්තේ තිබුණ පුංචි ලැලි ගේ දිහා බලලා මාලිගා කිව්වා.

"මේක...?" මල්කිගේ ඇස් ලොකු වුනා.

"ඇයි... මේක වෙන්න බැරිද.?"

"මෙහේ ඉඳීවිද බං පත්තරේකට ලියන එකෙක්..."

"ඇයි උඹ හිතුවද පත්තරවලට ලියන එවුන් ගස් උඩයි ඉන්නේ කියල..? මේ ... "අම්මා" ලියපු මැක්සිම් ගෝර්කි ත් මුලින්ම ඉඳලා තියෙන්නේ මඩුවක... හරිද?"

මාලිගා එහෙම කියනගමන් දකුණු පැත්තේ දොර ඇරියා. මල්කි මාලිගා කියපු කතාවට මූණට ආව හිනාවත් එක්කම අනිත් පැත්තෙ දොර ඇරගෙන බිමට බැස්සා.

මාලිගයි මල්කියි ලී ගේට්ටුව ඇරගෙන වත්තට ඇතුල් වුනා. ඒ වුනාට ඉස්සරහ දොර වහල තිබුණා. මාලිගා දොරට තට්ටු කෙරුවා. ඒත් වැඩක් වුනේ නැහැ. දෙන්නම ටිකක් එහාට මෙහාට ගිහින් ගේ වටේ බැලුවා. එතකොටයි දැක්කේ ජනේලත් වහලා තියෙනවා.

"කොහේහරි ගිහිල්ලා තියෙනවා..." මල්කි කිව්වා.

"අපි අර එහා ගෙදරින් අහල බලමුද...?" මාලිගා ඇහුවා.

"බලමු..." දෙන්නම එහා ගෙදරට ගියා. ඒත් දැනගන්න ලැබුනේ උදේ නම් හිටපු බව විතරයි.



WWW.EXPRESSLANKA.TK 16

"මේ ගොල්ලො කොහේ ගිහිල්ලද...?" මාලිගාට එහෙම හිතුණා.
"දැන් මොකද කරන්නේ...?" මල්කි ඇහුවා.
"මොනව කරන්නද... හෙට උදේටත් යන ගමන් ඇවිත් බලනවා" මාලිගා එහෙම කිව්වේ බලාපොරොත්තු බිඳ වැටුණු හිතින් වගේ.
"එතකොටත් හිටියෙ නැත්තං?" මල්කි තවත් ප්‍රශ්නයක් දැම්මා.
"එහෙනම් ඒක මගේ කරුමේ." මාලිගා එහෙම කියන ගමන් කාරෙකේ දොර ඇරියා. මල්කිට හිනාගියා.
"බයවෙන්න එපා... ඔන්න හෙට උදේට උඹට ෂුවර් එකටම උඹේ හිත ගත්තු කවිමෑන්ව හම්බ වෙනවා..."
මල්කි එහෙම කිව්වම මාලිගාගෙ මුහුණට යන්තම් හිනාවක් ආවා. ඒත් එක්කම කාරෙක පනගැන්වුනා.

රෑ 12 ත් පහුවුනා. ඒත් නින්ද මාලිගාගේ අහලකටවත් ආවේ නැහැ. සිංදු ලියාගන්න අය කොළඹ ඕනතරම් ඉන්දද්දී කවදාවත් දැකල නැති කවි හිතක් හොයාගෙන මේ තරම් දුරක් ආවේ ඇයි කියල මාලිගාට හිතාගන්න බැරිවුනා. "ඇත්තටම මං සසල වුනේ එයාගේ කවියටද නැත්නම් ඒ කවි හිතටද...?" නින්ද නැති මාලිගාගේ හිතට එහෙම හිතුනා. ඒත්... කිසිම දෙයක් තෙරුම් කරල පැහැදිළිව හිතාගන්න මාලිගාට පුළුවන් වුනේ නෑ. සිනිදු බණ්ඩාරව හමුවෙනවනම් තව අවස්ථාවක් විතරක් ඉතුරු වෙලා තිබුණා.
උදේ 7.30 වෙනකොට බී. එම්. ඩබ්ලිව්. එක සිනිදුලගේ ගේ ඉදිරිපිට නැවතුණා. ඉස්සරහ දොර ඇරල තිබුණා. මාලිගාගේ මූණට හිනාවක් ආවා.
"ටක්... ටක්... ටක්..."
මාලිගා ලෑලි බිත්තියට තට්ටු කරන සද්දේ කුස්සියේ හිටපු ආත්තම්මට ඇහුනා.
"ක. වි. ද. ?" ආත්තම්මා ඉස්සරහට ආවා.
"මේ සිනිදු බණ්ඩාරගෙ ගේද...?" මාලිගා ආත්තම්මව දැකපු


WWW.EXPRESSLANKA.TK 17

ගමන් ඇහුවා.

"ඕ... ඔව් නෝනා ඇයි...?"

"මට ඒ මහත්තයව චුට්ටක් හම්බවෙන්නෝනි. ඉන්නවද...?"

"අනේ ... පුතා මේ දැන් ටිකකට ඉස්සෙල්ලානෙ ගියේ නෝනා..."

"කොහේද.?"

"ස්වීප් විකුණන්න... හන්දිය කෙළවර තියෙන කුඩුව අපේ සිතිඳු පුතාගෙනේ..."

"ආ..!" ආත්තම්මා කියපු දේ මාලිගාට අදහන්න බැරිවුනා වගේ. මාලිගාගේ ඇස් ලොකු වුණා. "මං මේ ඇවිත් තියෙන්නේ වැරදි තැනකටද...?" මාලිගාට එහෙම හිතුනා.

"අ... ආච්චියේ එ... එයා පත්තර වලට එහෙමත් ලියනව නේද...?" මාලිගා පුදුම වෙලා වගේ ඇහුවා.

"ඔ... ඔව් නෝනා... පුතා නිතරම පත්තරවලට ඒවා මේවා ලියල දනව..."

"එ... එයාට චූටි මල්ලි කෙනෙකුත් ඉන්නවද...?" සැකය දුරුකරගන්න මාලිගා තවත් ප්‍රශ්නයක් ඇහුවා.

"ඔව්... අපේ චන්ද්‍රත් හවසට කුඩුව ළගට යනවා අයියට උදව් වෙන්න..." සිතිඳු බණ්ඩාර කියන්නේ කව්ද කියල දැනගන්න මාලිගාට තවත් විස්තර ඕන වුනේ නැහැ. මීට දවස් දෙකකට කලින් දැකපු ඒ අපූරු මූණ මාලිගාගේ හිතේ ආයෙමත් ඇඳුනා.

"එහෙනං ඒ සිතිඳු බණ්ඩාර..." නොසන්සුන් මාලිගාගේ හිත මාලිගාගෙන්ම එහෙම ඇහුවා.

දගකාර ඇඟිලි තුඩු වලින් සූක්කානම සීරුවට එහාට මෙහාට කැරකුණා. රෝදවල වේගය ටිකෙන් ටික වැඩි වෙන කොට මාලිගාගේ හිතෙත් ඒ හා සමානම වේගයෙන් සිතුවම් ඇඳුනා. අහුලල තියාගෙන හිටපු කොලේ දෙන ගමන්,

"මිස්... ඔය කවියට හුගක් ආසද...?"

කිසිම දෙයක් හගවන්නෙ නැතුව සිතිඳු අහපු හැටි මාලිගාට

WWW.EXPRESSLANKA.TK 18

මැවිලා පෙනුනා. ඒ රූප සටහන් මාලිගාගේ මූණෙ සිනහ රැළි මවන බව කළුපාට වීදුරු වලින් පිට කාටවත් පෙනුනේ නැහැ.

කාරෙකේ වේගය අඩුවෙලා. සිනිදුගේ ලොතරැයි කුඩුව ළඟ නතරවෙනකොට මාලිගාගේ හදවත ගැහෙන රිද්මයේ වේගය වෙනදාට වැඩිය වැඩිවෙලා. දොර ඇරගෙන මාලිගා බහිනකොට සිනිදු ඒ පැත්ත බලාගෙන හිටියා. ඒ ඇස් හතර ආයෙමත් හමුවුණා. මාලිගාගේ කම්මුල් වල ගැහෙන සුපුරුදු මදහස මුහුණට ආවා. සිනිදු ලාච්චුව ඇරල අරන් තියාගෙන හිටපු පන්සීයේ කොළය අතට ගත්තා. මාලිගා කුඩුව ළඟට එනකොටම...

"ඇයි... මේ..?" සිනිදු මාලිගා දිහාවට දික්කරගෙන හිටපු පන්සීයේ කොලය දැකලා මාලිගා පුදුම වෙලා වගේ ඇහුවා.

"මේ එදා මිස්ගේ ටිකට් එකේ සල්ලි." සිනිදු හිනාවෙලා කිව්වා.

"ඔයා හිතුවද මං ඒක ගන්න ආවයි කියලා...?"

"එහෙනං...?"

"මං ආවෙ ඔයාගෙන් සල්ලි වලට මිල කරන්න බැරිදෙයක් ඉල්ල ගන්න..." මාලිගා සිනිදුගේ ඇස් දිහා එක එල්ලෙම බලාගෙන කියනකොට, සිනිදුට මුකුත්ම හිතාගන්න බැරිවුණා. අහන්න කිසිම වචනයක් සිනිදුගේ උගුරෙන් එළියට ආවෙ නෑ...

"ඔයා සිනිදු බණ්ඩාර නේද...?"

තත්පර ගාණක තිබුණු නිහඬතාවය බිඳගෙන මාලිගා කතා කෙරුවා. සිනිදුගේ මූන විශ්මයෙන් පිරුණා.

"ඔව්..."

"මේක... ලිව්වෙ ඔයානේ...?"

මාලිගා අතේ තියාගෙන ආව කොලේ දිගහැරලා සිනිදුට පෙන්නුවා. ඒ රෝස පාට කොලේ සිනිදුට කවදාවත් අමතක වෙන්නෑ" සිනිදුගේ මූණට එනකොටයි ආයෙමත් හිනාවක් ආවේ...

"ඔව්... ඇයි...?"

"මං ආවේ ඔයාගෙන් මේ කවිය ඉල්ලගන්න..."



WWW.EXPRESSLANKA.TK 19

"ඉල්ල ගන්න...?"

"ඔව්"

"මට තේරුන් නැහැ"

"මං කියන්නම්... මං මේ කවිය...

මාලිගා සිනිදුට කාරණාව කියනකොට සිනිදු පුදුම වෙලා මාලිගාගේ මූණ දිහා බලාගෙන හිටියා. හිතට එන දේවල් ඔහේ ලිව්වට ඒවට වෙන කවුරුවත් ආදරය කරන බව මාලිගාව හමුවෙනකම් සිනිදු දැනගෙන හිටියේ නැහැ. ඊටත් වඩා...

ඉතිං... මට අවසර දෙනවද...? මාලිගා බෙල්ල ඇල කරලා ඇස් පුංචි කරගෙන ඇහුවා. තමන්ගෙ අතින් ලියවුන නිර්මාණයක් ගීතයක් වෙලා ලස්සන හඬකින් ගැයෙනවට කව්ද අකමැති... ඒත්... ඒකට අවසර දෙන්න කලින් සිනිදුට මාලිගත් එක්ක බේරගන්න පුංචි ගණුදෙණුවක් තියෙනවා.

"අවසර දෙන්න පුළුවන්... හැබැයි ඊට ඉස්සෙල්ලා මේක ගන්න ඕන..."

සිනිදු ආයෙමත් අතේ තියාගෙන හිටපු පන්සීයේ කොලේ මාලිගාට දික් කෙරුවා.

"ඔයාට පිස්සුද... මං මේක ඔයාගේ මල්ලිට දෙන්න කියලා දුන්න පුංචි තෑග්ගක්නේ... දීපු දෙයක් ආපහු ගන්න පුළුවන්ද...?"

"ඒක මං එයාට කිව්වෙ නැහැ..."

"කිව්වෙ නෑ?.." හිනාවෙන් පිරිල තිබුණු මාලිගාගේ මූණ වෙනස්වුණා.

"ඔව්..."

"ඒ වුනාට මට ඕක ආයෙමත් ගන්න බැහැ..."

"ගන්නම බැරිද...?"

"බෑ... සතුටින් දුන්න දෙයක් ආපහු ගන්න බැහැ..."

"එහෙනං මගේ අවසරයත් දෙන්න බෑ..."

සිනිදු එහෙම කිව්වම මාලිගා ආයෙමත් පුදුම. වෙලා සිනිදු දිහා



WWW.EXPRESSLANKA.TK 20

බැලුවා. සිනිදුගේ ඒ වචනපෙළ මාලිගාගේ ඔළුවට අකුණක් වැදුනා වගේ දැනුණා. මාලිගා අසරණ වුණා.

"ඔයාගේ අන්තිම තීරණය ඕකද...?"

"ඔව්..."

"කමක් නැහැ. ඕක ඔයාට මල්ලිට දෙන්න බැරිනම් ඉරල විසිකරල දාන්න. මට ඕක ගන්න බැහැ... මං යන්නම්"

මාලිගා ආපහු යන්න හැරුණා. මාලිගා ඒ වචන ටික කියද්දි අහිංසක බවට සිනිදුගේ පපුව වෙව්ලලා වගේ ගියා.

"මිස්..!"

මාලිගා ආපහු හැරිලා බැලුවේ නැහැ... සිනිදු කුඩුව ඇතුලෙන් එළියට ඇවිත් කාරෙක ළඟට දුවගෙන වගේ ගියා. මාලිගා දොර වහගන්න හදන කොටම සිනිදු දොරට අත තිබ්බා. මාලිගා ඔළුව උස්සලා සිනිදුගේ මූණ දිහා බැලුවා.

"මට සමාවෙන්න... මං ඒ සල්ලි වලින් මල්ලිට මොනව හරි අරන් දෙන්නම්..."

සිනිදුගේ හඬ හුගක් හැඟීම්බර වුණා.

"ඔයා වරදක් කළේ නැහැ..." මාලිගා කිව්වේ අහක බලාගෙන...

"නැහැ... මං වැරදියි..."

"මං ඔයාගේ කවිය සල්ලි වලට මිල කෙරුවෙ නැහැ. මං එදා ඒ ටිකට් එකේ සල්ලි ඔයාගේ මල්ලිට දෙන්න කියනකොට ඔයා සිනිදු කියලා මං හීනෙකින්වත් දැනගෙන හිටියේ නැහැ..."

"මං දන්නවා... ඕක අමතක කරලා දාන්න... මිස් ඔය කවිය සිංදුවක් විදියට කියනව අහන්න මං හුගක් ආසයි... ඒක රෙකෝඩ් කළොත් පුළුවන්නම් මටත් කැසට් එකක් ගෙනත් දෙන්න..."

මාලිගා ස්ටියරිං වීල් එක දැතින් අල්ලගෙනම ආයෙමත් බෙල්ල හරවල ඔළුව උස්සලා සිනිදුගේ මූණ දිහා බැලුවා. සිනිදුගේ දිළිසෙන ඇස්වල තිබුනෙ අහිංසක බව... මාලිගාගේ මූණෙන් කියාගන්න බැරි හුගක් දේවල් ලියවිලා...



WWW.EXPRESSLANKA.TK 21

"එහෙනම් මිස් යන්න..."
සිනිදු හිමීට එහෙම කියල කාරෙකේ දොර හිමීට වැහුවා...

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

චන්දු ආවේ නැති නිසා තරමක් පාළු ගතියක් දැනුණා. සිනිදුගේ හිතට උදේ මාලිගාගේ හිත රිදවපු එක ගැන තිබුණා පසුතැවිල්ලක්. ඒත් ඒ වගේම එයා තමුන්ගේ රචනයක් ගීතයක් හැටියට ගයන්න තෝරගත්තු එක ගැන හිතේ තිබුනේ සතුටක් වගේම විශ්මයක්. සිනිදුට මාලිගා ගැන හුගක් දේවල් හිතුණා. කොළඹ ඕන තරම් සිංදු ලියාගන්න මිනිස්සු ඉන්දද්දි පත්තරේක තිබුන රචනයක් හොයගෙන මේ තරම් දුරක් එන්න තරම් ඒ රචනයේ තිබුණා සුවිශේෂීත්වය මොකක්ද...? අපේ මේ හමුවීමට හේතුව ඒ රචනයේ තිබුණු ආකර්ෂණය විතරමද...?

"හනේ... හනේ... ෂෝක්..."

කම්මුලට අත තියාගෙන පැත්තක් බලාගෙන හිටපු සිනිදුගේ කල්පනා ලෝකය බිඳිලා ගියේ ඒ කටහඬින්...

"ලොතරැයි ටික කවුරුහරි ගලවගෙන ගියත් දන්නැහැ නේද...? ඒ තරමට ළමයගෙ කල්පනාව..."

මුතු හිනාවෙන් පිරුණු මූණෙන් එහෙම කිව්වා. සිනිදු හිනාවුණා විතරයි... මුකුත් කිව්වේ නැ...

"මොනවද ඔච්චර කල්පනා කරන්නේ...? අද ටිකට් විකිණුන් නැද්ද...?"

"නැහැ... එහෙම ප්‍රශ්නයක් නැහැ..."

"එහෙනම් කොහොම ප්‍රශ්නයක්ද ළමයට තියෙන්නේ...?"

මුතු සිනිදුගේ ඇස්දෙක දිහා බලාගෙන ඇහුවා.

ප්‍රශ්නයක් නැති එක..."

සිනිදු එහෙම කිව්වෙත් මුතුගේ ඇස් දෙක බලාගෙන... මුතුට



WWW.EXPRESSLANKA.TK 22

හිනාගියා...

"ඒකද ප්‍රශ්නෙ..? එහෙනම් ඉතිං 'දාගන්නකෝ ප්‍රශ්නයක්...'"

"අමුතුවෙන් දාගන්න දෙයක් නැහැනේ... මේ දාගෙන තියෙන ප්‍රශ්නෙ ප්‍රශ්නයක් වේවි ඉස්සරහට..."

සිනිදු එහෙම කිව්වේ ඒ තරම් හිතලම නෙමෙයි... හිතට ආව හින්දා. ඒත් මුතුගේ මූණ ඒ වචනපෙළ හින්දා ටිකක් වෙනස් වුණා. එතකොටම මිනිස්සු දෙන්නෙක් ටිකට් ගන්න කුඩුව ළගට ආව නිසා මුතු පොත් ටික තව ටිකක් පපුවට තුරුල් කරගෙන ලැජ්ජාවෙන් වගේ බිම බලාගත්තා...

"ඒක නෙමෙයි... මොකක්ද ඊයේ චන්දුට කියල තිබුනේ බඩුවක් කියන්න තියෙනවා කියලා"

මිනිස්සු දෙන්නා කුඩුව ළගින් ගියාට පස්සෙ සිනිදු ඇහුවා.

"ඒක කියන්ට ඕන නිසාම තමයි ආවේ... මුතු බිම බලාගෙන හිමීට වගේ කිව්වා...

"ඉතිං ඇඹරෙන්නැතුව කියන්ට..."

"කියන්ට අයියා මං ඒ බඩුව කිව්වට පස්සේ කේන්ති ගන්නැහැ කියලා..."

මුතු ඒ වචන පෙළ කිව්වේ ඔළුව උස්සලා සිනිදුගේ මූණ දිහා බලාගෙන...

"ඇයි ඒක මට තරහ යන එකක්ද...? කමක් නැහැ. කියන්නකෝ..."

"මට අයියගෙන් පුංචි ගමනක් යන්න අවසර ඉල්ල ගන්ට ඕනී..."

"අවසර ඉල්ල ගන්න.?"

"ඔව්..."

සිනිදුට මුකුත්ම හිතාගන්න බැරිවුනා. උදේ එක්කෙනෙකුට අවසර දීපු හැටි සිනිදුට ආයෙමත් මැවිලා පෙනුණා.

කොහේ යන්නද...?"

අපේ නැටුම් කණ්ඩායමට කොළඹ ෂෝ එකකට යන්න වෙලා... ඉතිං මටත් ඒකට යන්න වෙනවා..."



WWW.EXPRESSLANKA.TK 23

# 03

"දවස් සති වෙලා සති හතර මාසයක් වෙන්න කාලය ගිය වේගය මාලිගාටවත් මුතුටවත් දැනුනේ නෑ. ඒ දෙන්නගේම මහන්සිය කැපවෙලා තිබුණෙ එකම තැනකට... ඒත් සිනිදුට එහෙම නෙවෙයි... සිනිදු හිටියේ ඒ සොඳුරු දවස එනකම් ඇඟිලි ගැන ගැන. සිනිදු ප්‍රසංගය බලන්න යන්න තීරණය කෙරුවේ මුතු එන්න කියලා බල කරපු නිසා නෙමෙයි... ඊට වැඩිය හිත සසල කරපු දෙයක් සිනිදුට දැනුණා.

කෝච්චියට නැගලා කවුළුවක් අයිනේ සීට් එකක වාඩිවුනාට පස්සෙ සිනිදුගේ හිතේ සිතුවම් ඇඳෙන්න ගත්තා. සිනිදුට මාලිගාව මැවිලා පෙනුණා. ඒ අපූරු පිළිරුව... සිනිදුට තාම හැමදෙයක්ම අදහන්න බැරි හීනයක් වගේ... ඒත්... මේ යන ගමනේදී ඒ හීනය හැබෑවක් කරලා මාලිගා ඒ නිර්මාණය ගීතයක් කරාවිද...? හිත ඇතුලේ දෙගිඩියාව පෙරළි කරනකොට කෝච්චිය කොළයට ඇවිත් තිබුණා.

*ස්වර රිද්ම...*



WWW.EXPRESSLANKA.TK 24

"තාරුණ්‍යයේ කල එළි මංගල්‍යය..."

සිතිදු එල්ෆින්ස්ටන් හෝල් එක ළඟින් බස් එකෙන් බහිනකොටම උඩ එල්ලල තිබුණු බැනර් එක දැක්කා. හෝල් එක මිදුලේ වැඩිපුරම හිටියේ සුපිරි විදිහට ඇඳගත්තු කොල්ලො කෙල්ලො... සිතිදු පෝලිමේ ඉඳලා ටිකට් එකක් ගන්නකොට ඇතුලෙ ඉතුරුවෙලා තිබුණේ සීට් හතරක් විතරයි.

සිතිදු ශාලාවේ මැද කෙළවරක ඉතුරුවෙලා තිබුණු පුටුවේ වාඩිවෙන ගමන් පේළියේ ඉන්න අනිත් අය කව්ද කියල බැලුවා. ඒ පේළියෙම පිරිල හිටියෙ බටහිර පන්නයට ඇඳගත්තු කෙල්ලො කට්ටියක් ගෙන්. සිතිදුව දැක්ක ගමන් සිතිදුට මෙහා පැත්තෙ සීට් දෙකෙ වාඩිවෙලා හිටපු කෙල්ලො දෙන්නා මූණට මූණ බලාගෙන හිනාවුණා. එතකොටම ශාලාවේ ලයිට් නිවුණා. වැහිලා තිබුණ තිරේ ටිකෙන් ටික ඇරුණා. ශාලාවම අත්පුඩි හඬින් ගිගුම් දෙද්දී...

"සුභ සන්ධ්‍යාවක් සහෘද රසික රසිකාවියනි..."

පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව තාරුණ්‍යයේ නිවේදකයා ප්‍රසංගය ආරම්භ කෙරුවා. සත්සර සංගීත ආශ්‍රමයේ යොවුන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙ නව නිර්මාණ එකින් එක දොරට වඩිද්දි මුතුලගේ නැටුම් කණ්ඩායම ගැයුම්, වැයුම් වල රිද්මයට පාද තියල නර්තනයේ යෙදුනා. සිතිදුගේ ඇස් මුතුගේ ලාලිත්‍යමය නර්තනය දිහාවට යොමුවෙලා තිබුණාට.,

"කෝ... තාම එයා...?"

සිතිදුගේ හිත සිතිදුගෙන්ම ඇහුවා. ඒ ප්‍රශ්නයට පිළිතුර ලැබෙන්න තව වැඩි වෙලාවක් ගියේ නෑ.

"ප්‍රිය මිතුරු මිතුරියනි... මගේ මීලඟ ඇරයුම සත්සර සංගීත ආශ්‍රමයෙන් බිහිවුන තවත් ප්‍රතිභා පූර්ණ යොවුන් සංගීත තාරුකාවියකටයි... ඇය විසින් ගායනා කරනු ලබන මෙම ගීතයේ තනුව හා සංගීතයද ඇය විසින්ම නිර්මාණය කර ඇත... මෙහි පද



WWW.EXPRESSLANKA.TK 25

රචනය යොවුන් ලේඛකයෙකු වන සිනිදු බණ්ඩාරගෙනි..."

නිවේදකයාගේ ඒ වදන් පෙළ සිනිදුගේ පපුව විදගෙන ගියා. හදවත ගැහෙන වේගේ වැඩිවුණා...

"දෙවියනේ... මේ හීනයක් නෙමෙයි නේද...?"

සිනිදුට එහෙම හිතුණා. එතකොටම නිවේදකයා ගීයේ පෙරවදන කියන්න පටන් ගත්තා... ඊළඟට...

"ඔව්... එවන් අරුත් පදබැඳි මේ ගීය සත්සර හා මුසුකොට ගයන්නට මගේ ඇරයුම... මෙන්න එහෙනම් පිළිගන්න... මාලිගා..! මාලිගා විජේසූරිය..."

ඒ හැඳින්වීමත් එක්කම අත්පුඩි හඬ ශාලාව පුරා විහිදිලා ගියා. සංගීත කණ්ඩායම ගීතයේ ආරම්භක සංගීත ඛණ්ඩය වාදනය කරන්න පටන් ගත්තා. මාලිගා මයික්‍රොෆෝනය අතට අරගෙන දේවදූතිකාවක් වගේ ඉස්සරහට ආවා...

සිහිනේ වෙලී...
එනු මැනවී... මේ... රත්‍රියේ...
හමුවෙමු අපි ඒ සිහිනෙන්
රාත්‍රියේ...

ශාලාව පුරා ඒ නැවුම් හඬ ගලාගෙන යනකොට හැමෝම ගල්ගැහිලා වගේ බලන් උන්නා. ඒ අපූර්ව හඬ පිටවෙන මුවමඬල... සිනිදු හිටියේ ඇසිපිය ගහන්න අමතක වෙලා වගේ මාලිගා දිහා බලාගෙන... ගීතයේ අතරමැද සංගීත ඛණ්ඩය වාදනය වෙනකොට මාලිගා යන්තමට ඔළුව උස්සල සෙනඟ දිහා ඇස් යටින් බැලුවා... ශාලාව මීයට පිම්බ වගේ... දෙනෝදාහක් ඇස් අතර මැද දිළිසෙන ඒ ආත්මීය ඇස් දෙක මාලිගාගේ ඇස්වලට අහුවුනේ එතකොටයි...

සිනිදු!..


WWW.EXPRESSLANKA.TK 26

හදවත තත්පරයකට නැවතුණා... අදහගන්න බැරුව මාලිගාගේ ඇස් පිහාටු වේගයෙන් ගැහෙනවා. මුළු ඇඟම හිරිවැටීගෙන ගියා වගේ... ඒත් සිංදුව තව කියන්න තියෙනවා. මාලිගා ඇස් බිමට කරගෙන මයික්‍රෆෝනය මුව ළඟට ලංකර ගත්තා.

දෙගුරුන් මා... වටකරන්...
පව්රු බැඳන් පිරිවරා...
ඔබ සොයා මා එනු කෙසේ...
පියවි ලොවේ සිතුලෙසේ...

ගීතය කියල ඉවරවෙනකොටම ආයෙමත් අත්පුඩි හඬ රැළි බිඳගෙන ගලාගෙන ආවා. මාලිගා හැමෝටම ආචාර කරලා ඔළුව උස්සන ගමන් බැලුවෙ දෙනෝ දාහක් දෙනා අතර 'තනිවෙලා ඉන්න සිතිදු දිහා... ඒ අත් දෙකත් ඔල්වරසන් හඬට එකතුවෙලා... ඒ ඇස් දෙකේ දීප්තිය ශාලාවේ මද එළිය අතරින් මාලිගා දැක්කා.

ප්‍රසංගය ඉවරවෙනකොට 5.40 විතර වුණා. ඒත් එක්කම සුභ පතන්න ආව අයට මාලිගාව මැදිවුනා. සමහරු අතට අත දුන්නා. තව සමහරු අත් දෙකෙන්ම අල්ලගෙන සිංදුව කියපු ලස්සන ගැන වර්ණනා කෙරුවා. මාලිගා හිනාවුණා... තරු පොකුරක් වගේ හිනාවෙනකොට කම්මුල් දෙපැත්ත වල ගැහුණා.

ඒත්...! එකපාරට මාලිගාගේ ඔළුවේ විදුලියක් කෙටුවා...

සිතිදු!..

කව්රු සුභ පතන්න ආවත් සිතිදු ඇවිත් නැහැ... හිත ගැස්සිලා ගියා...

මාලිගා සෙනඟ අතරින් මිදිලා මල්කිවත් ඇදගෙන හෝල් එකේ ඉස්සරහ දොරටුව ළඟට ආවා. ශාලාවෙන් හැමෝම පිටවෙලා යනවා... මාලිගා තවත් වටපිට බැලුවා. ඒත්... එළියේ ඉන්න සෙනඟ අතරත් සිතිදු හිටියේ නෑ. හිත පිච්චුනා... ඒ මිනිස්සු ඔන කමින් මාලිගා


WWW.EXPRESSLANKA.TK 27

දිහා බලනවා මාලිගා දැක්කෙ නෑ... මාලිගා පාර ළඟටම දුවගෙන ඇවිත් ආයෙමත් හතර වටේම බැලුවා සිතිදු ඉන්නවද කියලා... ඒත් ඒ කොතැනකවත් සිතිදු බණ්ඩාර නෑ...!

"කෝ දෙයියනේ... එහෙනම් සිතිදු...!"

පිච්චිලා ගියපු මාලිගාගේ හිත කඩා වැටෙන්න වගේ ආවා...

"උඹ සිතිදුයි කියල වෙන කොල්ලෙක් දැක්කද දන්නැහැ මාලි..."

පිටිපස්සෙන් ආව මල්කි කිව්වා.

"නෑ මල්කි, ඒ එයාම තමයි!.."

"එහෙනම් මොකද එයා උඹට විෂ් කරන්නවත් ආවෙ නැත්තේ...?"

මල්කිගෙ ඒ වචන පෙළට දෙන්න තරම් උත්තරයක් මාලිගාගේ හිතේ තිබුනේ නෑ. කිසිම දෙයක් හිතාගන්න බැරිවුනා. ඒත්... තව එක තැනක් තියෙනව සිතිදුව බලන්න... මාලිගාට එකපාරටම මතක් වුණා... තත්පරයක්වත් ප්‍රමාද වෙන්න වෙලාවක් නෑ...

"මල්කි ඔයා ඇතුළට යන්න මං ටක් ගාලා එන්නම්..."

එහෙම කියන ගමන්ම මාලිගා පාර පනින්න හයියෙන් ඉස්සරහට ඇදුනා.

කොහෙද යන්නේ...?"

මුකුත් හිතාගන්න බැරුව මල්කි ඇහුවා. ඒත් උත්තරයක් හම්බවුනේ නෑ... මාලිගා පාරෙන් පැනල දුවගෙන ගිහින් කාරෙකට නැග්ගා. මල්කි හෝල් එක ඉස්සරහ බලන් හිටියේ පුදුමයෙන් ගල් ගැහිල වගේ. කාරෙක කොළඹ පැත්තට වේගෙන් ඇදිල ගියා...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

කාරෙක යන්නේ කොයිතරම් වේගයකින්ද කියල මාලිගා බැලුවෙ නෑ. මාලිගා දැක්කෙ ඉස්සරහින් යන වාහන එකින් එක පහුවෙනවාවිතරයි... මීට ටිකකට ඉස්සෙල්ලා තරු පොකුරක් වගේ

WWW.EXPRESSLANKA.TK 28

හිනාවෙන් පිරිල තිබුණ ලස්සන මූණ... දැන් රතුවෙලා... හිත රිදිලා... සන්තුන්කම හිතේ අහලකවත් තිබ්බෙ නෑ... කාරක වේගයෙන් ආවෙ කොටුව ස්ටේෂන් එකට. බැහපු ගමන් මාලිගා ඇතුළට කඩාගෙන දිව්වා. බැලුව කෝච්චිය තියෙන වෙලාව...

කොළඹ නුවර ප.ව. 6.30

මාලිගා අත් ඔරලෝසුව දිහා බැලුවා. වෙලාව 6.25 යි. පපුව හයියෙන් ගැහුනා. මාලිගා ප්ලැට් ෆෝම් එකට දිව්වා විදිල්ලෙන්... එතකොට කෝච්චිය ඇවිත් නවත්තල සෙනඟ පොරකකා නගිනවා... මාලිගා ප්ලැට් ෆෝම් එක දිගේම ගිහින් කෝච්චි පෙට්ටියක් පෙට්ටියක් ගානෙම බැලුවා... ඒත්... ඒ එකකවත් සිතිදු පේන්න නැහැ...

"කොහෙද දෙයියනේ එහෙනම් සිතිදු ගියේ..?!"

කෝච්චිය දිහා බලාගෙන හිටපු මාලිගාට එකපාරටම හීල්ලුණා... මෙච්චර වේලාවක් හිතේ තෙරපගෙන තිබුනු පීඩනය... හිතේ තිබුණු දුක, කඳුළු වලට හැරෙන්න තව තත්පරයක්වත් ගියේ නැහැ... මාලිගා කෝච්චිය දිහා බලාගෙනම ඇස්වලට ආව කඳුළු ලේන්සුවෙන් පිහිදුවා...

ප්ලැට් ෆෝම් එක දිගේ හයියෙන් එහාට මෙහාට යන කව්රුවත් ඒ දර්ශනය හරියටම දැක්කෙ නැහැ... ඒත් එතකොටම...

"මිස්..."

එකපාරටම පිටිපස්සෙන් හීනෙන්වගේ ඇහුන ඒ හඬින් මාලිගා හැරිල බැලුවා...

"සිතිදු...!"

අදහන්න බැරුව ඒ ඇස් ලොකුවුනා... රතුවෙලා තිබුණ මූණට ආයෙමත් තරු පොකුරු හිනාව එනකොට...

"ඔයා කොහෙද හිටියේ.!.?"

ඇස් දෙක විශ්මයෙන් පිරිලා පිහාටු ගැහෙද්දීම මාලිගා ඇහුවා. සිතිදුට පුදුම හිතුනා...

"මං දැන් ආවේ. මිස් කාවද හොයන්නේ...?"

"වෙන කාවවත් නෙවෙයි,.. මං ඔයාව හෙව්වේ..."



WWW.EXPRESSLANKA.TK 29

"මාව?..!"

"ඔව්..!"

"ඇයි මාව හෙව්වේ...?"

සිනිදු පුදුම වෙලා වගේ ඇහුවා...

"ඇයි සිනිදු ඔයා මට කතා කරන් නැතුව ආවේ...?"

"නිකං..!"

සිනිදුට එකපාරටම කියවුණා...

"නිකං නෙමෙයි..., ඔයා මට නොකියා ආවේ මං ඔයාට ෂෝ එකට ඉන්වයිට් කරපු නැති හින්දා නේද...? ආ...?"

"මිස්ට පිස්සුද...?"

මාලිගා කියපු දේ සිනිදුගේ පපුව විදගෙන ගියා...

"එහෙනං කියන්න.,. මං ඔයාගේ කවිය ලස්සනට කිව්වේ නැද්ද?.,"

මාලිගා සිනිදුගේ ඇස් දෙකට එබිලා ඇහුවේ ඉවසුම් නැතුව...

"මිස් ඒ සිංදුව කියපු ලස්සන ගැන කියන්න මගේ ළඟ වචන නෑ... ඇත්තමයි". සිනිදු මාලිගාගේ ඇස් දිහා බලාගෙනම කිව්වා...

"එහෙනං ඇයි මට කතා නොකර ආවේ...?"

"ඒ වගේ තැනකට මිස් එක්ක කතා කරන්න එන්න මං කව්ද...?"

"පිස්සා..., එහෙම හිතලද ආවේ නැත්තේ...? යං මං ඔයාව අපේ අප්පච්චිටයි මියුසික් ක්ලාස් එකේ කට්ටියටයි මීට් කරන්න..."

"අපෝ බෑ... මං මේකේ යන්න ඕනි..."

"ඉතිං මං අප්පච්චිත් එක්ක ඇවිත් ඔයාව කාරෙකෙන් නුවරට දාන්නං..."

"බෑ මිස් මං මේකේ යන්නම ඕනි... පරක්කු වුනොත් අත්තම්මයි මල්ලියි බයවෙනවා..."

"එහෙමද... කමක් නැහැ... ඔයා ආවට ගොඩක් සතුටුයි සිනිදු..."

මාලිගා දිග හුස්මක් අරගෙන පිට කරන ගමන් කිව්වා. සිනිදු එතකොටම කෝච්චිය දිහා බැලුවා... සෙනහ ඔක්කොම කෝච්චියට

නැගල...

"සිනිදු"

සිනිදු ආයෙමත් මාලිගාගේ මූණ දිහා බැලුවා...

"ඔයා මාත් එක්ක තරහද...?" මාලිගා පුංචි එකියක් වගේ ඇහුවෙ...

"මොකටද...?"

"මං ඔයාට ඉන්වයිට් නොකලට..?"

"චුට්ටක්වත් නෑ..." සිනිදු ඔළුව හොලවලා දයාබර විදිහට කිව්වා. වේගයෙන් ඇස් පිහාටු ගැහෙනකොට මාලිගාගේ මූනේ අයෙමත් ලස්සන හිනාව පිපුණා. එතකොටම කෝච්චියේ නලාව නාදවුණා.

"සිනිදු ට්‍රේන් එක යන්න හදන්නේ..! එහෙනං ඉක්මනට ගිහින් නගින්න.!"

මාලිගා එහෙම කියනකොටම සිනිදු කෝච්චිය දිහා බලලා අයෙමත් මාලිගාගේ මූණ දිහා බැලුවා...

"මිස් මාත් එක්ක තරහද...?"

"අනේ නෑ.! ඉක්මණට නගින්න.!"

"එහෙනං ඔන්න මං ගියා.!"

කෝච්චිය අද්දනකොටම සිනිදු දුවගෙන ගිහින් එල්ලිලා අයෙමත් මාලිගා දිහා බැලුවා... මාලිගා අතවැනුවා... සිනිදු මාලිගාව පේන්නැති වෙනකම්ම අත වැනුවා. මාලිගා අත වැනුවේ තරු පොකුරක් වගේ ලස්සනට හිනාවෙන ගමන්...



WWW.EXPRESSLANKA.TK 31

# 04

තරු පොකුරු හිනාවේ මතකය විතරක් සිතිදුගේ හිතේ ඉතුරු කරලා දවස් ගෙවිල ගියා. නිහඬව ගෙවුන සති දෙකේදී සිතිදු උවමනාවෙන් මාලිගා ගැන හිතුවේ නෑ. මාලිගා කියන්නේ දෑකල ඉවරවුන ලස්සන හීනයක් වගේ මතක සමරුවක් විතරක් බව සිතිදුගේ හිත කිව්වා. ඒත් සිතිදුව හමුවීම දැකලා ඉවරවුන සුන්දර හීනයක් විතරක් කරගෙන හිත හදාගන්න මාලිගාට පුළුවන් වුනේ නෑ. අලුයට ගිනිවගේ මාලිගාගේ හිතේ සිතිදුගේ රූප ඡායාව හොල්මන් කෙරුවා...

කාරෙක ඇවිත් සිතිදුලගේ ගේ ඉස්සරහ ගුරුපාරේ නවත්වනකොට මිදුලේ සයිකලේට ටියුබ් එකක් දදා හිටපු සිතිදුයි, අයියගේ උදව්වට රෝදේ අල්ලගෙන හිටපු මල්ලියි දෙන්නම ඔලුව උස්සලා බැලුවා.

මාලිගා...!

කාරෙකේ දොර ඇරන් බහින මාලිගාව දැකපු ගමන් සිතිදුගේ හිතින් එහෙම කියවෙනකොටම මූණට හිනාවක් ආවා. වන්දු බලන් හිටියේ ඇස් ලොකු කරගෙන.

"අද නිවාඩු දවසෙත් අයියයි මල්ලියි වැඩද...?"



WWW.EXPRESSLANKA.TK 32

මාලිගා වත්තට ඇතුල් වෙන ගමන් දුර තියාම ඇහුවා.

"වැඩ කරන ජනතාව එහෙම තමයි මැඩම්..."

සිනිඳු හිනාවෙලා කියන ගමන් ඉස්සරහට ගියා... චන්දුත් සයිකලේ අත්ඇරලා අයියගේ පස්සෙන් ආවා.

"ඉතිං කොහොමද...?"

මාලිගා ඇස් පුංචි කරගෙන සිනිඳුගෙන් අහන ගමන් චන්දුගේ නිකටෙනුත් ඇල්ලුවා... පොඩි එකා අහිංසක විදිහට හිනාවෙනවා.

"වරදක් නෑ... සතුටින් සමාදානෙන් ඉන්නවා..."

"එහෙනං ෂෝක්.!."

"මිස් දවල්ද අවේ...?" අහන්න විශේෂ දෙයක් හිතට ආවෙ නැති නිසා සිනිඳු එහෙම ඇහුවා...

"නෑ මං තාම මල්කිලගෙ ගෙදර ගියේ නෑ... ඉස්සෙල්ලම ඔයාව බලන්න ආවේ..."

මාලිගා එහෙම කියන ගමන් හැන්ඩ් බෑග් එක ඇරියා. සිනිඳුට මුකුත් හිතාගන්න බැරිවුනා...

"ආ..." මාලිගා බෑග් එකෙන් ගත්තු කැසට් පටිය සිනිඳුට දික්කෙරුවා...

"ෂෝ එක රෙකෝඩ් කළාද...?"

සිනිඳු ඇහුවේ ඇස් ලොකුකරගෙන...

"ඔව්..."

"ගොඩක් ස්තූතියි..."

මාලිගා හිනාවෙන ගමන් චන්දු දිහා බැලුවා. පොඩි එකා අයියගේ අතේ එල්ලිලා ඇඹරෙනවා.

"ආ... අයියට විතරක් බඩ්ඩක් දීල හරියන්නැනේ... මල්ලියටත් දෙන්නෝතිනේ" මාලිගා බෑග් එකෙන් ගත්තු චොක්ලට් එක චන්දුගේ අතින් අල්ලගෙන ඇඟිලි වලට තියල හිරකෙරුවා...

"මේක ඔයාට..."

"අනේ මෙයාට මොකටද ඔච්චර ලොකු එකක් ගෙනාවේ..?"



WWW.EXPRESSLANKA.TK 33

"ඇයි ඔයාට ඉරිසියයිද...? මල්ලියේ,.. අයියට කැල්ලක් දෙන්න හොඳේ... නැත්තං ඔයාට බඩේ අමාරුව හැදෙයි..."

මාලිගා එහෙම කිව්වම ආයෙමත් අයියටයි මල්ලිටයි දෙන්නටම හයියෙන් හිනාගියා...

"අනේ ඔයා මට ඕන දෙයක් දෙනවා... නේද මල්ලි..?"

චන්ද්‍ර ඔව් කියන්න වගේ ඔළුව වැනුවා...

"ඒක නෙමෙයි. මට මතකත් නැතිවුනා. මැඩම් අපේ පුංචි මැදුරට වඩින්නැද්ද...?"

"කෝ... ඔයා ඉස්සෙල්ලා කතා කෙරුවයැ... යං..."

මාලිගා ගෙට ඇතුල්වුන ගමන් හතරවටේටම ඇස් කැරකෙව්වා. පුංචි වුනාට දුප්පත් වුනාට මේ ගේ ඇතුලේ අමුතු සිරියාවක් තියෙනව කියල මාලිගාට හිතුනා. එතකොටම...

"වාඩිවෙන්න මිස්" සිනිදු කිව්වා

"කෝ ගෙදර අය...?"

මාලිගා ලෑලි පුටුවේ වාඩිවෙන ගමන් ඇහුවා...

"අත්තම්මා නැන්දලාගේ ගෙදර ගියා... තව ටිකකින් එයි..."

සිනිදු දීපු උත්තරෙන් මාලිගාගේ හිතට ප්‍රශ්නයක් ආවා. ඒත් මාලිගා ඒ ප්‍රශ්නය සිනිදුගෙන් ඇහුවේ නෑ... එතකොටම සිනිදු මල්ලිව එක්කගෙන ඇතුලට ගිහින් මොනවද කුටු කුටු ගෑවා. චන්ද්‍ර හිස් බෝතලයක් අරගෙන පිටිපස්ස පැත්තෙන් පාරට දිව්වා.

"කොහෙද මල්ලිව ඇරියේ...?" මාලිගා ඇහුවේ සිනිදු ආයෙමත් ඉස්සරහට එනකොටම.

"පොඩි වැඩකට..."

"බීම ගේන්න නේද ?"

මාලිගා ඒක අහපු විදිහට සිනිදුට හිනාගියා.

"පිස්සා! මොකටද බීම ගේන්න ඇරියේ ?"

"එහෙම තමයි ආගන්තුකයො ආවම. ඇයි අපෙන් බීම එකක් බොන්න අකමැතිද?"

WWW.EXPRESSLANKA.TK 34

"එහෙමද හිතුවේ? එහෙනම් බීම බෝතලේම බොනවා.! අයියටයි මල්ලිටයි වුට්ටක්වත් ඉතුරු කරන්නැහැ."

මාලිගා ඇස් පුංචි කරගෙන දඟකාර විදිහට කිව්වා.

සිනිඳු හිනාවෙන ගමන්...,

"කමක් නැ... ආයේ එන්නැහැනේ..."

සිනිඳුට එකපාරටම කියවුනා... මාලිගාගේ මූණ වෙනස්වුනේ එතකොටම...

"ඇයි... මං ආයෙ එන්න ඕන නැද්ද...?"

"සිංදුවක් ඉල්ලගන්න ඕනිවුනොත් එන්නං..."

සිනිඳු කිසි ගානක් නැති විදිහට කිව්වා. මාලිගාගේ හිත ඇතුල රිදිගෙනගියා.

"සිංදුවක් ඉල්ලගන්න ඕනි වුනොත් විතරද එන්න පුළුවන්... ආ...?"

අහිංසක විදිහට පිටවුන ඒ වචන පෙළ සිනිඳුගේ පපුව ඇතුලටම ගියා. කුමාරිකාවක් වගේ කෙල්ලෙක් දුප්පත් ගෙදරකට ඇවිත් කොල්ලෙකුට මේ විදිහට සමීප වෙනවා සිනිඳු මීට ඉස්සෙල්ලා අහල තිබුනෙ සුරංගනා කතාවල විතරයි. ඒත් දැන් මේ ඇස් ඉදිරිපිට ජීවමානව ඉන්නෙත් ඒ කතාවල හිටිය වගේම සුරවමියක්ද...?

"කෝ උත්තරේ ?"

මාලිගා ඇහුවේ ඉවසුම් නැතුව වගේ...

"කියන්නං... ඔබතුමියට කැමති ඕනම වෙලාවක... මේ අපේ ලැලි මන්දිරේට ඇවිල්ල... අපිව බලල යන්න අවසර තියෙනවා. හරිද..."

සිනිඳු මාලිගාගේ ළඟටම ඇවිත් ඒ වචන පෙළ කියවනවාත් එක්කම මාලිගාගේ හිත ආයෙමත් සතුටින් පිරුණා. ආයෙමත් ඒ මූණෙ ලස්සන හිනාව පිපෙනකොට සිනිඳු ජනේලේ ළඟට ගිහින් බැලුවෙ මල්ලි එනවද කියල...

"සිනිඳු"

සිනිඳු ආයෙමත් හැරිල මාලිගාගේ මූණ දිහා බැලුවා...



WWW.EXPRESSLANKA.TK 35

"මට ඔයාගෙන් වැදගත් දෙයක් අහන්න තියෙනවා..."

"වැදගත් දෙයක්...!?"

"ඔව්... ඔයා කැමති නැද්ද ඔය විකට් විකුණන ජොබ් එක අත් ඇරලා ඔයාට ගැලපෙන හොඳ ජොබ් එකක් කරන්න..? ආ...?"

මාලිගා ඇහුවෙ සිනිඳුගේ ඇස් දෙක දිහා බලාගෙන. සිනිඳුට එක පාරටම මුකුත් හිතාගන්න බැරිවුනා. මූණෙ තිබුන හිනාවත් එක්කම සිනිඳු මුකුත් නොකියා බිම බලාගන්නකොට මාලිගා අහපු ප්‍රශ්නෙ දිගේ හුඟාක් දේවල් හිතට ආවා... උසස් පෙළ පාස් වෙලත් විශ්ව විද්‍යාලෙට යන්න තිබුණ අවස්ථාව අත්හැරල රස්සාවක් හොයගන්න ඉන්ටවිව් පෝලිම්වල කකුල් රිදෙනකම් හිටපු හැටි... රැකියාවක් බලාපොරොත්තුවෙන් එක එක තැන්වලට යවපු ඉල්ලුම් පත්‍ර ගොඩ කොයිතරම් ද...? සිනිඳුට මතක් වුනා...

"සිනිඳු... මං අහපු දේට ඔයාගේ හිත රිදුන නේද...?" තත්පර ගානක් තිබුන නිහඬතාවය බිඳගෙන මාලිගා අයෙමත් කතා කෙරුවා.

"නැහැ..." සිනිඳු දිග හුස්මක් අරන් පිටකරන ගමන් කිව්වෙ අහස බලාගෙන...

"නෑ... ඔයාගෙ හිත රිදුනා. මං ආවේ ඔයාගෙන් ප්‍රශ්නයක් අහල ඔයාගේ හිත රිදවලා යන්න නෙමෙයි. සිනිඳු... මං ආවේ ඒ ප්‍රශ්නයට උත්තරය ඔයාට දෙන්න..."

මාලිගා එහෙම කියනකොටම සිනිඳු එකපාරටම හැරිල මාලිගාගේ මූණ දිහා බැලුවා.

"ඔයා කැමතිද ඔයාගේ නිර්මාණශීලී හැකියාවට ගැලපෙන කොළඹ ඇඩ්වර්ටයිසින් ෆර්ම් එකක ජොබ් එකක් කරන්න? ආ..? කියන්න ඔයා කැමතිද කියල..?"

මාලිගාගේ මූණ දිහා බලන් හිටපු සිනිඳුගේ ඇස් දෙක දිළිසුනා. මාලිගා ඒ මූණ දිහා බලන් හිටියෙ ඇස් පිහාටු ගහන්නැතුව.

"මොකද ඔයා කියන්නේ...?"

මාලිගා අයෙමත් ඇහුවා. සිනිඳු කතා නැතුව හිනාවුනා.

"අකමැතිද...?"

"නැහැ..."

"එහෙනං...?"

"උත්තරයක් දෙන්න ඉස්සෙල්ලා ගොඩක් පැති ගැන බලන්න ඕනි". සිතිදු එහෙම කියනකොටම චන්දු බීම බෝතලයයි වීදුරුවකුයි ට්‍රේ එකක තියාගෙන ළඟටම එනකම් දෙන්නම දන්නෙනෑ...

"හොරා වගේ ගිහින් බීම ගෙනාව නේද...?"

මාලිගා අහනකොට චන්දු හිනාමුනෙන්ම ට්‍රේ එක මාලිගා ඉස්සරහ තිබුන ටී පෝ එක උඩින් තිබ්බා.

"බෝතලේම බොන්නද?..." චන්දුගේ මූණ දිහා බලාගෙන මාලිගා ඇහුවෙ ඇස් පුංචි කරගෙන...

"හා.!." චන්දු එකපාරටම හිනාවෙලා ඔළුව වැනුවා...

"ෂෝක් එකට තියෙයි... මං ඔක්කොම තනියෙම බිව්වොත්... ගිහිල්ල හොඳ ළමය වගේ තව වීදුරු දෙකක් ගේන්න මල්ලියෝ..."

"ඒ මොකටද...?" සිතිදු එකපාරටම ඇහුවා.

"මේ... ඔයා කටපියාගෙන ඉන්න... ඒක අපේ වැඩක්..!"

මාලිගා ඇහිල්ල දික්කරල කියපු විදිහට සිතිදුට හිනායන්න ආව එක හංගගන්න බැරිවුනා.

"චූටි මල්ලි අරගෙන එන්න ඔයා... නැත්තං ඔන්න මං බොන්නෑ හොඳේ..." මාලිගා කිව්වෙ පුංචි එකියක් වගේ. චන්දු එතකොටම සිතිදු දිහා බැලුවා.

"ඉන්න එහෙනං මං ගිහිල්ල ගේන්න..." මාලිගා එහෙම තියාගෙන නැගිට්ටින්න හැදුවා. චන්දු එතකොටම ගෙට දුවල ගිහින් තව වීදුරු දෙකක් ගෙනාවා. මාලිගා වීදුරු තුන එක පේළියට තියල බීම දාන හැටි අයියයි මල්ලියි බලන් හිටියෙ හිනාමුනෙන්...

"බොන්න..." මාලිගා එක වීදුරුවක් චන්දුගේ අතට දීල අනිත් වීදුරුව අරගෙන සිතිදුට දික්කළා...

"ආ..."



WWW.EXPRESSLANKA.TK 37

සිතිදු ළඟටම ඇවිත් වීදුරුවට අත තියනකොට මාලිගාගේ ඇස් පිහාටු වේගයෙන් ගැහුනා. ඒ මූණ දිහා සිතිදු බලාගෙන හිටියෙ පුදුම වෙලා...

❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈

මාලිගා ගියාට පස්සෙ සිතිදු කල්පනා කෙරුවා. දවස් දෙකක් ඇතුළත ජොබ් එක භාරගන්න එනවද නැද්ද කියල දන්වනවා කියන පොරොන්දුව මාලිගා සිතිදුගෙන් අරගෙන ගියා. දෙව්දුවක් ඇවිත් දෙපා ළඟින් ගෙනත් තියල ගිය වාසනාවෙ මැණිකට පයින් ගහල ඒක විසිකරල දානවද එහෙම නැත්නම් ඒ මැණික දෝතින්ම අරගෙන ජීවිතේ දීප්තිමත් කරගන්නවද කියන සිතුවිල්ල මැද සිතිදුගෙ හිත නැවතුණා.

"ඒත් ඉක්මණට තීරණයක් ඕනි.!." සිතිදුගේ හිත කිව්වා. ඒත් ඒ තීරණය තනිවම ගන්න බෑ... කොළඹ රස්සාවට යන්න ආත්තම්ගෙන් කැමැත්ත ගත්තට පස්සේ සිතිදු හවස මුතුව හම්බ වුණා.

"මුතු... මං මේ තීරණය ගත්තෙ අපි ඔක්කොගෙම අනාගතේ වෙනුවෙන්... ඔයා දන්නවනේ... ලොතරැයි ජොබ් එක කරලා මට කවදාවත් අනාගතයක් ගැන හිතන්න පුළුවන්ද..? කියන්න, ඔයාගෙ තාත්තා මගේ අම්මගෙ අයියා වුනාට එයා කැමති වෙනවද එයාගේ දුවව නිකම්ම නිකං ලොතරැයි කාරයෙකුට බන්දලා දෙන්න..?"

සිතිදු හැමදෙයක්ම තේරුම් කරලා කිව්වා. මුතු අහගෙන හිටියෙ අහිංසක මුවැත්තියක් වගේ ඇස් දෙක බිමට බරකරගෙන.

"මුතු බයද මං කොළඹ ගියාම වෙනස් වෙයි කියල... ආ...?"

සිතිදු මුතුගෙ ඇස් දෙකට එබිල ඇහුවා. මුතු බිම බලාගෙනම ඔළුව වැනුවෙ නෑ කියන්න වගේ.

"ඔහොම බෑ... කට ඇරල කියන්න."

"න්...නැහැ..." මුතු බිඳුනු හඬින් හිමීට කිව්වා. සිතිදු මෙයේ

WWW.EXPRESSLANKA.TK 38

උඩින් තියාගෙන හිටපු මුතුගේ අතින් අල්ල ගත්තා.

"නෑ... මං දළදා හාමුදුරුවන් ළඟ ඔයාට වුන පොරොන්දුව කොහේ හිටියත් වෙනස් වෙන්නේ නැහැ. කොයි ලෝකෙ හිටියත් මගේ හිත වෙනස් කරන්න කාටවත් බෑ මුතු..."

මුතු ඔළුව උස්සලා සිනිදුගේ මූණ දිහා බැලුවා... ඒ බලාපොරොත්තු පිරුණු ඇස් දෙක දිළිසෙනවා...

"හිත හොඳින් ඔය ගමන යන්ට අයියා... මාත් කවදාවත් වෙනස් වෙන්නැහැ..." මුතු සිනිදුගේ ඇස් දෙක දිහා බලගෙන හිමීට තියනකොට කඳුළු දෙපේළියක් කම්මුල් දිගේ ගලාගෙන පහළට ආවා.

"ඉතිං ඔය අඬනවනේ... කෝ... ටිකක් හිනාවෙන්න..."

සිනිදු ඇස් පුංචි කරගෙන කිව්වා. මුතු හිනාවුනා. ඒ අහිංසක හිනාවත් අර තරුපොකුරු හිනාවත් අතර වෙනසක් සිනිදුට දැනුනෙ නෑ...

"මුතු... එහෙනං යමුද..? ගොඩක් හවස්වෙලා"

දෙන්නා පුංචි අවන්හලෙන් එළියට ආවට පස්සේ මුතු ගෙදර යන්න බස් එකට නැගල වීදුරු කවුළුවෙන් ආයෙමත් සිනිදු දිහා බලලා හිනාවුනා. ඒ අහිංසක හිනාවට සිනිදුගේ හිත පිච්චිලා යනකොටම බස් එක ඇද්දුවා. දිග හුස්මක් පිට කරපු සිනිදු ආපහු හැරිලා කෙළින්ම ගියේ පාර අයිනෙ තිබුන දුරකථන කුටියට... දෙකේ කාසි හතරක් දාලා අතට ගත්ත කොලේ තිබුන අංක ටික එබුවා...

"හෙලෝ..."

එහා කෙළවරින් ඒ ආත්මීය හඬ ඇහුනා...

"මාලිගා මිස්ද කතා කරන්නේ...?"

"සිනිදු.!." කිසිම අපහසුතාවයක් නැතුව මාලිගා ඒ හඬ එකපාරටම අඳුනගත්තා...

"ඉතිං... කොහොමද..? මොකද අර වැඩේ..?"

"ඒ ගැන කියන්න තමයි කතා කෙරුවේ..."

"ඉතිං ඔයා කැමතිද...?"



WWW.EXPRESSLANKA.TK 39

මාලිගා ඉවසිල්ලක් නැතිව ඇහුවා. ඒත් සිනිදු කතා කෙරුවේ නෑ...

"හෙලෝ..."

"ම්..."

"මොකද ඔයා කතා නැත්තේ..? අකමැතිද...?"

රිසීවරය අල්ලගෙන හිටපු මාලිගාගේ අත වෙව්ලුවා...

"ම්... හ්..."

"එහෙනං..?"

"මං හෙට උදෙන්ම කොළඹ එනවා..."

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

කෝච්චිය වේගයෙන් ඉස්සරහට ඇදුනා. මීදුම අතරින් ජේන ලස්සන පරිසරය දිහා බලාගෙන සිනිදු කල්පනා කෙරුවෙ ජීවිතේ පළවෙනි වතාවට අත්තම්මගෙනුයි මල්ලිගෙනුයි ඈත්වෙලා නුහුරු පරිසරයකට යන්න වුන එක ගැන...

ගෙයින් පිටවෙනකොට අත්තම්මයි මල්ලියි ඇස්වල කඳුළු පුරෝගෙන බලන් ඉඳපු හැටි සිනිදුට මැවිලා පෙනුනා. ඒත් මේ තමන් ගැන විතරක්ම හිතල යන ගමනක් නෙමෙයි කියල ඒ එක්කම සිනිදුගේ හිතට ආවා. ගමේ ඉඳන් කරන්න හොඳ රස්සාවක් තිබුනානම් කවදාවත්ම අත්තම්මවයි මල්ලිවයි තනියෙන් දාලා එන්න වෙන්නැහැ... ඒත් හිතේ තියෙන අභිංසක පැතුම් ඉටුකරගන්න තරම් ආර්ථික ශක්තියක් නැතුව ලොතරැයි කුඩුවක් ඇතලෙ ලතවෙවී ඉන්නකොට ලැබුන රස්සාවට පයින් ගැහුවනම් කවදාහරි දවසක මීට වඩා දුක්වෙන්න වෙන බව ඒ හිතම ආයෙමත් කිව්වා...

"තාමත් නෑ.!."

මාලිගා ආයෙමත් ඉවසිල්ලක් නැතුව ඔරලෝසුව දිහා බැලුවා. නුවර ඉඳන් එන කෝච්චිය තව පැය බාගයක් පරක්කුයි කියල යකඩ

WWW.EXPRESSLANKA.TK 40

කට්න් කියපු වෙලාවත් පහුවෙලා ගියා.

තත්පරයක් කල්පයක් වගේ දැනෙනකොට එකපාරටම ළඟ එන කෝච්චියෙ නලා හඬ ඇහුනා... මාලිගාට වාඩිවෙලා හිටපු පුටුවෙන් නැගිටුනේ ඉබේටම වගේ. ප්ලැට් ෆෝම් එකට ආව කෝච්චියෙ පෙට්ටි දිගේ මාලිගාගේ ඇස් දෙක එහාට මෙහාට දිව්වා... තත්පර ගානකට වැඩිය ගියේ නෑ... ඉවසුම් නැතුව හොයපු ඒ රූපේ කෙලවරේ පෙට්ටියක් ඇතුලෙන් මතුවුනා.

අත් දිගට දාපු ලාරෝස ෂර්ට් එක කළු කලිසමට යට කරල ඇඳගෙන හිටපු සිතිදුව දක්කම මාලිගාගේ හිතේ ඇතිවුන සතුට... එනකොටම සිතිදු මාලිගාව දක්කා... දෙන්නගෙම මුහුණුවල හිනාව පිපෙන කොට මාලිගා සිතිදු එන පෙර මගට ආවා.

"හුගක් වෙලාද ඇවිල්ලා..?"

මාලිගා ළඟට එනකොටම සිතිදු ඇහුවා...

"ඔව්... ටිකක් වෙලා හිටියා..."

"කෝච්චිය ටිකක් පරක්කු වුනා එහෙං එන්න..."

"ප්‍රශ්නයක් නෑ... ඔයා ඒ පරක්කු වෙලා ආව කෝච්චිය අතුලෙ හිටියනේ"

මාලිගා කිව්වෙ ඇස් පුංචි කරගෙන. දෙන්නා ස්ටේෂන් එකෙන් එළියට ඇවිත් ඉස්සරහ නවත්වල තිබුණ කාරෙක ළඟට ආවා... මාලිගා කාරෙකේ ඉස්සරහ වම් පැත්තේ දොර ඇරල සිතිදුගෙ මූණ දිහා බැලුවා...

"නගින්න.!."

සිතිදුගෙ කකුල් දෙක පණ නැතිවෙලා වගේ ගියා... පෝසත් කෙල්ලෙක් එක්ක තනියම කාර්එකක ඉස්සරහ සීට් එකේ වාඩිවෙලා යන්න...?

"න්... නෑ... මිස් මං මෙහෙන් නගින්නං..."

සිතිදුට එකපාරටම කියවුනා.

"ෂොක් !... ඔයාව පිටිපස්සෙ තියාගෙන ගියොත් මිනිස්සු හිතයි



WWW.EXPRESSLANKA.TK 41

මං ඔයාගේ ඩ්‍රයිවර් කියලා. මේ... පරක්කු වෙනව ඉක්මනට නගින්න"

ප්‍රතික්ෂේප කරන්න බැරි ඉල්ලීමක් ඉදිරියෙ හිත අසරණ වෙනකොට සිතිදු ඉස්සරහ දොරෙන් ඇතුල් වුනා. මාලිගා ඩ්‍රයිවින් සීට් එකේ වාඩිවෙන ගමන් සිතිදුගේ මූණ දිහා බැලුවා. සිතිදු වීදුරුව අයිනටම වෙන්න වාඩිවෙලා ඉස්සරහ බලන් ඉන්නවා... මාලිගාට හිත යටින් හිනා යනකොට කාරෙක පනගැහුනා. කාරෙකේ වේගය ටිකෙන් ටික වැඩිවෙනකොට සිතිදු යන්තමට බෙල්ල හරවල මාලිගා දිහා බැලුවා... "ආකාසෙ ඈත කොදෙව්වක ඉඳන් ආව දෙව්දුවක් මහපොළාවෙ කාරෙකක් පදවනද...?" සිතිදුට හිතුණා... ඒ සුදු අත් දෙකෙන් සුක්කානම සීරුවට එහාට මෙහාට කරකවන හැටි සිතිදුගේ ඇස්වලට අහුවුනා. එනකොටම...

"සිතිදු..."

ටික වෙලාවක් තිබුණ නිහඬතාවය බිඳගෙන මාලිගා කතා කෙරුවා. සිතිදු මාලිගාගේ මූණ දිහා කෙළින්ම බැලුවේ එනකොට...

"අත්තම්මා මොකද කිව්වෙ කොළඹ එනවට..?"

"විශේෂ මුකුත් කිව්වේ නෑ..."

"කිව්වෙ නැද්ද පුතේ උඹ ඔය කොළඹ ගියාට එහෙ ඉන්න බෝනික්කියන්ට එහෙම රැවටෙන්න එපා කියලා...?"

"නෑ... අත්තම්මා මං ගැන දන්නවා..."

"ඇත්තට..? එහෙනං ළමයට අත්තම්මගෙන් හොඳට ලකුණු තියෙනවා ඇති?"

"ඔව්... හිතට එකඟව වැඩ කරන මිනිස්සුන්ට නිකම්ම ලකුණු ලැබෙනවා..."

මාලිගා හිනාමුණෙන්ම ඇස් លොකුකරගෙන සිතිදු දිහා බැලුවා. සිතිදු කතා කෙරුවෙ ඒ තරම් සතුටකින් නෙමෙයි. පෝසත් කෙල්ලෙක් එලවන කාරෙකක ඉස්සරහ සීට් එකේ තනියෙන් ජෝඩු දාලා වගේ එන්න වුන එක ගැන සිතිදුගේ හිතේ තිබුණ අකමැත්ත මාලිගාට

WWW.EXPRESSLANKA.TK 42

ත්‍රෝරුන් නැහැ... ඒත් මාලිගා ඉස්සරහ වැඩි කතාවක් නැතුව කාරෙක පැදෙව්වා. කාරෙක බම්බලපිටිය පහුකරලා ටික දුරක් ගිහින් එක්තරා ගොඩනැගිල්ලක් ඉදිරිපිට පාර අයිනට වෙන්න නතරවුණා. සිනිදු මාලිගාගේ මූණ දිහා ආයෙමත් බැලුවෙ එතකොට.

"බහින්න"

සිනිදු කාරෙකෙන් බැහැපු ගමන්ම හතර වටේම ඇස් කැරකෙව්වා. කාරෙක නවත්වපු තැන තිබුණ ගොඩනැගිල්ල උඩ හයිකරල තිබුන නාම පුවරුව සිනිදු ගේ ඇස්වලට අහුවුනා.

"එන්න..."

සිනිදු මාලිගාගේ පිටිපස්සෙන් පඩිපෙල නැග්ගා. දෙවෙනි තට්ටුවට ආවට පස්සේ තිබුණ වීදුරු දොර ඇරගෙන දෙන්නා ඇතුල් වුනා. ඊට පස්සේ ඇතුලේ තිබුන තවත් කාමරේක වීදුරු දොර ඇරෙනකොට කැරකෙන පුටුවක වාඩිවෙලා වැදගත් ලියුමක් කියවමින් හිටපු රත්නායක එකපාරටම ඔළුව උස්සලා බැලුවා. ඒ එක්කම මූණට හිනාවක් ආවා.

"ආ...! මොකද දුව පරක්කු වුනේ...?"

"කොළුපිටිය එන්න ටිකක් පරක්කු වුනා අප්පච්චි..."

මාලිගා එහෙම කියනකොට රත්නායක දාගෙන හිටපු උපැස් යුවල ගලවන ගමන් සිනිදු දිහා තියුණු බැල්මක් හෙළුවා.

"අප්පච්චි මේ තමයි සිනිදු"

"වාඩිවෙන්න පුතා... ඉතිං..?"

රත්නායක සුහදශීලි විදිහට සිනිදුව පිළිඅරගෙන කතාවට මුල පිරුවා. අහපු ප්‍රශ්න දෙක තුනට සිනිදු පැකිලෙන්නැතුව උත්තර දුන්නා. මාලිගා හිටගෙනම හිනාමූනෙන් දෙන්නගෙම මූණ දිහා මාරුවෙන් මාරුවට බලන් ඉන්නවා.

"මං ඔය ළමයගෙ කොලිෆිකේෂන් බලන් නැතුව මෙහෙ වැඩට



WWW.EXPRESSLANKA.TK 43

ගන්නෙ දුවගේ වචනෙට. හැබැයි මේ ෆීල්ඩ් එකේ ඉදිරියට යන්න නම් හොඳ නිර්මාණශීලී හැකියාවන් වගේම අළුතෙන් යමක් හිතන්න පුළුවන් ශක්තියත් තියෙන්න ඕන."

රත්නායක කියන දේවල් සිනිදු අහගෙන හිටියේ රත්නායකගෙ ඇස්දෙක දිහා කෙළින්ම බලාගෙන, අභියෝගයක් බාරගන්න පුළුවන් කෙනෙකුගෙ ලකුණු සිනිදුගෙ ඒ බැල්මෙම සටහන් වෙලා තියෙනව කියල රත්නායකට හිතුනා.

"එහෙනං දුව... දන් මේ ළමයව ගෙදර එක්කරගෙන ගිහිල්ල පොඩ්ඩක් රෙස්ට් කරන්න දෙන්න... පාන්දරින් ඇවිල්ල මහන්සිත් ඇතිනේ..."

රත්නායක එහෙම කිව්වම සිනිදු අහිංසක විදිහට හිනාවුනා...

"පුතා... ඔයාට නවතින්න තැනක් හොයල දෙනකම් අපේ ගෙදර නවතින්න පුළුවන්... රයිව්... ඒ සේරම මෙයා ඔයා වෙනුවෙන් ලැහැස්ති කරල තියෙන්නේ..."

රත්නායක මාලිගාව පෙන්නල කිව්වා. සිනිදුට මාලිගාගේ මූණ බැලුනෙ ඉබේටම... ඒ ඇස් දෙක දිළිසෙනවා... රත්නායකගේ ඒ වචනවල තිබුණ සුහදශීලීබව ගැන සිනිදුට පුදුමයි. ඇත්තටම මේ වගේ නිහතමානී හදවත් තියෙන සල්ලිකාරයෝ මේ ලෝකේ ඉන්නව කියල සිනිදු මීට කලින් හිතුවේ නෑ.

කාරෙකට නැග්ගට පස්සේ ආයෙමත් සිනිදුගේ හිතට හුඟක් දේවල් ආවා. මාලිගාව මුලින්ම දකපු දවසේ ඉඳන් සිද්ධවුන අදහන්න බැරි සිදුවීම් පෙළ ආයෙමත් සිතුවම් පටයක් වගේ ඇස් ඉදිරිපිට මැවිලා පෙනුනා... මාලිගාගේ හිතත් සතුටින් පිරිලා... මේ වගේ හිත ඇත්තටම සතුටින් පිරිල තිබුණ තවත් දවසක් ගැන මාලිගාට මතක නෑ... මාලිගා කාරෙක පදවන ගමන් ඇස් කොනින් සිනිදු දිහා

WWW.EXPRESSLANKA.TK 44

බැලුවා... සිනිඳු ඉස්සරහ බලාගෙන බර කල්පනාවක... මාලිගා හිමි
කාරෙකේ කැසට් යන්ත්‍රය ක්‍රියාත්මක කරන බොත්තම එබුවා... ඊ
පසසේ...

අහස සේ ඔබ... අනන්තයි
සයුර සේ ඔබ... අනන්තයි
මේ විශ්වයේ... මා දකින්නේ
ඔබම පමණයි...
ඔබ අනන්තයි...
අනන්තයි...

කල්පනා ලෝකය බිඳිල ගිහින් සිනිඳුගෙ හිතත් ඒ සිංදුව ලෑ
නැවතුනා... ඒ අතරෙ සිනිඳුට මාලිගාගේ මූණ දිහා බැලුනෙ ඉබේටම
එතකොට මාලිගාගේ මූණත් යන්තමට සිනිඳුගේ දිහාවට හැරෙ
කොට...

"ඔයා ආසද මේ සිංදුවට...?" මාලිගා ඇස් පුංචි කරගෙන ඇහුවා
"ඔව්..." සිනිඳු කිව්වේ යන්තමට හිනාවෙලා...
"ඇත්තටමද කිව්වෙ..? ආ..?"
"ඔව්"
"ෂෝක්..! මගේ ආසම සිංදුව..."

වේණු තතක් හැඬවෙන... තැනත් ඔබ...
මධුවිතත් උතුරන... තැනත් ඔබ...
තෙළි තුඩත් දුවටෙන... තැනත් ඔබ...
පත්හිදත් ගැවසෙන... තැනත් ඔබ...



WWW.EXPRESSLANKA.TK 45

# 05

සතියක් ගෙවිල ගියේ නුහුරු පරිසරේ නුහුරු අත්දැකීම් එක්ක. ලොතරැයි කුඩුවක් ඇතුළෙ හිටපු සිතිදු කොළඹ වෙළඳ ප්‍රචාරක ආයතනයක සීත කාමරයක් ඇතුලෙ ඉඳන් ජීවිතේ අළුතෙන් පටන්ගන්න මුල පිරුවා. මතක තියන කාලේ ඉඳන්ම පුංචි ගෙදරක බිම පැදුරක නිදාගත්ත එකෙක් ජීවිතේ පළමුවතාවට ලොකු ගෙදරක සුවපහසු කාමරේක රාත්‍රිය පහන් කෙරුවා. මේ හැමදෙයක්ම අදහාගන්න බැරි සිදුවීම් විදිහට ජීවිතයට එකතු වෙද්දී ඒ හැම දෙයක්ම සිතිදුට ලබා දුන්න දෙවිඳුවගෙ හිත සතුටින් පිරිල ගියා...

සුවිසල් මැදුරෙ ආලින්දයෙ ඉඳන් මාලිගා වයපු වයලීනයේ මධුර හඬ හැම රෑකම සිතිදුට ඇහුනා. ඒ හඬ කන්පතුල් විදගෙන පපුව ඇතුළට ගියා... උදේට රත්නායකගේ කාරෙකේ වැඩට ආව සිතිදුව හවස ගෙදර එක්කගෙන යන්න මාලිගා ආවා... ඒ එන අතරෙ මාලිගා පුංචි එකියක් වගේ කියපු දේවල්, අහපු ප්‍රශ්න... සිතිදුට කවදාවත්ම අමතක කරන්න බැරි විදිහට හිත ඇතුලේ තැන්පත් වුනා...

"සිතිදු ඔයා සඳුදා උදෙන්ම එනව නේද...?"

මාලිගා ඇහුවෙ කාරෙක ටිකක් දුර ආවට පස්සෙ. වෙනදා වගේ



WWW.EXPRESSLANKA.TK 46

බම්බලපිටියේ ඉඳන් සිනිඳුවත් දාගෙන මාලිගා ගියෙ දෙහිවල පැත්තට නෙමෙයි... කාරෙක ගාළුපාර දිගේ කොළඹ පැත්තට ඇදුනා. සතියකට පස්සේ ගෙදර යන්න ලැබුන නිසා සිනිඳුගෙ හිත තිබුනෙ සතුටින් පිරිලා...

"බලන්නං..." සිනිඳු මාලිගා අහපු දේට උත්තර දුන්නා...

"බලන්නං.!. ඒ ඇයි.?." මාලිගා ඇහුවෙ ඇස් ලොකුකරගෙන ... සිනිඳුගෙ මූණට හිනාවක් ආවා...

"මට අත්තම්මා යන්න එපා කිව්වොත්.?."

"පිස්සු.!. අත්තම්මා එහෙම කියන්නෑ..."

"මිස් කොහොමද අපේ අත්තම්මා ගැන දන්නෙ...?"

"මි...ස්.!.?" මාලිගා එකපාරටම ඔළුව හරවල සිනිඳුගෙ මූණ දිහා බැලුවා. සිනිඳුගේ ඔලුව ඇතුලෙ විදිල්ලක් කෙටුව වගේ වුනේ එතකොට...

"පොරොන්දුව කඩකෙරුව නේද...?"

"ස්... සොරි ඔනකමින් නෙමෙයි කළේ.."

සිනිඳු එහෙම කියනකොට මාලිගාට හිනා ගියා...

"කමක් නෑ... අදට සමාව දෙන්නං..."

මාලිගා ඔළුව දෙපැත්තට හොලවල කිව්වෙ පුංචි එකියක් වගේ. සිනිඳුට මාලිගාගේ මූණ දිහා ආයිමත් බැලුනෙ ඉබේටම. කොළඹ ආව දවසෙම ඒ ඇස් දෙක දිහා බලාගෙන සිනිඳුට මාලිගාට පොරොන්දුවක් වෙන්න වුනා. ඒ ආයේ කවදාවත්ම "මිස්" කියල කතා කරන්නැහැ කියල... ඒක මාලිගා සිනිඳුගෙන් තාම ඉල්ලපු එකම ඉල්ලීම.

කාරෙක පිටකොටුව ස්ටේෂන් එක ඉස්සරහට හිමීට ඇවිත් නැවතුනා....

"සිනිඳු චුට්ටක් ඉන්න!.."

සිනිඳු දොර අරින ගමන් මාලිගා දිහා බැලුවා.

මාලිගා පිටිපස්සෙ සීට් එකේ තියාගෙන ආව පාර්සලේ අරගෙන සිනිඳුට දික්කෙරුවා.

"මොනවද...?"



WWW.EXPRESSLANKA.TK 47

"පොඩි බඩුවක් ! ගෙදර ගිහින් දිග ඇරල බලන්න"

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

සිනිදු ගෙදර ආව ගමන්ම වගේ කලේ මල්ලිත් එක්ක එකතුවෙලා මාලිගා දුන්න පාර්සලේ ලිහල බලන එක. පුංචි එකාගේ මූණ සතුටින් පිරුණා. ඒක ඇතුලෙ තිබුණෙ අයියටයි මල්ලිටයි දෙන්නටම අලුත් ඇඳුම් වගයක්...

"අත්තම්මෙ... මේක ලස්සනද...?"

චන්දු මාලිගා එවපු ටී ෂර්ට් එකක් ඇඳගෙන කුස්සියෙ හිටපු ආත්තම්මා ළඟට ගිහින් පෙන්නුවා...

"ලස්සනයි මයේ පුතේ... හරියටම ඒ නෝනා උඹව එක්කගෙන ගිහින් අරන් දුන්න වගේ... ඇහේ ගානටම තියෙනවා..."

අත්තම්මා කිව්වේ සතුටින් හිත පුරෝගෙන. දිව්‍ය ලෝකයෙන් ආව සුරංගනාවියක් වගේ පෝසත් ගෙදරක ගෑණු දරුවෙක් ඇවිත් තමන්ගේ පවුලට මේ තරම් දයාබර වුනේ කොහොමද කියල අත්තම්මටත් හරියටම හිතාගන්න බැරිවුනා. ඒත් ඒක සමහර විට මේ සංසාරේ පතාගෙන ආව බැඳීමක් නිසා වෙන්නැති කියල ඒ එක්කම අත්තම්මගෙ හිතට හිතුනා...

සිනිදු තමන්ට දීල තිබුන වටින ෂර්ට් දෙකේ කවරවත් කඩන්නැතුව ඒ දෙක අතේ තියාගෙන ඇඳ උඩ ඉඳන් කල්පනා කෙරුවා. කොයිතරම් කල්පනා කෙරුවත් තාම හිතාගන්න බැහැ... කුමාරිකාවක් වගේ කෙල්ලෙකුගේ මේ දයාබරත්වයේ, මේ ලෙන්ගතුකමේ කෙළවර කොතැනකද...?

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

"මට හරි පුදුමයි අයියේ ඒ මිස් ගැන..."



WWW.EXPRESSLANKA.TK 48

මුතු කිව්වෙ සිනිඳු කියපු හැමදෙයක්ම සුරංගනා කථාවක් අහගෙන ඉන්න පුංචි එකියක් වගේ අහගෙන හිටියට පස්සේ. සිනිඳු උදේත්ම මුතුලගෙ ගෙදර ආවා. එක දෙයක් නැතුව කොළඹ ගිය දවසෙ ඉඳන් වුන හැම දෙයක්ම සිනිඳු මුතුට කිව්වා. කිව්වෙ නැත්තේ මාලිගාට මිස් කියල කතා කරන්න එපා කියල කියපු එක විතරයි...

"අයියා මං ගැනත් ඒ මිස්ට කිව්වද...?"

සිනිඳුගෙ මූණ දිහා බලාගෙන මුතු ඇහුවෙ තරමක ලැජ්ජාවෙන් වගේ. සිනිඳුට හිනා ගියා...

"අපෝ නෑ..."

"ඇයි...?"

"පිස්සුද...? ඒ වගේ දෙයක් අහන්නැතුව නිකම්ම කියන්න.."

මුතු හිනාවුනා. ඒත්... ඒ හිනාමූණෙන් වහගෙන තියෙන මුතුගේ අසරණ හිත තේරුම් ගන්න සිනිඳුට අමාරු වුනේ නෑ.

"මුතු..." සිනිඳු හිමීට කතා කෙරුවා...

"ම්..."

"ඔයා බයද...?"

"මොකටද...

"කොළඹ ඉන්නකොට මං වෙනස් වෙයි කියල..."

බිම බලාගෙන හිටපු මුතු ආයෙමත් ඔළුව උස්සල කෙළින්ම සිනිඳුගෙ ඇස්දෙක දිහා බැලුවා.

"මුතු... මං කොළඹ ගියාට මගෙ හිත කොළඹ ගෙනියල නෑ... ඒක හැමදාම ඔයාලඟ තියල තියෙන්නෙ... ඒ හින්දා ඒක කොළඹ කාටවත් ගන්න බෑ..." සිනිඳුගෙ මූණ දිහා බලාගෙන හිටපු මුතුගෙ ඇස්දෙක ඇතුලෙ කඳුළු බිංදු දෙකක් දිළිසෙනවා සිනිඳු දැක්කා...

"මේ... ඔයා මට ආදරය කෙරුවට කොළඹ කෙල්ලො මට ආදරය කරන්න එයි කියලා චුට්ටක්වත් බයවෙන්න එපා හොඳද... කොළඹ කෙල්ලෝ හොයන්නෙ ලස්සන හිත් නෙමෙයි... ලොකු ගෙවල්, ලස්සන කාර්, ඉන්ටර්කූලර්... ඉතිං මට ඒවා නැහැනේ... ඔයා බය නැතුව



WWW.EXPRESSLANKA.TK 49

ඉන්න හරිද..."

මුතු ආයෙමත් හිනාවුනා. කඳුළු බිංදු නලියපු ඇස් පිහාටු ගැහෙද්දි ඒ මූණ කොයිතරම් ලස්සනද කියල සිතිදුට හිතුනා. මුතුගේ හිනාමූණ ඉදිරියේ අර තරු පොකුරු හිනාව සිතිදුගෙ මතකයට ආවේ නෑ...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

පහුවෙනිදා උදේ 10 වෙනකොට රත්නායකගේ මේසෙ උඩ තියෙන දුරකථන වලින් එකක සීනුව නාදවුනා.

"හෙලෝ..."

"අප්පච්චි... තාම සිතිදු ආවේ නැතේ.!." එහා කෙළවරින් රත්නායකට ඇහුනේ ඉවසුම් නැතුව වගේ කතා කරන මාලිගාගේ හඬ... ඒ එක්කම රත්නායකගේ මූණට හිනාවක් ආවා...

"ආ..! සිතිදු මෙහෙ ඉන්නවනෙ දුව"

"ස්... සිතිදු ඉන්නවා.?.!"

මාලිගාට පුදුම හිතුණා.

"ඔව් දූ එයා උදේ නුවර ඉඳන් කෙලින්ම මෙහාට ඇවිල්ලා... මිනිහා මං එනකොටත් වැඩ..."

"මාර එක්කෙනෙක් තමයි..." මාලිගාට එකපාරටම කියවුනා.

"ඇ... ඇයි දූ...?"

"න්... නෑ අප්පච්චි.. මුකුත් නෑ... මං දන් මියුසික් ක්ලාස් එකට යන ගමන් ඔහේට එනවා... සිතිදුට කියන්නෙපා මං ඇහුව කියල හොදේ..."

"හම්... හ්ම්..."

"පි... ස්සු කෙල්ල..."

රත්නායකට රිසීවරය තියන ගමන් හිතින් එහෙම කියවෙනකොට මුහුණ පුරා ආයෙමත් හිනාරැල්ලක් ඇදිලා ගියා...



WWW.EXPRESSLANKA.TK 50

සිනිඳු වැඩ කරන කාමරේ වීදුරු දොර ඇරෙනව සිනිඳුට දැනුනේ නෑ... ඒත් ඔළුව මේසෙට බර කරගෙන ලිය ලිය හිටපු සිනිඳුව දැක්කම මාලිගාගේ හිතේ පිරිල තිබුණ සතුට තවත් වැඩිවුනා. සිනිඳු ඇඳගෙන හිටියෙ එදා මාලිගා යවපු පාර්සලේ තිබුණ රෝස පාට අත්දිග ෂර්ට් එක... මාලිගා සිනිඳුගේ මේසේ ඉදිරිපිට තියෙන ප්ලාස්ටික් පුටුව හිමීට පස්සට ඇදලා අරගෙන වාඩිවුනා. ඒත් සිනිඳුට දැනුන් නැහැ...

මාලිගා පුටුවෙ වාඩිවෙලා අත්දෙක බැඳගෙන පෙල් පිලිමයක් වගේ සිනිඳු දිහා බලන් ඉන්නවා... ඇඟිලි තුඩුවල හිරවෙලා තිබුන පෑන වේගයෙන් කොලේ දිගේ ඇදිල ගිය ගමන කෙළෙවර වුනාට පස්සේ සිනිඳු දිග හුස්මක් පිටකරල ඔළුව ඉස්සුවා... ඇස්වල විශ්මය පිරෙනකොට සිනිඳුගේ මූණේ හිනාවකුත් පිපුනෙ එතකොට...

"ලියනකොට ලෝකේ පෙරලුනත් දන්නැහැ නේද...?"

මාලිගා ඇස් පුංචි කරගෙන ඇහුවා. ඒ ඇස් කොයිතරම් ලස්සනද කියල සිනිඳුට හිතුන් නැහැ...

"ඇත්තමයි... මට දැනුන් නෑ කව්රුවත් කාමරේට ඇවිත් ඉන්නවා... සමාවෙන්න..."

"පිස්සුද? මං එහෙම ඇහුවෙ විහිළුවට... ඔයා හරි, නිර්මාණ කාරයින්ට වැඩක් කරනකොට වෙනත් දේවල් ගැන අවධානය තියාගෙන ඒක කරන්න බැහැනේ.

සිනිඳු අහිංසක විදිහට හිනාවුනා. ඒ එක්කම මාලිගා ගැන හැමදාම රැලිබිඳගෙන වෙරළට එන රළ වගේ තේරුම් ගන්න බැරි සිතුවිලි අහුරක් එක පිට එක හිතට ආවා...

"ඒක නෙමෙයි, මොකද ගෙදරට එන්නැතුව කෙළින්ම මෙහාට ආවේ ? ආ...?"

"එහෙ ගිහිල්ලා මෙහෙට එන්න ආවනම් පරක්කු වෙනවා... මොකද දේව කාරියටත් වැඩිය රාජකාරිය ලොකුයිනේ මැඩම්..."

සිනිඳු හිනාවෙලා කිව්වා.

"හ්ම්!.. හොඳයි ළමයගේ අදහස්... ඉතිං අත්තම්මයි මල්ලියි සනීපෙන්



WWW.EXPRESSLANKA.TK 51

ඉන්නවද...?"

"ඔව්..."

"ගෙදර ගියාට පස්සෙ ආයෙ මෙහෙ එන්නැතුව එහෙම ඉන්න හිතුන් නැද්ද...?"

"හිතුනත් එහෙම කරන්න බැනේ..."

සිනිදුගේ කටින් එකපාරටම එහෙම කියවෙන කොට මාලිගාගේ හිත ඇතුලේ මොකක්දෝ වුනා...

"ඒ ඇයි...?"

මාලිගා එහෙම ඇහුවෙ හිත ඇතුලෙ යන්තමින් රිදීගෙන එනකොට. සිනිදු ඒකට උත්තරයක් දෙන්නැතුව වාඩිවෙලා හිටපු පුටුව ළඟ බිම තියල තිබුන බෑග් එක අරගෙන ඇරලා ඒක ඇතුලෙ තිබුන පාර්සලේ ගත්තා... මාලිගා ඇස් පිහාටු ගහන්නැතුව වගේ ඒ දිහා බලන් ඉන්නවා.

"ආ..."

සිනිදු අහිංසක හිනාමූණෙන්ම බෑග් එකෙන් ගත්තු පාර්සලේ අත්දෙකින්ම මාලිගාට පිලිගැන්නුවා...

"මොනවද...?"

මාලිගාත් එහෙම ඇහුවෙ පාර්සලේ අත් දෙකින්ම ගන්න ගමන්...

"පුංචි බඩුවක්... අත්තම්මා දුන්නේ... ගෙදර ගියාම දිග ඇරලා බලන්න..."

"එතකං ඉන්නෙ කොහොමද.?. කියන්නකෝ මොනවද කියල මේ .?."

මාලිගා ඉවසුම් නැතුව වගේ ඇහුවේ දඟකාර විදිහට.

"කිව්වට පස්සේ මට හිනාවුනොත්.?."

"අනේ එහෙම හිනාවෙන්නෙ මොකටද...?"

"එහෙනං... ඔන්න කියනවා..."

"හ්ම්.!." මාලිගා ඇස් පුංචි කරගෙන ඔලුව දෙපැත්තට වැනුවා.



WWW.EXPRESSLANKA.TK 52

"ඕ... ක... ඇතුලෙ තියෙන්නේ... අපේ අත්තම්මා ඔයාටම දෙන්නම කියල හදාපු වැලිතලප වගයක්... හරිද..."

"ෂෝක්නෙ...! මං හරි ආසයි ඒවා කන්න. එහෙනං ඔයාගේ අත්තම්මා මටත් ආදරෙයි නේ...?" මාලිගා ඇස් ලොකු කරගෙන හිනාමුණෙන් කියනකොට සිනිදුගේ හිතත් සතුටින් පිරිලා ගියා... ඒත්...

"මේ ... මං මේකෙන් ටිකක් අපිට තියාගෙන අනිත් ටික ඔක්කොම අපේ ක්ලාස් එකට ගෙනියන්නද...? පවුනේ ඒ ගොල්ලොත් කැමතියි මේ වගේ සිංහල කෑම කන්න..."

"ඉතිං දැන් ඕක ඔබතුමියගේ... ඔබ තුමියට කැමති ඕන විදිහකට බෙදහදාගෙන කන්න..."

මාලිගා හිනාවුනා... ඒ හිනාහඬ සීත ,කාමරය ඇතුලෙ දෝංකාර දෙනව වගේ සිනිදුට දැනුණා.

"ඒක නෙමෙයි.., මේ සතිය මැද මට මල්කිලගෙ ගෙදර යන්න වෙනවා... මං එතකොට අත්තම්මවයි මල්ලිවයි බලන්න යන්නම් හොඳේ... කමක් නෑනේ.?."

"ඔබතුමියට කැමති විදිහක්..."

"මේ... ඒ ගමන මිස් කැල්ල අයින් කලාට පස්සේ ඔබ තුමිය කියන්න ගත්තද.?. හොඳට මතක තියාගන්න... මං ඔයාට මිසුත් නෙමෙයි, ඔබතුමියත් නෙමෙයි, තිකම්ම තිකම් මාලිගා හරිද..? එහෙනං. මං දැන් ක්ලාස් එකට යනවා. මහත්තයා වැඩ ඉවරවෙලා හරියට පහට පල්ලෙහාට එන්න... මං එක්කගෙන යන්න එන්නම්... රයිට්..."

පුංචි එකෙකුට තරවටු කරන අම්මා කෙනෙක් වගේ මාලිගා ඇඟිල්ල දික්කරගෙන එහෙම කියන ගමන් පුටුවෙන් නැගිට්ටා... සිනිදු ඔළුව උස්සගෙන ඒ මූණ දිහා බලන් හිටියෙ අදහන්න බැරුව වගේ...

* * * * * * * * * *



WWW.EXPRESSLANKA.TK 53

මාලිගා සිනිදුව එක්කගෙන යන්න එනකොට සිනිදු පහළට බැහැල හිටියෙ. කාරෙක පේව්මන්ට් එක ළඟටම කරලා නවත්වපු ගමන් සිනිදු ඉස්සරහ දොර ඇරගෙන ඇතුල්වුනා.

"මං පරක්කු වුනේ නැහැනේ...?" මාලිගා හිනාවෙලා ඇහුවා.

"නැහැ..." සිනිදු කිව්වෙ කාරෙකේ දොර වහගන්න ගමන්. ඒත් සිනිදු තාමත් මාලිගාගේ කාරෙකේ ඉස්සරහ සීට් එකේ යන්නේ කැමැත්තකින් නෙමෙයි...

කාරෙක වැල්ලවත්ත හරියට එනකොට මාලිගා පාර අයිනෙ තියෙන පුංචි අවන්හලක් ඉදිරිපිට කාරෙක නතර කළා. සිනිදු එකපාරටම මාලිගාගේ මූණ දිහා බැලුවා.

"අපි මොනව හරි බීල යං! මට හරි තිබහයි..."

, මාලිගා සුපුරුදු මදහසත් එක්ක ඇස් පුංචි ,කරගෙන කිව්වා. සිනිදුගේ පපුව ඇතුළෙ එකපාරටම පුංචි ගැස්මක් ඇතිවුනා වගේ වුනේ එතකොට. ඒ එක්කම සිනිදුට මුතුව මතක් වුනා. මුතුත් එක්ක මිසක් සිනිදු කවදාවත් මීට කලින් වෙන කෙල්ලෙක් එක්ක තනියම අවන්හලක් ඇතුලෙ ඉඳගෙන බීම බීලා තිබුනෙ නැහැ...

"බහින්න.!." සිනිදුගේ හිත අසරණ වෙලා දෙලොවක් අතර අතරමං වෙලා යද්දි මාලිගා එහෙම කියාගෙන දොර ඇරගෙන බැස්සා.

"ඔයා ඉස්සර වෙන්න ඉතිං..." සිනිදු බැස්සට පස්සෙ මාලිගා හිනාවෙලා පුංචි එකියක් වගේ කිව්වා.

"කුම්බලාවෝ කැවනම් ඉතිං දුක් විදින්න ඕනිනේ..."

මාලිගාට ඉස්සරවෙලා අවන්හලට ඇතුල්වෙනකොට සිනිදුට හිතින් ඉබේටම කියවුනා.

"සිනිදු..." මාලිගා වීදුරුවට දාලා තියෙන බටෙන් බීම උගුරක් උරාගත්තට පස්සෙ කතා කෙරුවා. පුංචි රවුම් මේසේ මාලිගාගේ ඉස්සරහින් මූණට මූණ පේන විදිහට වාඩිවෙලා හිටපු සිනිදු ඔළුව



WWW.EXPRESSLANKA.TK 54

උස්සලා මාලිගාගේ මූණ දිහා බැලුවා...

"මේ... මට ඔයාට වැඩක් කියන්න තියෙනවා..."

"වැඩක්...?"

"ඔව්..."

"මොකක්ද?"

"කියන්නද එහෙනං.?."

"හ්ම්..."

"මේකයි වැඩේ... ඔයා ඉක්කමට ඩ්‍රයිවින් ඉගෙන ගන්න ඕනි..."

"ඩ්‍රයිවින් ඉගෙන ගන්න.?!"

"ඔව්!"

"මං මොකටද ඩ්‍රයිවින් ඉගෙන ගන්නෙ ?" සිතිදු ඇහුවෙ කිසිම දෙයක් හිතාගන්න බැරුව.

"ඩ්‍රයිවින ඉගෙන ගන්නෙ... වාහන එලවන්න..."

මාලිගා බෙල්ල ඇල කරලා ඇස් පුංචි කරගෙන ලතාවකට වගේ කිව්වා.

"ඉතිං මට කොයිපද වාහනයක්...?"

"අර තීන්නේ...!"

මාලිගා අවහන්හල ඉස්සරහ නවත්තල තියෙන බී. එම්. ඩබ්ලිව්. එක දිහාවට අත දික්කරල පෙන්නුවා. පිටිපස්ස හැරිල බලපු සිතිදුගේ උගුර කට වේලිලා ගියා වගේ... සිතිදු වීදුරුවෙ තව ඉතුරුවෙලා තිබුණ බාගයක් විතර බීම ටික ඔක්කොම එක හුස්මට බීගෙන ගියා. සිතිදුගේ මූණ දිහා බලන් ඉන්න මාලිගාගේ ඇස් පිහාටු වේගයෙන් ගැහෙනවා.

"සිතිදු ඔයාට ඩ්‍රයිවින් ඉගෙන ගන්න කොහේවත් යන්න ඕනි නැහැ. මං ඔයාට උගන්වන්නනම්... මට පුළුවන් ඔයාට හවසට අපේ වත්තෙම පුරුදු කරන්න. ඊට පස්සේ ඔයාට තීන්නේ ලෙසන්ස් එක ගන්න ඉන්ටර්විව් යන එක විතරයි. ඒක අරන්දෙන්නෙ මං ගානෙ,



WWW.EXPRESSLANKA.TK 55

හරිද...?"

මාලිගා කියන දේවල් සිනිදු අහගෙන හිටියේ අහක බලාගෙන. ආදරය පිරුණු ඇස් දෙකක්, ආදරය පිරුණ හඬක්, ආදරය පිරුණ හදවතක් ඉදිරිපස සිනිදුගේ හිත අසරණ වෙලා තිබුණා. ඒ අතරෙ බීම තියපු වේටර් බිල අරගෙන ඇවිත් මේසේ උඩින් තියල යනකොටම සිනිදු එකපාරටම පර්ස් එක අරගෙන සල්ලි තියන්න හැදුවා. ඒත් මාලිගා සිනිදුට කලින් අතේ තියන් හිටපු සීයේ කොලේ අරගෙන ඒ පුංචි බඳුන උඩින් තිබ්බා.

"බීම බොන්න කතා කලේ මමනෙ,.. මමයි බිල ගෙවන්නෙ"

"ඇයි කතා නොකරපු හින්ද මට ගෙවන්න තහනම්ද...?"

සිනිදු එහෙම ඇහුවම මාලිගාගෙ හිත ඇතුළ රිදිගෙන ගියා. තමන් කලේ වරදක්ද කියල මාලිගාට හිතුනා. ඒත් ඒ වරද දන් හදන්න බෑ. වේටර් ඇවිත් සල්ලි තියපු බඳුන අරගෙන ගියා.

"එහෙනං ආයෙත් දවසක ආවම ඔයා බිල ගෙවන්න..."

මාලිගා හිනාවෙලා පුටුවෙන් නැගිටින ගමන් කිව්වා. ඒත් සිනිදුගෙ මූණෙ හිනාවක් තිබුනේ නැහැ. දෙන්නා ඇවිත් කාරෙකට නැග්ගට පස්සෙ...

"තරහද...?"

මාලිගා ඇහුවා.

"මොකටද...?"

"මං සල්ලි දුන්න එකට?.."

"නැහැ... " සිනිදු මාලිගාගේ මූණ දිහා බලන්නැතුව හමීට කිව්වා.

"එහෙනං අපි අදම අර වැඩේ පටන් ගමුද ?"

මාලිගා අයෙමත් ඇස් පුංචි කරගෙන දහකාර විදිහට ඔළුව හොලවල ඇහුවා.

"මොන වැඩේද...?"



WWW.EXPRESSLANKA.TK 56

"ඔය ! ඒ ටිකට අමතක වෙලා.. ඩ්‍රයිවින් ඉගෙන ගන්න එක..."

මාලිගා හිනාවෙලා එහෙම කිව්වට සිනිදු මුකුත් කිව්වෙ නෑ... එතකොටම කාරෙක පණ ගැන්වුනා.

"එහෙනං ඔයා කැමතිනෙ පුරුදු වෙන්න..?"

මාලිගා ආයෙමත් සිනිදුගේ මූණ දිහාවට හැරිලා ඇහුවා. ඒ බැල්මට ප්‍රතිචාරයක් නොදක්වා ඉන්න සිනිදුට පුළුවන් කමක් තිබුන් නෑ... සිනිදු හිනාවුනා. කාරෙක වේගයෙන් ගාළුපාර දිගේ ඉස්සරහට ඇදිලා ගියා...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

"කමෝන් සිනිදු...!, කමෝන්...!"

සිනිදු කාරෙක තනියම පදවගෙන යන හැටි බලාගෙන හිටපු මාලිගා අත්පුඩි ගගහ පුංචි එකියක් වගේ කෑගැහැව්වා... සිනිදු මාලිගාලගේ බංගලාව ඉදිරිපිට මිදුලෙ රවුමට තියෙන් තාර දාපු පටු පාරේ කාරෙක වට කිහිපයක් පදවගෙන ගිහිල්ලා ආයෙමත් මාලිගා ඉන්න තැනටම ඇවිත් නතර කෙරුවා...

"සිනිදු ෂෝක්...! දන් ඔයාට හොඳට ඩ්‍රයිව් කරන්න පුළුවන්..! මේ ඔහොම ඉන්න චුට්ටක් හොඳේ.."

මාලිගා මූණ හිනාවෙන් පුරෝගෙන එහෙම කියල එකපාරටම ගේ පැත්තට දුවගෙන ගියා. කකුල් වැහෙන්න දිග ගවුමක් ඇඳගෙන දුවන මාලිගා දිහා සිනිදු බලාගෙන හිටියේ ඊළඟට වෙන්න යන්නේ මොකක්ද කියල හිතාගන්න බැරුව...

දුවගෙන යන මාලිගාගේ මැද්දෙන් බෙදපු කොන්ඩෙ දෙපැත්තට සුළඟේ පාවෙලා ගිහින් ආයෙමත් පිට මැද්දට වැටෙන ලස්සන සිනිදුට පෙනුනා. ඒ කෙහෙරැලි වල තැවරිලා තියෙන සියුම් සුමුදු සුවඳ සිනිදුගේ නැහැයට තදින්ම දැනුනේ ගෙවිල ගිය දවස් කිහිපයේදී...



WWW.EXPRESSLANKA.TK 57

මාලිගා ඒ දවස් හැම එකකදීම හවසට සිනිඳුව කාරෙකේ ඩ්‍රයිවින් සීට් එකේ ඉන්දවලා ළඟින්ම ඉඳගෙන කාරෙක පදවන්න කියල දීපු හැටි සිනිඳුගේ හිතේ සිතුවම් ඇඳුනා...

"හා! හා.!. සිනිඳු තව මෙහාට කපන්න.!."

මාලිගා සිනිඳුට වරදින තැන්වලදී එකපාරටම සිනිඳුගේ අත්දෙකට හිරවෙලා තියෙන ස්ටියරින් වීල් එක අල්ලා හරි පැත්තට කැරකුවා...

"හරි... ඔහොම යං.!."

මාලිගා ඒ විදිහට ගුරුතුමියක් පුංචි ළමයෙකුට අකුරු උගන්වනව වගේ සිනිඳු ළඟින්ම ඉඳගෙන හැමදෙයක්ම කියල දෙනකොට මාලිගාගේ පණ ගැහෙන ජීවන හුස්ම පොදක උණුසුමත් සිනිඳුට දැනුනා...

"සිනිඳු.!."

මාලිගා ගේ ඇතුලෙ ඉඳන් එළියට එනකොට සිනිඳු කාරෙක පෝටිකෝව යටට ගෙනත් තිබුණා. කාරෙකෙන් බැහැලා පාර දිහා බලන් හිටපු සිනිඳු ඒ හඬින් මාලිගා දිහාවට හැරෙනකොට...

"ආ..." මාලිගා සිනිඳු දිහාවට දික්කරගෙන හිටපු දේ දකල සිනිඳුගේ ඇස්දෙක ලොකුවුනා...

"ගන්...න... මේක ඔයාගේ..." මාලිගා අත්දෙකෙන්ම අල්ලගෙන හිටපු සෙලියුලර් ෆෝන් එක සිනිඳුට දික්කරගෙනම හිනාවෙලා කිව්වා... එත්...

"මගේ...!?" සිනිඳු ඇහුවෙ පුදුම වෙලා...

"ඔව්..! මේ මගේ ගෝලයට මගෙන් පුංචි තෑග්ගක්..."

"මොන ගෝලයටද...?!"

"ඇයි... අමතකද ඔය චූටිටට.?. මමනේ ඔයාට ඩ්‍රයිව් කරන්න ඉගැන්නුවේ... ඉතිං ඔයා මගේ ගෝලයා..."

මාලිගා ඒ වචන පෙළ කියපු විදිහට සිනිඳුට හිනා ගියා.

"ඉතිං ගන්න මේක..."

තවත් ඒ අහිංසක බලකිරීම ඉදිරියේ නිහඬව ඉන්න සිනිඳුට



WWW.EXPRESSLANKA.TK 58

පුළුවන් වුන් නෑ... සිනිඳු මාලිගා අත් දෙකෙන්ම දික්කරගෙන හිටපු සෙලියුලර් ෆෝන් එක අතට ගත්තා. ඒත් මේ කෙටි කාලය තුළ ලැබුන හැම දෙයක්ම වෙනුවෙන් ඉදිරියේ තමන්ට ගෙවන්න වෙන වන්දිය මොන වගේ වෙයිද කියන ප්‍රශ්නය ඒ එක්කම සිනිඳුගෙ හිතට ආවා. එතකොටම...

"දන් ඉතිං ඔයාට ඕන වෙලාවක ඕන තැනක ඉඳගෙන ඔයාට කැමති කෙනෙකුට කතා කරන්න පුළුවන්..."

මාලිගා සිනිඳුගේ මූණ දිහා කෙලින්ම බලල ඇස් පුංචි කරගෙන කිව්වේ සිනිඳුගේ හිත සතුටින් පිරිල කියල හිතාගෙන...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

සෙනසුරාදා දවල් දෙක වෙනකොට මාලිගාගේ සෙලියුලර් දුරකථනයට ඇමතුමක් ආවා...

"හෙලෝ..."

"මැඩම්..."

ඒ හඬ තරම් ලෙහෙසියෙන් හඳුනගන්න පුළුවන් තවත් හඬක් මාලිගාගේ සවන් තුළ දන් නැහැ...

"ඕ... සිනිඳු ඇයි...?" මාලිගා ඇහුවෙ තරමක් කලබලෙන් වගේ.

"මැඩම් මං දන් යනවා!"

සිනිඳු කිව්වෙ සැහැල්ලු විදිහට...

"ඇයි ඒ...? ඉන්න මං හතර වෙනකොට එනවා... ට්‍රේන් එක තියෙන්නෙ පහමාරටනේ..."

"බැහැ... මං අද බස් එකේ යනව... මං සර්ටත් කිව්වා දන් යනව කියල..."

"ඇයි ඒ... ?" මාලිගාට මුකුත්ම හිතාගන්න බැරිවුනා...

"විශේෂයක් නෑ... මට අද වේලපහින් යන්න හිතුනා..."



WWW.EXPRESSLANKA.TK 59

"ඉතිං එහෙනං ඔයා ඔහොමම ඉන්න..! මං දැන්ම එන්නං..."

"ඕන් නැහැ කරදර වෙන්න... අද මං බස් එකේ ස්ටේෂන් එකට යන්නං... කමක් නැනේ... එහෙනං මං තියනවා..."

සිනිදු එහෙම කියලා රිසීවරය තියන හඬ මාලිගාට ඇහුනා. ඒ හඬත් එක්කම මාලිගාගේ පපුව ඇතුලෙ මොකක්දෝ වෙනව වගේ දැනීගෙන ගියා.

සිනිදු වේලාපහින්ම නුවර යන්න තීරණය කෙරුවෙ මාලිගාව මහහැරලා කොළඹට යන්න ඕන නිසා... කොළඹ රැකියාවට ඇවිත් මුලින්ම පඩි හම්බවුන දවසෙ අත්තම්මටයි, මල්ලිටයි මුතුටයි කොළඹින් තෑගි අරන් යන්න සිනිදුට ඕන වුනා... ඒත් මාලිගාගේ කාරෙකේ ගිහින් ඒ දේවල් ගන්න යන්න සිනිදුගෙ හිතේ කැමැත්තක් තිබුන් නෑ...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

මාලිගා සංගීත පන්තිය ඉවර වෙන්න කලින් මාස්ටර්ට බොරුවක් කියලා එතනින් ඉක්මණට පිටවුනා. කාරෙක වේගෙන් බබ්බලපිටියට ආවා.

"අප්පච්චි..! සිනිදු ගියාද...?"

මාලිගා කලබලෙන් වගේ රත්නායකගේ කාමරේ වීදුරු දොර ඇරගෙන ඇතුල්වෙන ගමන් ඇහුවා.

"ඔව් දූ... ඒ ළමයට වේලපහින් යන්න ඕන කිව්ව. ඉතිං මං යන්න කිව්වා... පවුනෙ මිනිහට මුලින්ම පඩි හම්බවුන දවසනෙ..."

රත්නායක එහෙම කිව්වෙ මූණට ආව මදහසත් එක්ක. මාලිගාට ඒ වචන පෙළ ඇහෙනවත්එක්කම එකපාරටම රත්නායකගේ මේසෙ ඉදිරිපිට තියෙන පුටුවෙ ඉඳගැනුනා... "ඇයි ඉතිං එයා මං එනකං හිටියෙ නැත්තෙ.?." මාලිගාට තමන්ගෙ හිතින්ම එකපාරටම එහෙම

WWW.EXPRESSLANKA.TK 60

ඇහුනා.

"ඇයි දූ අද වේලපහින් ආවේ...? මාස්ටර් කොහේවත් ගියාද...?" රත්නායක ගේ ප්‍රශ්නෙන් මාලිගාගෙ හිත ටිකක් ගැස්සිලා ගියා වගේ වුනා.

"ඔ... ඔව් අප්පච්චි... මාස්ටර්ට රෙකෝඩියන් එකකට යන්න තියෙනවා කියලා ඉක්මණට ගියා..."

මාලිගා අප්පච්චිට බොරුවක් කිව්වෙ වෙන කියන්න දෙයක් නැති නිසා. ඒත් මාලිගාගේ හිතේ මොකක් හරි කනස්සල්ලක් තියෙන බව රත්නායකට මාලිගාගේ මූණෙන් තේරුණා...

"දූ... අද හවසට අපි නැන්දලගේ ගෙදර යමුද...? හුඟදවසකින් යන්නත් බැරිවුනානේ... රොහාන් පුතත් ලබන සතියෙ විතර ලන්ඩන් වල ඉඳන් එනවයි කියල තියෙනවා..."

රත්නායක ඒ යෝජනාව ගෙනාවේ මාලිගාගේ හිතේ තියෙන කනස්සලු ගතිය මගහරින්න හිතාගෙන... ඒත්...

"අද බැහැ අප්පච්චි... අපි වෙන දවසක යං..."

මාලිගා බිඳුණු හඬින් කියන ගමන් මේසෙ උඩ තියාගෙන හිටපු අත් දෙක අතරේ මූණ හංගගත්තා.

"දූ..! මොකද? ප්‍රශ්නයක්ද...?"

රත්නායක ඇහුවෙ තරමක් කලබල වෙලා වගේ...

"න් නෑ... අප්පච්චි..."

"එහෙනං ඔය මළුව ගහගෙන ඉන්නෙ.?."

"අද මගෙ ඇඟට ටිකක් හරි නෑ..."

"ආ...! මොකද දරුවො මෙච්චර වෙලා කිව්වෙ නැත්තෙ.?. මොකක්ද අමාරුව...?"

රත්නායක එහෙම කියාගෙන පුටුවෙන් නැගිටලා මාලිගා ළඟට ආවා.

"අමාරුවක් නෑ අප්පච්චි... ඇඟට ටිකක් පණ නෑ වගේ".



WWW.EXPRESSLANKA.TK 61

"ඒ මොකද? දූ අපි එහෙනං ඩොක්ටර් අංකල් ළඟට ගිහින් බෙහෙත් ටිකක් ගමු..."

"බෙහෙත් ගන්න ඕන් නෑ අප්පච්චි... ගෙදර ගිහින් ටිකක් රෙස්ට් කරාම හරියයි..."

මාලිගා එහෙම කියලා ඔළුව ඉස්සුවා...

"පිස්සුද..? අපි කෝකටත් බෙහෙත් ටිකක් අරගෙන යං... එන්න දූ නැගිටින්න..."

රත්නායක මාලිගාව අත් දෙකෙන්ම අල්ලගෙන නැගිට්ටුවා. ඒ තරු පොකුරු හිනාව තිබුණ මූණ දන් මැලවිලා... සතුටක සේයාවක්වත තිබුණ පාටක් ඒ මූණෙ නෑ...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

"සිනිදු... ඈ... ඇයි සිනිදු ඔයා මං එනකං ඉන්නැතුව ගියේ...?"

මාලිගාට නොදනීම හිමීට ඒ වචන පිටවුනා. ඒ කෙඳිරිලි හඬ ඇහෙන්න තරම් ළඟපාතක සිනිදු තියා වෙන කවුරුවත්ම හිටියෙ නෑ... වෙල පහින් ඇඳට වැටුනට මාලිගාට නින්ද ගියේ නෑ. පුවපහසු යහනෙ උඩුබැලි අතට වැතිරිලා මාලිගා කල්පනා කළා. මීට පැය කීපයකට කලින් කල්පනා කරල මනස වෙහෙසන්නෙපා කියලා ඩොක්ටර් දුන්න අවවාදය මාලිගාගේ හිතේ තිබුනේ නෑ. මාලිගාගේ ඇස් අගින් ගලාගෙන ගිය කඳුළු වැල් කම්මුල් දිගේ ඇඳ ඇතිරිල්ල උඩට වැටුනා. ....... එක හිතක් මේ විදිහට අසරණ වෙලා තව හිතක් වෙනුවෙන් ලතවෙනකොට ඒ හිත වෙන තැනක තව හිතක් නලවමින් උන්නා...

"මුතු... මං ඔයාට තව බඩ්ඩක් කියන්නද...?"

සිනිදු ඇහුවෙ මුතුට තවත් ලංවෙලා හිමීට වගේ...

"හ්ම්..." මුතු තොල් දෙක පියාගෙන හිනාමූණෙන්ම ඔළුව දෙපැත්තට

වැනුවා.

"අපි ඔයාගේ එක්සෑම් එක ඉවරවුනාට පස්සෙ බඳිමු..?"

සිනිදු කියපු දෙයින් මුතුගේ ඇස් දෙක ලොකු වුනා. මුතුගේ මූණ ලැජ්ජාවෙන් රතුවෙනකොට සිනිදු මුතුගේ අතකින් හිමීට අල්ල ගත්තා. සිනිදුත් එක්ක මිදුලෙ ගල්පඩිය උඩ වාඩිවෙලා හිටපු මුතුගේ මූණ ගස් අතරින් වැටිල තිබුණ හඳ එළියට දිළිසුනා... සිනිදු ඒ ශාන්ත මූණ දිහා බලන් හිටියෙ ආදරෙන් හිත පුරෝගෙන. හවස ගෙදර ආවට පස්සෙ සිනිදුට මුතුව දකිනකම් සිහියක් තිබ්බෙ නෑ... සිනිදු රෑම මුතුව හම්බවෙන්න මාමලාගේ ගෙදරට ආවේ ඒකයි...

"මුතු... එතකොට තමයි අපේ පුංචි ගේ පුංචි කුරුළු කූඩුවක් වගේ ලස්සන වෙන්නේ..."

සිනිදු කිව්වේ මුතුගේ මූණ දිහා ආදරේ උතුරන ඇස් දෙකෙන් බලාගෙන.

"ඒ පුංචි කූඩුවට වෙන කාටවත් ඇතුල් වෙන්න දෙන්නැහැනේ.?."

මුතු ඇහුවේ සුරතලේට වගේ...

"දෙනවා"

"දෙනවා...! ඒ කාටද...?"

"ඇයි ඔයාට හම්බවෙන පුංචි පැටව් ටිකට...?"

සිනිදු කියපුදේට මුතුට එකපාරටම හයියෙන් හිනාගියා... ඒ එක්කම ගල් පඩිය උඩ අයිනෙ තියල තිබුන සිනිදුගේ සෙලියුලර් ෆෝන් එකේ සිනුව නාද වෙන්න වුනා...

"හෙලෝ"

සිනිදු ෆෝන් එක අතට ගන්න කොටම කතා කරන්නේ කව්ද කියල හිතට දැනුනා...

"ඒ... සිනිදු.!."

මාලිගාගේ බිඳුනු හඬ සිනිදුගෙ කන්පතුල් විදගෙන ගියා. ඒ හඬ



WWW.EXPRESSLANKA.TK 63

වෙනද වගේ නෙමෙයි...

"කථා කරන්න"

"සිනිඳු... තරහද මං මේ වගේ වෙලාවක කතා කෙරුවට... ආ...?"

මාලිගාගේ හඬේ තිබුන දුක්බර බව සිනිඳුට දැනුනා...

"අපෝ නැහැ..."

සිනිඳු හිමීට එහෙම කියන ගමන් මුතුගෙ මූණ දිහා බැලුවා... මුතු හිටියෙ අහක බලාගෙන...

"සිනිඳු ... මට අද චුට්ටක් අසනීප වුනානේ..."

මාලිගා ඒ එක්කම කිව්වා...

"අසනීප වුනා.?.!"

සිනිඳුගෙ ඇස් ලොකු වුනා...

"ඔව්... චුට්ටක් වෙන්න..."

"මොකද එකපාරටම වුනේ..?"

"මන් දන්නැහැ... නිකම්ම ඇඟට හරි නැතුව ගියා..."

"ඉතිං බෙහෙත් ගත්තද...?"

"ඔව්... ඩොක්ටර් අත්කල් කිව්වා ටිකක් රෙස්ට් කරන්න කියල... සිනිඳු... ඒක නෙමෙයි, ඔයා සඳුදා උදෙන්ම එනවා නේද ඩ්‍රයිවින් ලයිසන් එකට ඉන්ටර්විව් යන්න..? ආ...?"

"ඒක පස්සෙ පුළුවන්... ඉස්සෙල්ලාම දන් ඔයා සනීප වෙලා ඉන්න..." සිනිඳු මාලිගාට "ඔයා" කියල තියනකොටම මුතුට සිනිඳුගේ මූණ දිහා බැලුනෙ ඉබේටම... ඒ එක්කම මුතුගේ පපුව ඇතුලෙ විදිල්ලක් කෙටුව වගේ වුනා...

"ඔයාට පිස්සුද..? මට දන් සනීපයි..."

මාලිගා ඒ එක්කම කිව්වා...

"සනීපයි...?!"

"ඔව්... ඔයත්තෙක්ක කතා කලාම ඔක්කොම ලෙඩ හොඳවුනා..."

මාලිගා සතුටින් වගේ කිව්වෙ... ඒ වචන වැලත් එක්කම සිනිඳුගේ


WWW.EXPRESSLANKA.TK 64

මුළු ඇඟම හිරි වැටිගෙන ගියා...

"මේ... එහෙනං ඔයා සඳුදා ඔෆිස් යන්නැතුව කියපු විදිහට කෙළින්ම මෙහාට එන්න. හොඳේ... ඔන්න මං බලාගෙන ඉන්නව හොඳද...?"

"හ්ම්... හ්ම්..."

සිනිදු එහෙම කිව්වෙ කතාව තව දිගහැර ගන්න ඕන කමක් නැති නිසා... එත්...

"සිනිදු මේ චූටි මල්ලියි අත්තම්මයි ඔතන ඉන්නවද.?."

මාලිගා අහපු දෙයින් හිරිවැටිල වගේ තිබුණ සිනිදුගේ මුළු ඇඟම එකපාරටම පණ නැති වෙලා වගේ ගියා.

"ආ...හ්..' මං මේ ගෙදර නෙමෙයි ඉන්නේ..."

"එහෙනං...?"

"යාළුවෙක්ගෙ දිහාවේ..."

සිනිදු ඒ බොරුව කියනකොටම මුතුට ආයෙමත් සිනිදුගේ මූණ දිහා බැලුනා... ඒත් සිනිදුගෙ ඇස් තිබුනේ මුතු දිහාවට නෙමෙයි...

"මොන යාළුවෙක්ද...?" කතාව තවත් දිග ඇදිගෙන ගියා...

"අඹ යාළුවෙක්!.."

"ඇත්තද..? එහෙනං ඒ යාළුවට කියන්න මං මතක් කළා කියල... රයිට්..."

"හ්ම්..."

"මේ... එහෙනං මං තියන්නද...?"

"හා.!." සිනිදුට කියවුනේ එකපාරටම.

"මං එහෙම අහනකං බලන් හිටියා නේද...?"

සිනිදු නිරුත්තර වුණා.

"සිනිදු විහිළුවට කිව්වෙ... එහෙනං මං තියන්නං... බුදුසරණයි..."

සිනිදු සෙලියුලර් එක ආයෙමත් ගල්පඩිය උඩින් තියල මුතුගෙ මූණ දිහා බැලුවා. මුතු හිටියේ අහක බලාගෙන. සිනිදුට මුතුගෙ



WWW.EXPRESSLANKA.TK 65

වෙනස පෝර්දම ගන්න අමාරු වුණේ නෑ...

"මුතු... ඒ මාලිකා ගැන කොරුණු..."

සිනිදු මුතුට ඇහෙව්වා කිව්වා...

"මං දන්නවා..." මුතු උත්තර දුන්නේ හෝඩිකොටුව පමණින් කෝපිට අතක බලාගෙනමයි

"ඇයි මොකද ඔය තරම හිතිල්ලා වගේ..? මුතු !"

සිනිදු මුතුගේ නියපොත් අල්ලල මුතුගේ මූණ සම්පූර්ණයෙන් තමන්ට හරව ගන්නාගෙනමයි...

"එයා මාන්චෙස්ටර ගැන කැරුවා..!" මුතු කිව්වේ කැඩුම්බිඳුමට.

"ආ..! ඒ මොකද...?"

"ඇයි ඔයා මාලිකාට යාළුවෙන්න ගෙදර යනකොට කියලා කොහොමද කිව්වේ..?"

මුතු එකෙනම ආයුරුවම සිනිදුගේ හිත ගැස්සිලා ගියා. ලැජ්ජාව පලම වෙච්චිලා පසුතැවිලා ගියාන ඔව් සිනිදුගේ හිත කිව්වා.

"මං එයාට ඒ කොහොමද කිව්වට කැමැත්තකින් නෙවෙයි... ඒත් මං එයාට මාලිකා ගෙදර ආවයි කිව්ව නම් එයා ඔහොම තරහින් ලේඩිල් ඇනෙනා කියන..."

සිනිදු කිව්වේ මුතු දිහා බලාගෙන නෙවෙයි. අහස ලස්සනට බෝල්ලුවෙන එන කඳ දිහා බලාගෙන.

"ඉතිං ඇහුවම කියනවාමනේ... මොකටද ඉතිං එයාට කොහොමද කියන්නේ...?"

මුතුගෙ කැඩුම්බිඳුම් ගතිය තව වැඩිවුණා.

"මට එහෙම කියන්න බෑ"

"ඇයි ඒ...?"

"මං දන්නැහැ..." සිනිදුට හිනිව කියවුණා.

"මං දන්නවා..!"

"මොනාවද ඔයා දන්නේ..?"

සිනිදු එකපාරටම මුතුගෙ පැත්තට හැරිලා ඇහුවා. මුතු දණහිස උඩ තියාගෙන හිටපු අත්දෙකේ මූණ ඔබා ගත්තා. ඊට පස්සෙ ඇහුනෙ මුතුගෙ ඉකිගසන හඬ...

"කියනව ඉතිං දන්නෙ මොනවද කියල...?"

සිනිදු ඇහුවෙ තරමක් තරහින් වගේ. ඒත් මුතු උත්තර දුන්නෑ.

"මුතු එහෙනං ඔයාට දැන් මාව සැකද...? ආ...? කියන්න... මට දැනගන්න ඕන එච්චරයි..."

සිනිදු දනිස්ස උඩ තියාගෙන හිටපු මුතුගේ අතකින් අදින ගමන් ඇහුවා... ඒත් මුතු තමන් ඉන්න ඉරියව්ව වෙනස් කළේ නෑ. සෙල් පිළිමයක් වගේ නිහඬව හිටියා. ඒ එක්කම සිනිදුගේ හිතේ තිබුණ නොසන්සුන්කම, වේදනාව කෝපයකට හැරෙන්න තව වැඩි වේලාවක් ගියේ නෑ...

"මුතු එහෙනං ඔයා හිතන්නෙ මං වරදක් කළා කියලද?... කමක් නෑ... එහෙනං වරදක් කරපු කෙනෙක් නිවැරදි කාරියක් ළඟ ඉන්න ඕනි නැතේ..."

සිනිදු වාඩිවෙලා හිටපු ගල්පඩිය උඩින් නැගිට්ටා. මුතු ඒත් ඔළුව ඉස්සුවෙ නෑ... ටික වේලාවකින් ඉස්සරහ ගේට්ටුව හයියෙන් වැහෙන හඬ මුතුට ඇහුනා...



WWW.EXPRESSLANKA.TK 67

# 06

සිතිදු ඊළඟ සතියේ නුවර ආවම මුතුව බලන්න ගියේ' නෑ. ගෙවුන සතියේදී මුතු සිතිදුලගෙ ගෙදරට ඇවිල්ල තිබුනෙත් නෑ. ඒත් මුතු කොළඹ ඉන්න සිතිදුගෙ සෙලියුලර් ෆෝන් එකට කතා කරන්න හැදුවා. සිතිදු ඒ හැම වෙලාවකම මුතුගෙ හඬ ඇහෙනවත් එක්කම දුරකථනය විසන්ධි කළා... විස හී සැරයක් පපුව හරහා යනව වගේ ඒ හැම වෙලාවකම මුතුව දැනෙනකොට... සිතිදුගේ හිත ගලක් වෙලා තිබුන නෙමෙයි, ඒත් තමන්ගෙ පණටත් වඩා ආදරය කරපු පෙම්වතියට එක පුංචි සිදුවීමක් නිසා තමන්ව මේ විදිහට සැක කරන්න පුළුවන් වුනානම්..? සිතිදුගෙ හිත ඇතුලෙ හැම මොහොතකම හොල්මන් කළේ ඒ සිතුවිල්ල...

මේ හැම දෙයක්ම සිදුවුනේ මොකක් නිසාද...? කව්රු නිසාද..? සිතිදු කල්පනා කළා. අහස පොළොව ගැටගහගන්න බැරුව වගේ කල්පනා කෙරුවා. ඒත්... ඒ අතරෙ මේ කිසිම දෙයක් නොදන්න දෙව්දුවක් තාමත් තමුන්ගේ මනෝ මාලිගාවේ සිහින කුමරු ළඟ නොදරුවෙක් වෙලා... දවටිලා ඉන්න පෙරුම් පුරනවා...

"සිතිදු ! අද ඔයා ඩ්‍රයිව් කරන්න"



WWW.EXPRESSLANKA.TK 68

මාලිගා පෝටිකෝව යට හිටපු සිනිදු ළඟට එන ගමන් කිව්වා. සිනිදු එතකොට හිටියේ පාර දිහා බලාගෙන.

"ම්... හ්... මට බෑ !.."

මාලිගා දිහා බලපු සිනිදුට එකපාරටම කියවුනා.

"බයවෙන්න එපා... ඔයාට දත් ලයිසන් එක එනකම් පර්මිෂන් කාඩ් එකක් තියෙන්නෙ.!."

"ඒ වුනාට බෑ... මං බස් එකේ යන්නම්..."

"පිස්සා...! නගිනව ඉතිං ඔය පැත්තෙන්..."

මාලිගා එහෙම කියාගෙන බොරුවට රවල වගේ බලලා ඩ්‍රයිවින් සීට් එක පැත්තෙ දොරෙන් ඇතුල් වුනා. ඒත් සිනිදු කාරෙකට නගින්නැතුව ඉස්සරහට ගියා. මාලිගා කාරෙක පනගන්වගෙන පිටිපස්සෙන් ඇවිත් ඉස්සරහට ඇදෙන සිනිදුගෙ අයිනටම කරල නතර කෙරුවා.

"සි...නි...දු...!"

සිනිදුට මාලිගා දිහා බැලුනෙ ඉබේටම... බෙල්ල ඇල කරගෙන ඇස් පුංචි කරගෙන බලන් ඉන්න හැටි... සිනිදු ඒ හඬට අවනත වුනා නෙමෙයි, ඒත් ඇරල තියෙන ඉස්සරහ වම් දොරෙන් සිනිදු ඉබේටම වගේ කාරෙකට ඇතුල් වුනා.

"නපුරා...!"

මාලිගා කාරෙක ආයෙමත් පනගන්වන ගමන් සිනිදුගෙ මූණ දිහා බලල විරිත්තල වගේ කිව්වා. මාලිගා ඒ වචනෙ පිටකරපු විදිහට සිනිදුට හිනායන්න ආවා. ඒත් ඒ බවක් සිනිදුගෙ මූණෙන් එළියට ආවෙ නෑ... දෙන්නා අතරෙ වැඩි කතා බහක් නැතුව කාරෙක ටික දුරක් ආවට පස්සෙ...

"ආ...! සිනිදු... මේ මට තව පොඩ්ඩෙන් අමතක වෙනවා..."

මාලිගා එකපාරටම සිනිදුගෙ මූණ දිහා බලලා එහෙම කියනවත් එක්කම සිනිදු මාලිගා දිහා බැලුවා.

"මේ... ඔයාට අද හවසට අපිත් එක්ක පොඩි ගමනක් යන්න



WWW.EXPRESSLANKA.TK 69

තිනවා..."

"ගමනක්...?"

"ගමනක් නෙමෙයි... පොඩි පාටි එකක්..."

"පාටි එකක්?..."

සිනිදු ඇහුවෙ මූණෙ හිනාපොදක්වත් නැතුව

"ඔව් අපේ නැන්දලගෙ ගෙදර තින්නෙ... එයාගෙ පුතා ලන්ඩන් වල ඉඳන් ආවනේ ග්‍රැජුවට් කෙනෙක් වෙලා... ඒකට..."

මාලිගා හිනාවෙලා කිව්වා. ඒත් ඒ හිනාවේ තිබුනේ තමන් කියපු දේ ගැන ප්‍රසාදජනක හැඟීමක්ම නෙමෙයි.

"ඉතිං මං මොකටද ඒකට යන්නේ.?."

"ඔයා යන්නෙ අපිත් එක්ක"

"මට බැහැ..." සිනිදු අහක බලාගෙන කිව්වා.

"ඇයි...?"

"බැරි හින්දා..." සිනිදු එහෙම කිව්වම මාලිගාට හිනා ගියා.

"ඔයාට බැමද..?"

"ඔව් !.."

"හ්ම්... කමක් නෑ... තරහ නෑ හොඳේ..."

මාලිගා එහෙම කියල සිනිදු දිහා බලලා හිනාවුන විදිහට සිනිදුව හොල්මන් වුණා. සිනිදු හිතුවෙ තමන්ගෙ අකමැත්ත ගැන මාලිගාගේ හිත රිදිල අමනාප වෙයි කියලා... ඒත් එහෙම වෙලා නෑ... මාලිගාගෙ මූණ හිනාවෙන් පිරිලා... ඇත්තටම කෙල්ලන්ව තේරුම් ගන්න ලෙහෙසියෙන් පුළුවන්ද..? හරියට ජපානෙ කාලගුණේ වගේ කෙල්ලන්ගෙ හිතුත්...

මාලිගා සිනිදුව ඇඩ්වටයිසින් ෆර්ම් එක ළඟින් දාලා ආපහු කාරෙක හරවගෙන දෙහිවල පැත්තට ආවා. අද මාලිගා සිනිදුව ඔෆිස් එකට දාන්න ආවේ රත්නායක උදේ පාන්දරින්ම වෙන ගමනක් ගිය නිසා. ඒත් සිනිදු කාර්යාලයට ඇවිත් වැඩි වෙලාවක් ගියෙ නෑ... දුරකථන ඇමතුමක් ආවා රත්නායකගෙන්...



WWW.EXPRESSLANKA.TK 70

"සිහිදූ... පුතා අද තුනවෙනකොට වැඩ නවත්තන්න... ඔයාට අපිත් එක්ක පොඩි පාටි එකකට යන්න තියෙනවා..."

රත්නායක කියපු දේ කන්පතුල්වල වදිනකොට සිහිදූගෙ මුළු ඇහම පණ නැතිවෙලා වගේ ගියා. මාලිගාගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කලාට රත්නායකගේ තීරණයට පිටුපාන්නේ කොහොමද..?

"පුතාට මාලිගා කිව්ව නේද පාටි එක මොකක්ද කියලා..?"

"ඔ... ඔව්... සර්..."

"එහෙනං පුතා මං තුන වෙනකොට වාහනේ එවන්නං... රයිට්..."

සිහිදූ රිසීවරය තියල නළලට ආව දාඩිය බිංදුටික ලේන්සුව අරගෙන පිහිදුවා. පාටියට යන්න බැහැ කිව්වම මාලිගා අමනාප නොවුන හේතුව සිහිදූට දන් තේරුම් ගන්න පුළුවන්...

❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈

රෑ හත වෙනකොට රොහාන් වැලිවිටලගේ ගෙදර පාටිය පටන් අරගෙන තිබුණා. ටයි කෝට් දාපු අය වැහි වැහැලා... පාටියට කාන්තා පාර්ශවයේ සමහරු ඇවිත් ඉන්නේ හරියට චිත්‍රපටියකට අඩනිරුවත් ජවනිකාවල් රඟපාන්න වගේ ඇඳුම් ඇඳගෙන... සමහර කෙල්ලන්ගෙ ඇගේ ඇඳුම් හරියට නැ වගේ... ඒත් ඒ අතරෙම තවත් එක් රුවැත්තියක් ලස්සන රෝසපාට සාරියකින් සැරසිලා හැමෝගෙම ඇස්වලට අහුවෙමින් උන්නා... මාලිගා තරු පොකුරු හිනාවෙන් මූණ පුරෝගෙන නැන්දත් එක්ක බර කතාවකට වැටිලා... පිරිමි හැමෝම මේස වලට වටවෙලා වීදුරුවල බීම පුරෝගෙන සතුටු සාමීචියේ යෙදිල ඉන්නවා. ඒත්... සිහිදූ උන්නේ සැණකෙලියක් වගේ විදුලි බුබුළු දැල්වෙන රොහාන්ලගේ විශාල මිදුලෙ කෙළවරක තිබුන මේසෙක තනිවෙලා... හිනියට ඇහෙන බටහිර සංගීතේ රිද්මය සිහිදූගෙ හදවතට දනුනෙ නෑ... සිහිදූ දෙනෝදාහක් අතර තනිවෙලා උන්නා. තම තමන්ගේ නොවන ජෝඩු එකට අත්වැල් අල්ලගෙන නටන හැටි



WWW.EXPRESSLANKA.TK 71

සිනිදුට පෙනුනා. කලකිරීම, පසුතැවීම, දුක, පාළුව ටිකෙන් ටික හිත ඇතුලෙ පිරෙනකොට...

"සිනිදු ඔයාට පාළු හිතුනද..?"

මාලිගා ඇහුවෙ ආයෙමත් සිනිදු ළඟට ඇවිත් වාඩිවෙන ගමන්. සිනිදු මොකුත් නොකියා තරහෙන් වගේ අහක බලාගෙන උන්නා.

"ආන්ටිත් එක්ක කතාවට අහුවුනා... පව් සිනිදු අපේ ශීලා ආන්ටි හරි හොඳයි... අපේ නෑයින්ගෙන් එයා තමයි මට හුඟක් ආදරේ..."

මාලිගා සිනිදුගේ මූණ දිහා බලාගෙන හිනාමුණෙන් ඔහේ කියවගෙන යනවා... ඒත් මාලිගා උඩින් හිනාවුනාට ඇත්තටම මාලිගාගේ හිත ඇතුළෙත් සතුටක් තිබ්බෙ නෑ. සිනිදු මාලිගා කියන දේවල් ඇහෙන්නැතුව වගේ වෙන දිහාවක් බලාගෙන ඉන්නකොට. මාලිගාට තමන්ගේ හිත ඇතුල සියුම් පිහි තුඩකින් සිදුරු කරනවා වගේ දැනීගෙන ගියා.

"සිනිදු... ඇයි ඔයා කතා නැතුව ඉන්නේ...? මාත් එක්ක තරහද ආ...?"

මාලිගා ඇහුවෙ අසරණ විදිහට. සිනිදුට මාලිගාගෙ මූණ දිහා බැලුනා...

"වරදක් කරල දැන් බොරුවට තරහද කියල අහන එකේ තේරුමක් නැහැනේ..."

"මට සමාවෙන්න සිනිදූ... මං දන්නව ඔයාට මේ ගමන එන්න වුනාට ඔයා මාත් එක්ක තරහවෙන් නේද ඉන්නෙ.?. මං තමයි අප්පච්චිට කිව්වෙ ඔයාව මේ ගමනට කොහොම හරි එකතු කරගන්න කියල. ඔයා දැන් හිතනව ඇති මං මහ කපටි කෙල්ලෙක් කියලා නේද?. මං ඔයාව මේ ගමනට එකතු කරගත්තෙ මමත් තනියම ආවනම් මෙතන තනිවෙන හින්දා... මාත් කැමති නෑ සිනිදු මේ වගේ පාටිවලට

WWW.EXPRESSLANKA.TK 72

එන්න..."

මාලිගා කියවගෙන ගියා. සිනිදු ඒ කියන දේවල් අහන් හිටියෙ කලින් වගේ ඕනවට එපාවටම නෙමෙයි.

"සිනිදු... මං මීට පස්සෙ ඔයාට මේ වගේ ගමන් එන්න කරදර කරන්නැහැ හොඳද... අදට මට සමාව දෙන්න... දෙනවද ? ආ.?."

මාලිගාගේ දුක්බර හඬ සිනිදුගෙ පපුව හිල් කරගෙන ඇතුළට ගියා. ඒත් ඒ බවක් සිනිදුගේ මූණෙන් එළියට පෙනුනෙ නෑ. මේ අසරණ හිතට, අහිංසක මූහුණට තවත් නපුරුකම් කරන්නෙ කොහොමද...? සිනිදුගෙ හිත කිව්වා. එනකොටම...

"මාලිගා ! අයියෝ ඔයා මොකද මෙතන කරන්නෙ...? බලන්නකො අර කට්ටිය ඩාන්ස් කරනවා. එන්නකො යන්න ඩාන්ස් කරන්න..."

රොහාන් එකපාරටම ඇවිත් මාලිගාගේ අතකින් අල්ල ගන්න ගමන් කිව්වෙ. මාලිගා රොහාන් දිහා බැලුවෙ ගැස්සිලා වගේ.

"අනේ සොරි රොහාන් අයියා... මං ඩාන්ස් කරන්නෙ නැහැනෙ..."

"ඩාන්ස් කරන්නැහැ.?.!"

"ඔව්..."

"ම්..! මාලිගා ඔයා කොළඹ කෙල්ලෙක් නේද...?"

"ඔව්... ඒ වුනාට මං සිංහල කෙල්ලෙක් රොහාන් අයියෙ..."

"ඉතිං සිංහල කෙල්ලො නෙමෙයිද අතන ඩාන්ස් කරන්නෙ..?"

"ඒ වුනාට එතන කැන්ඩියන් ඩාන්ස් නෙමෙයිනේ නටන්නේ..?"

මාලිගා කියපු දේට රොහාන්ගේ මූණ ලැජ්ජාවෙන් , රතුවුනා. එංගලන්තෙ ඉන්න කොට සුපිරි පන්තියේ සුදු කෙල්ලන් එක්ක බෝල් රූම් ඩාන්ස් දාපු තමන්ට තමන්ගෙ එකම නෑනා... අනාගතයේ බඳින්න හිතාගෙන ඉන්න සහකාරිය මෙහෙම කතා කරයි කියල රොහාන් හිතුවෙ නෑ... රොහාන් සිනිදු දිහා ඔරවලා වගේ බලලා ආයෙමත් මාලිගා දිහා බැලුවා.

"එහෙනං ඔයාට බැනේ ?."

"සොරි රොහාන් අයියා"



WWW.EXPRESSLANKA.TK 73

රොහාන් තව තත්පරයක්වත් එතන හිටියෙ නෑ. විදිල්ලක් වගේ එතනින් පිටවෙලා ගියා. සිනිදු මාලිගාගේ මූණ දිහා බලන් උන්නෙ පුදුමයෙන් වගේ. ඒ මූණෙ එතකොට තිබුනෙ කෙල්ලෙකුට උරුම වුන අහිංසකකම විතරක් නෙමෙයි... කෙල්ලක් තුළ තියෙන්න ඕන තමන්ගෙ ආත්ම ගෞරවය රැකගැනීමේ අධිෂ්ඨානය ඒ ඇස්වල තියෙනවා සිනිදුට පෙනුනා. මාලිගා සිනිදුගෙ ඇස් බැල්ම දරාගන්න බැරුව වගේ බිම බලාගත්තා. ඒත් දෙන්නට වැඩි වෙලාවක් එහෙම එක විදිහට ඉන්න ලැබුන් නෑ... කොහේද ඉඳන් ආව පුෂ්ටිමත් ඇඟක් තියෙන මූණ පුරා රැවුල වවාගත්තු එකෙක් එකපාරටම සිනිදුයි මාලිගයි ඉන්න මේසෙට තිබුන අනිත් පුටුවෙ ඇවිත් වාඩිවුනා... මාලිගාටයි සිනිදුටයි ආයෙමත් මූණට මූණ බැලුනෙ ඉබේටම...

"ආ... මල්...ලී ඔයා අපේ රොහාන් බොස්ගෙ යාළුවෙක්ද.?. ම්...?"

ඒ මිනිහා සිනිදුගේ පිටට අතතියල එහෙම අහපුවම සිනිදුව එකපාරටම කරකවල අත ඇරිය වගේ වුනා...

"එයා රොහාන් අයියගේ යාළුවෙක් නෙමෙයි. එයා ආවේ මාත්තෙක්ක..."

සිනිදු කතා නැතිව නිරුත්තර වෙනකොටම මාලිගා සිනිදු වෙනුවෙන් කතා කෙරුවා.

"මැඩම් එක්ක... හි... හ්... හිහ්... ඇත්තද... ම්...?"

"ඔව්.!. ඉතිං ඔයාට මොකද...?"

මාලිගා එහෙම ඇහුවෙ මූණ රතුකරගෙන. සිනිදු කේන්තියෙන් හිත පුරෝගෙන ඒ මිනිහ දිහා බලන් ඉන්නවා.

"මට මුකුත් නෑ මැඩම්... හැබැයි මෙතන්ට ඉන්වයිට් කරපු අයට විතරයි අපේ රොහාන් බොස් කෑම බීම ඔඩර් කරල තියෙන්නෙ... හිහ්... හිහ්... ඒකයි..."

ඒ වාචාල වචන පෙළ ඇහෙනවත් එක්කම සිනිදුට වාඩිවෙලා හිටපු පුටුවෙන් නැගිටුනා. හිතන්න වෙලාවක් තිබුන් නෑ... සිනිදු දිහා බලපු මාලිගාටත් පුටුවෙන් නැගිටුනේ ඉබේටම...

"සිනිදු!"

සෙනහ අතරින් වේගයෙන් ඇදිලා යන සිනිදු ඒ හඬට ඇහුම්කන් දුන්නෑ... වෙනද වගේ ඒ හඬට හැරිල බලන්න උවමනාවක් සිනිදුට නෑ. තමන් දිහා කවුරු බලන් ඉන්නවද කියල දෙන්නටම දැනුන් නෑ. සිනිදු රොහාන් වැලිවිටලගේ වත්තෙන් පිටවුනා. මාලිගා සිනිදුගෙ පිටිපස්සෙන් ගේට්ටුව ළඟටම ආවා...

"සිනිදු! ප්ලීස් නවතින්න..!"

සිනිදු නැවතුන් නෑ... මහ පාරේ සිනිදු වේගයෙන් ඉස්සරහට ඇදුනා. ඒත් සිනිදුට වැඩිදුරක් යන්න මාලිගා ඉඩදුන් නෑ... සීතල අත්දෙකකින් සිනිදුගෙ වම් අත තදින් ඇල්ලුනා...

"සිනිදු!"

සිනිදු මාලිගාගේ මූණ බැලුවා. පාරේ ලයිට් එළියට ඒ මූණ පැහැදිළිව පෙනුනා. ඒ 'තොල්පෙති වෙව්ලනවා. මාලිගා වේගයෙන් හුස්ම ඉහළ පහළ දැම්මා.

"සිනිදු... මට සමාවෙන්න... මං හින්දයි ඔයාට ඒ මිනිහගෙන් එහෙම දෙයක් අහන්න වුනේ... සිනිදු ඔයා මාත්තෙක්ක තරහෙන් නේද ඉන්නෙ...? ඔයාගේ ඒ කේන්තිය පිටකරගන්න සිනිදු, ගහන්න... ගහන්න. මේ කම්මුලට ආ..."

මාලිගා වම් කම්මුල සිනිදුගේ පැත්තට හැරෙව්වා. ඒ එක්කම අල්ලගෙන හිටපු සිනිදුගේ අත මාලිගාගේ අත්දෙකෙන් අත ඇරුනා. මාලිගාගේ ඇස්වලින් කඳුළු බේරෙනවා... සිනිදු ඒ කඳුළු බේරෙන මූණ දිහා බලන් හිටියෙ හරියට අම්ම කෙනෙක් අඬනකොට හය හතර නොතේරෙන පුංචි දරුවෙක් ඒ අම්මගෙ මූණ දිහා බලන් ඉන්නව වගේ... තව දුරටත් ගලක් කරගෙන හිටපු තමන්ගේ හිතට එහෙම ඉන්න දෙන්න සිනිදුට පුළුවන් වුන් නෑ. ඒ ගලක් වුන හිත දියවෙලා, කඳුළු වෙලා ඇස් අග්ගිස්සට එන්න පෙරුම් පුරනකොට...

"මාලිගා... මට සමාවෙන්න"

ජීවිතේ පළවෙනි වතාවට සිනිදුගේ කටින් මාලිගා කියන නම



WWW.EXPRESSLANKA.TK 75

පිටවුනා...

"ඔයා වරදක් කලේ නෑ මාලිගා... මං ඔයත් එක්ක තරහ නෑ... ඒ වුනත් මට එතන ඉන්න බෑ. මං බංගලාවට යන්නම්... ඔයා අප්පච්චිත් එක්ක පාටි එක ඉවර වුනාම එන්න... යන්න... ඔයාට හොඳ නෑ මෙහෙම ඉන්න එක..."

තාප්පෙන් එහා පැත්තෙ හිටපු අය මුළු ලෝකෙම පෙරළුනත් දන්නැති ගානට සතුටු වෙවී මත්වෙනකොට මාලිගායි සිනිදුයි කවුරුවත් නැති පාළු මහපාරේ තනිවුනා... ඒත් මාලිගාට පාළුවක් දැනුනේ නෑ... සිනිදුගේ දයාබර වචන... ජීවිතේ පළවෙනි වතාවට අහපු ඒ දයාබර ඇමතීම... මාලිගාගේ හිත ආදරෙන් පිරෙව්වා...

"සිනිදු, මටත් එතන ඉන්න බැහැ... ඔයා ඔහොම ඉන්න, මං අප්පච්චිට කියල කාරෙක අරගෙන එන්නම්.!. අපි දෙන්නා ගෙදර යං..." මාලිගා එහෙම කියන ගමන්නම යන්න හැරුනා...

"පිස්සුද ඔයාට.?."

මාලිගා හැරිල බැලුවෙ නැහැ. සිනිදු ලතාවකට දුවගෙන යන මාලිගා දිහා බලන් හිටියේ විශ්මයෙන්... රෝසපාට සාරියකින් සැරසිලා කළුවර අතරින් දුවගෙන ගිය මාලිගාව සිනිදුට පෙනුනෙ හරියට පාවෙලා යන දෙව්දුවක් වගේ... දෙන්නගෙම ඇස්වලින් දෙන්නටම පේන්න කඳුළු ආව මේ මොහොත...! දෙවියනි, එළියට එන්නැතුව හිත ඇතුළෙ තියෙන ආදරේ කොයිතරම් මිහිරිද...?

මාලිගාට කාරෙක අරන් එන්න වැඩි වෙලාවක් ගියේ නෑ. වේගයෙන් ආපු කාරෙක සිනිදු ළඟට ඇවිත් නතර වුනා. ඒ එක්කම ඉස්සරහ වම් පැත්තෙ දොර ඇරුනා. ඒත් සිනිදු ඒ දොරෙන් ඇතුල් වෙන්නැතුව අයෙමත් දොර වැහුවා. මාලිගා සිනිදු දිහා බැලුවෙ පුදුම වෙලා.

"ඇයි ?" නගින්න..."

මාලිගා ආයෙමත් ඒ දොර ඇරියා

"මිහ් !.. ඔයා මේ පැත්තට එන්න... මං ඩ්‍රයිව් කරන්නම්..."

WWW.EXPRESSLANKA.TK 76

"ආහ්.!."

සිනිදු කියපු දේ මාලිගාට එකපාරටම අදහන්න බැරිවුනා. "දෙවියනි, මේ උදේ හිටපු සිනිදුමද...?" මාලිගාගෙ හිත මාලිගාගෙන්ම ඇහුවා ... ඒ එක්කම මාලිගා ඉබේටම වගේ වම් පැත්තේ සීට් එකට මාරුවුනා. සිනිදු දකුණු පැත්තේ දොරෙන් කාරෙකට ඇතුල්වෙනකොට මාලිගා සිනිදු දිහා බලන් හිටියේ ඇස්දෙක විශ්මයෙන් පුරෝගෙන. සිනිදු කාරෙක පනගන්වන ගමන් මාලිගාගේ මූණ දිහා බැලුවා. ඒ මූණ වෙනදටත් වැඩිය ලස්සනයි. හරියට මහ වරුසාවකට පස්සේ පායන සඳ වගේ... සිනිදු හිනාවුනා... මාලිගාගේ උගුරෙන් වෙනදවගේ එකපාරටම වචන එළියට ආවෙ නෑ... ඒත් අර ආත්මීය තරු පොකුරු හිනාව ඒ මූණේ සිත්තම් වෙලා... කාරෙක වේගයෙන් හයිලෙවල් පාර දිගේ නුගේගොඩ පැත්තට ඇදුනා. රෑ නමය විතර වෙලා තිබුන නිසා පාරේ වැඩිපුර වාහන තිබුන්නෑ... තේරුම් ගන්න බැරි නුහුරු රස හැඟුම් ගොඩකින් මාලිගාගේ හිත පිරිලා. සිනිදු කාරෙකේ වේගය තවත් වැඩි කෙරුවා... එනකොටම...

"සිනිදු ටිකක් හිමීට යං!"

"ඇයි බයද...?"

සිනිදු හිනාවෙලා ඇහුවෙ මාලිගාගේ ඇස්වලට එබිලා.

"ඔව් !.."

"ඇයි...?"

"අපි දෙන්නට මොනාහරි වුනොත්?.."

"බයවෙන්නෙපා, ඔයාට මොකුත් වෙන්නෑ... මොනහරි වුනොත් වෙන්නෙ මට..."

"ඉතිං ඔයාට එහෙම වුනොත් මං?"

මාලිගාට එකපාරටම කියවෙන්න ගියපු දේ මාලිගා ආයෙමත් ගිලගත්තා. සිනිදු මාලිගා දිහා බැලුවා. ඒ එක්කම කාරෙකේ වේගය බාලවුනේ ඉබේටම.

දෙන්නගේම හදවත් ගැහෙන හඬ දෙන්නටම දැනුනා. ඊට පස්සේ



WWW.EXPRESSLANKA.TK 77

කාරෙක මාලිගාලගේ වත්තට එනකම්ම දෙන්න අතරේ කතා බහක් ඇතිවුනේ නෑ. දෙන්නට දෙන්න ආයෙමත් මූණට මූණ බැලුවෙ කාරෙක පෝටිකෝව යටට ඇවිත් නතර වුනාට පස්සෙ...

"සිනිදු ඔයාට දන්ම නිදියන්න යන්න ඕනිද...?"

මාලිගා කාරෙකෙන් බහින්නැතුවම ඇහුවා.

"ම්... හදිස්සියක් නෑ... ඇයි ?"

"අපි අප්පච්චි එනකං ගාඩ්න් එකට වෙලා කතා කර කර ඉමු...?"

"හ්ම්..."

දෙන්නම කාරෙකෙන් බැහැල මිදුලෙ කෙළවරක තියෙන සුදු ගල් බංකුවට ඇවිත් වාඩිවුනා. ඊට පස්සෙ ආයෙමත් දෙන්නටම මූණට මූණ බැලුනා.

"අද ලස්සනට හඳ පායල තියෙනවා නේද...?"

මාලිගා හිනාවෙලා ඇහුවා.

"හ්ම්..."

"ඇයි හ්ම් ගාන්නෙ...? මුකුත් කියන්න බැයිද ඒ ගැන.?."

"පුළුවන්..."

"එහෙනං කියන්න බලන්න?"

මාලිගා බෙල්ල ඇල කරල ඇස් පුංචි කරගෙන කිව්වා.

*"ඉස්සර වාගේ*
*හඳ ලස්සන නෑ*
*නුඹ මා ළඟ නැති*
*පසළොස්වකදා..."*

"අයියෝ... ඔක සිංදුවක්නෙ !"

මාලිගා කිව්වේ හයියෙන් හිනාවෙලා.

"සිංදුවක් තමයි... ඇයි...?"

"මං කිව්වේ ඔයාගේම සංකල්පනාවක් කියන්න කියලා..."

"අපෝ එහෙම කියන්න බැහැ..."

WWW.EXPRESSLANKA.TK 78

"ඇයි ඒ.?."

"සංකල්පනා කියන ඒවා එහෙම අපිට ඕන ඕන වෙලාවට පහලකර ගන්න බැහැ. ඒවා ඉබේටම පහළ වෙන්න ඕන..."

"ඇත්තට...?"

මාලිගා හිනාමුනෙන්ම ඇහුවෙ සිනිදුගෙ මූණට එබිල ඇස් ලොකු කරගෙන. මාලිගාගේ හිත සතුටින් පිරිල බව සිනිදුට දැනුනා. ඒ සතුට චුට්ටක්වත් නැතිකරල දාන්න සිනිදුට ඕනකමක් නෑ.

"මේ... සිනිදු..."

මාලිගා සිනිදුගෙ මූණ දිහා බලාගෙන ආයෙමත් මිමිණුවා.

"ම්.?."

"මට ඔයාට බඩ්ඩක් කියන්න තීනවා..."

"බඩ්ඩක්?"

"ඔව්"

"මොකක්ද...?"

"ම්... හදිස්සියක් නෑ... මං ඒක පස්සෙ වෙලාවක ඔයාට කියන්නං..."

"මට පරක්කුවක් නෑ... ඔයා දන්ම කියන්න... මං අහන් ඉන්නං..."

සිනිදු හිනාවෙලා කිව්වෙ... මාලිගා හිනාවුනා. ඒ ශාන්ත හිනාවට සිනිදුගෙ මුළු ආත්මයම සුවපත් වෙලා ගියා වගේ දැනුනා. මාලිගා කියන්න යන්නෙ මොනවගේ දෙයක්ද කියල හිතලා සිනිදුගෙ හිත වෙනද වගේ කලබල වුනේ නෑ... මාලිගා කියන ඕන දෙයක් අහගෙන ඉන්න සිනිදුගෙ හිත අද සූදානම් වෙලා...

"ඉතිං කියන්න"

සිනිදු මාලිගාගේ ඇස් මග හරින්නැතුව ආයෙමත් කිව්වා.

"එහෙනං ඉස්සෙල්ලා ඔයා පොරොන්දු වෙන්න..."

"මොකක්ද පොරොන්දුව.?."

"මං මේ කියන දේ ඇහුවට පස්සෙ මාත්තෙක්ක තරහ වෙන්නෙවත් මාව වරදවා තේරුම් ගන්නෙවත් නැහැ කියලා..."



WWW.EXPRESSLANKA.TK 79

"හ්ම්...! පොරොන්දු වෙන්නම්..."

සිනිදු මාලිගාගෙ ඇස් දෙක විතරක්ම බලාගෙන කිව්වා. සිනිදු දිහා බලන් ඉන්න මාලිගාගේ ඇස් පිහාටු වේගයෙන් ගැහෙනවා. මූණට මූණ බලාගෙන තත්පර ගානක්ම නිහඬවම ගෙවිල යනව දෙන්නටම දැනුනෙ නෑ...

"සිනිදු..."

මාලිගාගේ හඬ ආයෙමත් හිමීට අවදි වුනා. ඒත් ඒ එක්කම වගේ ඇහුන වාහනේක හඬත් එක්කම මාලිගාගේ මූණ ගැස්සිලා වගේ ගේට්ටුව දිහාවට හැරුණා.

"හානේ... අන්න අප්පච්චි එනවා...!"

මාලිගා එහෙම කියාගෙන එකපාරටම ගල් බංකුව උඩින් නැගිට්ටා. සිනිදුටත් ඒ එක්කම නැගිටුනා.

"සිනිදු එන්න.!., මං අරක පස්සෙ කියන්නං හොදේ..."

මාලිගා සිනිදු දිහාට හැරිලා එහෙම කියල ඉස්සරහට ඇදුනා. රත්නායකගේ කාරෙක කෙළින්ම ගිහින් පෝටිකෝව යට නැවතෙනකොට සිනිදු මාලිගාගේ පිටිපස්සෙන්ම පෝටිකෝව යටට ආවා...

"මොකද දෙන්නත් එක්ක එළියට වෙලා.?."

වාහනයෙන් බැහැපු ගමන් රත්නායක දෙන්නගෙම මූණු දිහා බලල ඇහුවෙ මූණට ආව හිනාවත් එක්කම.

"අපි අප්පච්චී එනකං කියව කියව හිටියා... සිනිදුටත් නිදිමත නෑ කිව්වා..." මාලිගා එහෙම කියන ගමන් සිනිදු දිහා බැලුවා. සිනිදු හිනාවුනා...

"පුතා මට හුහක් කණගාටුයි වෙච්ච සිද්ධියට... මං රෝහාන්ට දොස් කිව්වා..."

රත්නායක සිනිදු දිහා බලලා කිව්වා.

"මට රෝහාන් මුකුත් වරදක් කලේ නැනේ සර්..."

"නැත්තෙ මොකද...? ඒක රෝහාන් අයියගෙ ප්ලෑන් එකක් තමයි...

WWW.EXPRESSLANKA.TK 80

ඔයා දන්නැහැ රොහාන් අයියගෙ හැටි... නේද අප්පච්චී..."

මාලිගා එකපාරටම පුංචි එකියක් වගේ මැද්දට පැනලා කියවගෙන ගියා. සිනිදුටයි රත්නායකටයි දෙන්නටම හිනා.

"මං එයාට කියන්නම්කො ආව දවසක කරපු වැඩේ ලස්සන..."

"හා... හා... ඔයා එයාට බනින්න යන්න ඕනි නෑ දූ. මං රොහාන්ට දොස් කියලා ආවෙ. ඒත් මිනිහා කියන්නෙම ඒ මිනිහව ඔයාල ළඟට එව්වෙ එයා නෙමෙයිලු..."

"හොරෙක් කියනවද අප්පච්චි ඒ මිනිහා හොරකමක් කළා කියලා...?"

"රයිට්... රයිට්... දැන් ගෙට යං දැන් ගොඩක් රෑ වෙලා... දූට නිදිමරන්න හොඳ නෑ කියල ඩොක්ටර් අංකල් කිව්වා නේද?... අපි හෙට ඔය ගැන කතා කරමු. එන්න පුතා..."

රත්නායක එහෙම කියන ගමන් මාලිගාව තමන් ළඟට ලංකර ගත්තා. තුන්දෙනාම පෝටිකෝව යටින් ගෙට ඇතුල් වුනා.

සිනිදු ඇඳට වෙලා හිටියට තාම නිදි දෙව්දුව ළඟට ආවෙ නෑ... හිත ඇතුල පිරිල තිබුනෙ අද දවස පුරා සිදුවුන දේවල් වලින්... තමන් අද වෙන කවරදාටත් වැඩිය මාලිගාට හිතින් සමීප වුනා කියලා සිනිදුගේ හිත කිව්වා. ඒ සමීප වීම මොනවගේ එකක්ද...? ඒ සමීප වීම ඇතුලෙ තියෙන්නේ මොනවගේ හැඟීම්ද කියල සිනිදුට හිතාගන්න බැහැ. ඒත් මෙතුවක් තේරුම් ගන්න බැරිවුන එක දෙයක් අද සිනිදුට තේරුම්ගන්න පුළුවන් වුනා. ඒ මාලිගා කියන තේරුම් ගන්න බැරි පෝසත් කෙල්ල ළඟ තියෙන ආත්මීය ගැහැණු කම... මාලිගාව මුලින්ම දකපු දවසෙම හිත ඇදිල ගිය ආකර්ෂණයට අද පැහැදීමකුත් එකතු වුනා... ඒත් තමන්ට ඒ පැහැදීමෙනුත්, ඒ ආකර්ෂණයෙනුත් වලක් තියෙනවද...? සිනිදුගෙ ඔළුව ඇතුලෙ එකපාරටම විදිල්ලක් කෙටුව



WWW.EXPRESSLANKA.TK 81

වගේ වුණේ එතකොට...

මුතු...!

අහිංසක හිනාවෙන් මූණ පුරෝගෙන මුතු තමන් දිහා බලන් ඉන්නව වගේ සිනිදුට මැවිල පෙනුනා. එක ආදරයක් හද ලෙන් දොර ඇරගෙන පැනල යන්න හදනකොට තව ආදරයක් ඒ ඇරුන ලෙන් දොරෙන්ම ඇතුළට එන්න බලන් ඉන්නවා...

"මුතු... මං ඔයාට තාමත් වරදක් කරල නෑ... ඔයයි මාව වරදවා තේරුම් ගත්තෙ... මට ඒකට කරන්න දෙයක් නැහැ."

සිනිදු දිග හුස්මක් පිට කරන ගමන් හිතින් එහම කිව්වා.



WWW.EXPRESSLANKA.TK 82

# 07

මාලිගාට ඇහැරුනේ සිනිදුයි රත්නායකයි ඔෆිස් ගියාට පස්සෙ... මාලිගාටත් පාන්දර වෙනකම් නින්ද ගියේ නෑ. රෑ පුරාම මාලිගාගේ හිතේ සිතුවම් ඇඳුනා. ඒ හැම සිතුවමකම තිබුනෙ එකම රූප ඡායාවක්. සිනිදු ජීවිතේ පළවෙනි වතාවට තමන්ගෙ නම කියල අමතපු ඒ හැඟීම්බර මොහොත... මාලිගාට පුදුමයි.. තාමත් ඒ විශ්මයෙන් හිත පිරිල ගිහින්. ඒත් ඇඳ උඩ ඉඳගෙන තවත් ඒ ගැන හිත හිත ඉන්න මාලිගාට ඉඩක් ලැබුනේ නැහැ.

එකපාරටම වත්තට ඇතුල් වෙනව ඇහුන වාහනේ සද්දෙට මාලිගා බැල්කනියට දුවගෙන ඇවිත් මිදුල දිහා බැලුවා. මාලිගාගේ මූණ අඳුරු වෙලා ගියා. රොහාන් වැලිවිට වාහනේ මිදුලෙ නවත්වලා ගෙට ඇතුල් වෙන්න එනවා... මාලිගා තරප්පු පෙළ වේගයෙන් බැහැගෙන පල්ලෙහාට ඇවිත් අන්තිම පඩිය ළඟ නැවතුනා. දෙන්නගෙම ඇස් එකට ගැටුනා. එතකොටම...

"අප්පච්චි නෑ...!"

මාලිගා එකපාරටම කිව්වා. ඒ වචන දෙක මාලිගා කියපු විදිහට රොහාන්ගෙ ඇඟ හිරිවැටිගෙන ගියා.



WWW.EXPRESSLANKA.TK 83

"ම... මං... ආවේ අප්...පච්චි හම්බවෙන්න නෙමෙයි...,"
රෝහාන්ට වචන අමුණා ගන්න ටිකක් අමාරු වුනා.

"එහෙනං...?"

"මං ආවේ ඔයාව හම්බ වෙන්න..."

"මාව හම්බවෙන්න..?! ආ... අර ඊයේ පාටියට අපි එක්කගෙන ආව ළමයා බීපු බීම වීදුරුවෙ සල්ලි අරගෙන යන්නනෙ ඔයා ආවෙ...? ඉන්න මං අරන් එන්නං..."

මාලිගා එහෙම කියල එකපාරටම අයෙමත් තරප්පු පෙළ නැගගෙන උඩට යන්න හැදුවා...

"මාලිගා ! ඔයා මොනවද ඔය කියවන්නේ...? ඔයාට පිස්සුද...?"

"ඔව්...! මට පිස්සු ! එකනෙ මං ඔයාල ඉන්වයිට් නොකරපු අයව ඔයාගේ පාටියට එක්කගෙන ආවේ."

මාලිගා තරප්පු පෙළේ පඩි හතරක් උඩට ගිහින් ආපහු රෝහාන් දිහාවට හැරිලා කිව්වා. රෝහාන් තව ටිකක් තරප්පු පෙළ ළඟට කිට්ටු වෙන්න ආවා...

"අයියෝ... මාලිගා ඔයා දන් හරි හෝට් ගර්ල් කෙනෙක් වෙලානේ... මං ඒ වගේ දෙයක් කෙරුවෙ නෑ... අනික කොහේවත් යන එකෙකුගෙන් අහපු දේකට ඔයා මොකටද ඔය තරම් කේන්ති ගන්නේ.?."

"කොහේවත් යන එකෙක්.?.!"

"මාලිගා ඇස් ලොකු කරගෙන එහෙම අහපු විදිහට රෝහාන්ගෙ උගුර කට වේලිලා ගියා.

"රෝහාන් අයියා... ඔයාට ඒ ළමයව කොහේවත් යන එකෙක් විදිහට පෙනුනට අපිට එයාව ගොඩාක් වටිනව තේරුනාද...? එයා ඉන්නෙ මේ ගෙදර... අපිත් එක්ක. අපිට ඉන්වයිට් කරන ඔනම දේකට අපිත් එක්ක යන්න එයාට පර්මිෂන් තියෙනව. ඔයා ඒක හොඳට මතක තියාගන්න.!."

මාලිගා එහෙම කියලා ආපහු හැරුනා

"මාලිගා!"



WWW.EXPRESSLANKA.TK 84

මාලිගා හැරිලා බැලුවෙ නෑ... තරප්පු පෙළ වේගයෙන් නැගගෙන උඩටම ගියා. රොහානුත් තරප්පු පෙළදිගේ උඩට නැග්ගා. ඒත් මාලිගා ඊට කලින් කාමරේට ඇවිත් දොර වහගත්තා...

"මාලිගා ! ප්ලීස් චූට්ටක් දොර අරින්න..."

රොහාන් දොරට හයියෙන් තඩිබාන ගමන් බැගෑපත් වුනා.

"මාලිගා මං ඔයාට ලන්ඩන් වලින් ගෙනාව ප්‍රසන්ට් එක විතරක් අරගෙන දොර වහගන්න... ප්ලීස්..."

"මට ඔයාගේ ප්‍රසන්ට් ඕන්නැහැ... ඔයා ඔතනින් යන්න..! ලැජ්ජා නැද්ද ඔයාට ගෑණු ළමයින්ගේ කාමර ළඟට ඇවිත් තට්ටු කරන්න?.."

"මාලිගා එහෙනං ඔයා දොර අරින්නෙම නැද්ද...?"

"නැහැ.!."

නිශ්ශබ්දව තව තත්පර කීපයක් ගෙවුනා. රොහාන් තරප්පු පෙළ බහින හඬ මාලිගාට ඇහුනෙ ඊට පස්සේ... රොහාන්ගෙ කාරෙක වේගයෙන් මාලිගාලගේ වත්තෙන් පිටවෙලා එළියට ගියා...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

සිනිදු වැඩ ඉවර කරලා කාමරයෙන් එළියට එනකං මාලිගා හිටියේ ඉවසිල්ලක් නැතුව. කීපාරක් ඔරලෝසුව දිහා බැලුවද කියලා මාලිගාට මතක නැහැ. මාලිගා ඔෆිස් එක ඇතුලෙ එහාට මෙහාට ඇවිද්දා. වෙනදට වැඩිය වේලාසනින් සිනිදුව එක්කගෙන යන්න ආව මාලිගාට ගෙවුන මිනිත්තු කීපය දැනුනෙ කල්පයක් වගේ.

"ඇයි අද වේලපහින්ම ඇවිත් හිටියේ?"

සිනිදු තරප්පු පෙළ බහින ගමන් ඇහුවා... මාලිගා තරප්පු පෙළ බැස්සේ සිනිදුට ඉස්සර වෙලා.

"ඇයි මං වේලපහින් ආවට අකමැතිද...?"

"අපෝ නෑ..."

"එහෙනං එහෙම අහන්නෙපා... තේරුනාද...?"



WWW.EXPRESSLANKA.TK 85

මාලිගා නැවතිලා පිටිපස්ස හැරිලා සිනිදුගෙ මූණ දිහා බලාගෙන කිව්වා.

"හ්ම්... මීට පස්සෙ එහෙම අහන්නැහැ..."

සිනිදු මාලිගාගේ ඇස් දිහා බලාගෙනම හිනාවෙලා කිව්වා. මාලිගා හිනාවුනා. ඒත් ඒ අර තරු පොකුරු හිනාව නෙමෙයි.

"මාලිගා වෙනද වගේ නෙමෙයි..."

සිනිදුට ඒ එක්කම හිතුනා. කාරෙක පනගැන්වුනා... ඒත් මාලිගා සුපුරුදු විදිහට යන්න ඕන දෙහිවල පැත්තට කාරෙක පැදෙව්වෙ නැහැ. හිතපු නැති විදිහට එකපාරටම කාරෙක පාරෙන් එහා පැත්තට දැම්මා...

"කොහේද යන්නෙ...?"

සිනිදු ඇහුවෙ මුකුත් හිතාගන්න බැරුව. ඒත් මාලිගාගෙන් උත්තරයක් ලැබුනෙ නැහැ. ඒ වෙනුවට මාලිගා සිනිදු දිහා බල්ල යන්තමටම හිනාවුනා. ඒ මූණ අද වෙනස් වෙලා... සිනිදුට ආයෙත් කොහෙද යන්නෙ කියල මාලිගාගෙන් අහන්න හිතුන් නැහැ.

"ඔයාට ඕන තැනකට යං... මං ඔයත් එක්ක ඕන තැනකට යන්න එනවා..."

සිනිදු මාලිගා දිහා බලලා හිතින් එහෙම කිව්වා. කාරෙක කොල්ලුපිටිය පහුකරගෙන ඉස්සරහට ඇදුනා.

❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊

"මොකද ඔයාට අද මෙතෙන්ට එන්න හිතුනේ..?"

සිනිදු ආයෙමත් කතා කෙරුවෙ මාලිගා කාරෙක ගෝල්ෆේස් එකට ගෙනත් නතර කළාට පස්සේ. දෙන්නම කාරෙකෙන් එළියට බැස්සා.

"නිකං..."

මාලිගා සිනිදුගේ මූණ දිහා බලලා ආයෙමත් යන්තමට හිනාවෙලා

WWW.EXPRESSLANKA.TK 86

කිව්වා. ඒ නිසාව අහිංසකයි.

"නිකං වෙන්න බෑ... ඔයා අද වෙනස් වෙලා... මොකක් හරි ප්‍රශ්නයක්ද...?"

"අද උදේ ඔයයි අප්පච්චියි ඔෆිස් ගියාට පස්සෙ රෝහාන් අයියා ආවා..."

"ඉතිං.?.!"

සිනිදු එහෙම අහනකොටම මූද පැත්තෙන් ආව තද හුළං රැල්ලකට මාලිගාගේ හිසකේ වැලක් නළලට වැටිල දඟ කරන්න පටන් ගත්තා.

"මං රෝහාන් අයියට බැන්නා..."

"ආ.!. ඒ මොකද...?"

ඊට පස්සෙ මාලිගා උදේ සිද්දවුන හැමදෙයක්ම අකුරක් නෑර සිනිදුට කියන්න පටන් ගත්තා. සිනිදු ඒ හැමදෙයක්ම අහගෙන හිටියේ අම්ම කෙනෙක් කියන වීර කතාවක් අහන් ඉන්න පුංචි එකෙක් වගේ. ඒ එක්කම රෝහාන්ගෙයි ශිලා ඇන්ටිගෙයි හිතේ තමන් ගැන තියෙන බලාපොරොත්තුව ගැනත් මාලිගා කිව්වා. සිනිදුගෙ හිත ඇතුළත් මොකක්දෝ වෙගෙන යනව වගේ දැනීගෙන ගියේ එතකොට...

"සිනිදු ඇයි ඔයා කතා නැත්තෙ...?"

මාලිගා ඇහුවෙ දෙන්න අතර තිබුන පුංචි නිහඬතාවය බිඳලා. මාලිගාගේ ඒ හඬේ දුක්බර බවක් තිබුණා.

"නැහැ..."

සිනිදු මාලිගා දිහාට හැරිලා යන්තමට හිනාවෙලා කිව්වා. මාලිගා සිනිදුගෙ ඇස්දෙක දිහා බලාගෙන ඉන්නවා...

"ඇයි ඔයා රෝහාන්ට අකමැති...?" සිනිදු ඒ බැල්ම දරාගන්න බැරුව වගේ ඇහුවා...

"රෝහාන් කියන්නෙ මගේ හිතේ ඇඳිල තියෙන රූපයක් නෙමෙයි සිනිදු... මගේ ලෝකෙ පුංචි එකක්... ඒක ඇතුළෙ ඉන්න ඉඩ තියෙන්නෙ ලස්සන හදවතකට විතරයි..."



WWW.EXPRESSLANKA.TK 87

මාලිගා කිව්වෙ හෝ ගාලා රළ ගහන මුහුද දිහා බලාගෙන...

"ඉතිං ඔයාගෙ පුංචි ලෝකෙට ඇතුල්වෙන්න පුළුවන් ලස්සන හදවතක් හම්බවුනාද...?"

මාලිගා එකපාරටම ආයෙමත් සිහිදූගෙ මූණ දිහා බැලුවා. ඒ මූණෙ කියාගන්න බැරි හුඟක් දේවල් සටහන් වෙලා...

"බයවෙන්න එපා... ඔයාට ඉක්මණට ඔයා හොයන ඒ ලස්සන හදවත හම්බවේවි..."

ඒ දයාබර වචන පෙළ මාලිගාගේ හදවතේ ගැඹුරුම පතුලට ගිහින් තැන්පත් වුණා වගේ. මාලිගා ඇස් පිහාටු වේගයෙන් ගැහෙද්දි, සිහිදූගෙ මූණ දිහා බලාගෙන උන්නා.

"කෝ... චුට්ටක් හිනාවෙන්න..."

සිහිදූ ඒ ඇස් මගහරින්නෙ නැතුවම කිව්වා. මාලිගා හිනාවුනා. කම්මුල් දෙපැත්ත වලගැහෙනකොට... "තව ටිකක්.!."

ඒ ආත්මීය තරු පොකුරු හිනාව සිහිදූගෙ ඇස්වලට අහුවෙලා මුළු ආත්මයම සුවපත්වෙලා යනව වගේ දැනෙනකොට...

"එහෙනං මිස්, අපි යමුද...?"

"මිස්...?"

"සොරි.!. මාලිගා..."

දෙන්නටම හයියෙන් හිනායනකොට මාලිගා කාරෙක පැත්තට හැරුණා.

"මේ...! සිහිදූ ඔයා ඩ්‍රයිව් කරනවද...?"

"හ්ම්... ඔබතුමියගේ කැමැත්තක්..."

"ඔබතුමිය...? පිස්සා...!"

දෙන්නම මූණ හිනාවෙන් පුරෝගෙන කාරෙකට ඇතුල් වුනා. අවට ලෝකය ගැන කිසිම හැඟීමක් දෙන්නටම දැනුන් නෑ. ඒත් එක උකුසු ඇස් දෙකක් ඒ දෙන්න දිහාවට හැරිලා තිබුණා.

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄



WWW.EXPRESSLANKA.TK 88

"ආ..! මේ කෝ ඔයා ඊයේ රෑ කියන්න හදපු බඩ්ඩ...?" සිතිදු එකපාරටම මතක් වුනා වගේ ඇහුවෙ කාරෙක ගාළු මුවදොර පහු කරන කොටම. මාලිගාගේ ඇස් ලොකු වුණා. ඒත් ඒ මූණේ තිබුන මදහස වුට්ටක්වත් අඩුවුනේ නැහැ.

"ඒක මං ආයේ පස්සෙ වෙලාවක කියන්නම්..."

"ඇයි ආයෙමත් පස්සෙ...?"

"වැදගත් දේවල් කියන්න තැනක් වෙලාවක් තියෙනවා..."

"ඇත්තට..? ඒ කියන්නෙ ඒක ඒ තරම්ම වැදගත්ද...?"

"ඔව්..."

"එහෙනං... ඒක කියන්න ආයෙමත් ලස්සනට හද පායල තියෙන දවසක රෑ අපි හමුවෙන්න ඕනි...?"

සිතිදු මදහසින් පිරුණු මුහුණ යන්තමට මාලිගා දිහාවට හරවලා ඇහුවා.

"සමහර විට,.."

මාලිගා කිව්වේ වීදුරුවෙන් එළිය බලාගෙන හිනාමූණෙන්. කාරෙක ගාළු පාර දිගේ ඉදිරියට ඇදෙන කොට දෙන්නගෙ කතාවට නැවතුමක් තිබුනේ නෑ. සිතිදු වෙනදා වගේ මාලිගා අහන දේවල් වලට විතරක් උත්තර දෙන්නැතිව තමනුත් නොයෙක් දේවල් මාලිගාගෙන් ඇහුවා. මාලිගාට පුදුමයි. ඒ හිත සතුටින් පිරිල... කාරෙක බම්බලපිටියට එන්න තත්පරයක්වත් ගියාද කියල දෙන්නටම දැනුන් නෑ.

"ආ...! සිතිදු මට එම්. සී. එකට ටිකක් යන්න ඕනි.!,"

මාලිගා කිව්වෙ කාරෙක බම්බලපිටිය හන්දියට එනකොටම...

"මොකටද...?"

"පොඩි බඩුවක් ගන්න තියෙනවා..."

"අප්පච්චිට කිව්වද යනව කියලා...?"

"ඔව්..." .

තවත් මොහොතකින් කාරෙක මැජෙස්ටික් සිටි එකේ රථගාලට ඇවිත් නතර වුණා. ඊට පස්සෙ දෙන්නම කාරෙකෙන් එළියට බැස්සා.



WWW.EXPRESSLANKA.TK 89

"හ්ම්... ගිහිල්ල ඕනි දෙයක් අරගෙන එන්න..."
සිනිදු කිව්වෙ කාරෙකෙන් බැහැපු ගමන්...
"ඇයි ඔයා...?"
"මං මෙතන ඉන්නං..."
"පිස්සුද ඔයාට? මෙන්න මෙහාට එනවා.!."
මාලිගා කාරෙකේ අනිත් පැත්තෙ ඉඳන් එහෙම කියාගෙන එන්න එනකොටම සිනිදු සාප්පු සංකීර්ණයට ඇතුල් වෙන්න ඉස්සර වුනා.
දෙන්නා ස්වයංක්‍රීය තරප්පු පෙළ දිගේ උඩට ගියා. සිනිදුට පේන හැම දෙයක්ම දැනුනෙ නුහුරු දේවල් විදිහට. තැනින් තැන තරුණ පෙම්වතුන් කියව කියවා ඉන්න හැටි, තවත් සමහර ගැහැණු ළමයි පිරිමි ළමයි තනියෙම පැත්තකට වෙලා තමන්ගේ පෙම්වතා හෝ පෙම්වතිය එනකම් ලතැවි ලතැවි බලන් ඉන්නවා. ඉස්සරහට හමුවෙන හැම තරුණ ජෝඩුවක්ම යන්නේ අත්වැල් පටල්වාගෙන. ඒත් ගැවෙන නොගැවෙන තරමට ළංවෙලා යන මාලිගාගෙයි සිනිදුගෙයි අත් එකට පැටලිලා තිබුනෙ නැ...
"එන්න..."
තුන්වෙනි තට්ටුවෙ සාප්පු පේළියක් දිගේ යන ගමන් මාලිගා එක පාරටම පිරිමි ඇඳුම් විතරක් තියෙන සාප්පුවකට ඇතුල් වෙන දොර ඇරියා. සිනිදුට වෙන්න යන්නෙ මොකක්ද කියල හිතාගන්න බැහැ...
"මේ ඇයි බයවෙලා වගේ.?."
මාලිගා සාප්පුවට ඇතුල් වෙන ගමන්ම සිනිදුගෙ මූණ දිහා බලල හිමීට ඇහුවා.
"න්... නැහැ..." සිනිදු කිව්වෙ මූණට හිනාවක් අරගෙන...
"එහෙනං ලස්සන ෂර්ට් ටිකක් පෙන්වන්න මට හොඳලමයා වගේ..."
"ෂර්ට් කාටද ?"
"පිරිමි ළමයෙකුට"
"බෝයි ෆ්‍රෙන්ඩ්ටද ?"
"ඔව්.!."


WWW.EXPRESSLANKA.TK 90

මාලිගා පිටිපස්සෙන් එන සිනිඳුගෙ දිහාවට හැරිල එකපාරටම කිව්වා. සිනිඳුගෙ මූළු ඇඟම සීතල වුණා වගේ..." ඉතින් එයාවම එක්කගෙන ඇවිල්ල අරගෙන දෙන්න තිබ්බනේ.?." සිනිඳු කිව්වේ තමන්ගේ සසලවීම වහගන්න වගේ...

"එහෙම හොඳ නෑනේ තෑගි දෙන්න... ආ... සිනිඳු මේ ෂර්ට් හොඳද බලන්න.?."

"හොඳයි..."

සිනිඳු එකපාරටම කිව්වා.

"එහෙම බෑ... ඔයාට හොඳ නම් කියන්න..."

මාලිගා එහෙම කිව්වම සිනිඳු මාලිගා පෙන්නල අහපු හැම ෂර්ට් එකක්ම හොඳයි කියන්න වගේ ඔළුව දෙපැත්තට වැනුවා.

"පිස්සා.!."

'මාලිගා කිව්වේ සිනිඳු දිහා බලල හෙමිහිට. 'මාලිගා තමන්ට ලස්සනයි කියලා හිතුන ෂර්ට් හතරක්ම අරගෙන බිල ගෙවල සිනිඳු එක්ක සාප්පුවෙන් එළියට එන්න එනකොටම...

"හ.. ල්.. ලෝ... මචං... සිනිඳු...!"

වීදුරු දොර ඇරගෙන සාප්පුව ඇතුළට එන්න ආව තරුණයා එකපාරටම සිනිඳුගෙ උරහිසට අත තියලා මූණෙ හිනාව පුරෝගෙන කතා කළා. මාලිගා සිනිඳුගෙ මූණ දිහා බැලුවා. සිනිඳුගෙ ඇස් ලොකුවෙලා මූණට හිනාවක් ආවා.

"හල්ලෝ... රවී..."

සිනිඳු රවීගේ අත්දෙකින්ම අල්ල ගත්තා.

"මට ගමේ ගියාම ආරංචි වුනා උඹට කොළඹින් ජොබ් එකක් සෙට්වුනා කියලා..."

රවී එහෙම කිව්වට ජොබ් එක ලැබුනෙ කොහොමද කියලා සිනිඳුගෙන් ඇහුවෙ නෑ. ඒ හැම දෙයක්ම ගමේ ගියාම රවීගේ මීටරයට වැටිලා තිබුනා. රවියි සිනිඳුයි හිනාමූණෙන් තොරතුරු කතා කරන හැටි මාලිගා හිනාමූණෙන් බලන් ඉන්නවා. රවී සිනිඳුත් එක්ක කතා



WWW.EXPRESSLANKA.TK 91

කරන ගමන් මාලිගා දිහා කීප සැරයක්ම බැලුවා.

"කෝ මචං උඹ කතාවෙන් කතාවෙන් මට තාම මෙයාව ඉන්ට්‍රඩියුස් කරල දුන්නෙත් නැහැනේ ?"

රවී මාලිගා දිහා ආයෙමත් බලන ගමන් කිව්වෙ. සිහිදුගේ පපුව ඇතුළ ටිකක් ගැහුනා වගේ වුණා.

"ම... මචං මේ මාලිගා... අපේ බොස්ගෙ එකම දුව... මෙයා තමයි මට මේ ජොබ් එක අරන් දුන්නේ..."

"න්..නැ...! උඹ මාර ලකී පොරක්නේ..."

රවී කිව්වෙ ඇස් ලොකු කරගෙන.

"එහෙනං රස්සාවයි, පරස්තාවයි දෙකම එකපාරම හොයාගත්තා. නියමයි... දීපං අත... යකෝ අපිනේ එහෙනං මේ කැම්පස් වලට වෙලා වාටර් වෙවී ඉන්නේ..."

රවී සිහිදුගේ අතින් අල්ලගෙන සුභ පතන්න වගේ හොලවනකොට මාලිගාටයි සිහිදුටයි මූණට මූණ බැලුනා. සිහිදුගේ උගුර කට වේලිලා ගියා. ඒත් මාලිගාගේ හිතට ආවේ සතුටක් . මාලිගා පුංචි එකියක් වගේ හිනාවෙනවා.

"ආහ්...! උඹ මොකද මේ බයවෙලා වගේ... මං මේක කියන්න දන්ම ගමේ යන්නැහැ. බය නැතුව හිටපං..."

රවී සිහිදුගෙ අත අල්ලගෙන ම වගේ දෙන්නගෙම මූණ දිහා බලල කිව්වෙ. ඒත් සිහිදුට තවත් රවී කියන, අහන දේවල් විඳගෙන ඉන්න පුළුවන් වුනේ නැහැ...

"මචං පරක්කු වුනා... අපි එහෙනං යන්නද...?" මං උඹව බලන්න වෙලාවක කැම්පස් එකට එන්නං... ළහයිනේ..."

සිහිදු එහෙම කිව්වෙ වෙන කරන්න දෙයක් නැතිනිසා...

"රයිට් ඕන වෙලාවක වරෙන්..."

"එහෙනං අපි යන්නද...?"

"ඕකේ මචං... ආයි හම්බවෙමු... සී... යූ..."

දෙන්නා රවීගෙන් සමු අරන් ඉස්සරහට ඇදුනා. මාලිගා ආයෙමත්

සිනිදුගේ මූණ දිහා බැලුවා. කලින් තිබුණ සතුටු පෙනුම ඒ මූණේ නෑ... රවී අන්තිමට දෙන්නාගෙම මූණු දිහා බලාගෙන කිව්වදේවලින් පස්සේ සිනිදුගේ මූණ වෙනස්වුන බව මාලිගාට දැනුනා.

"සිනිදු ඒ ඔයාගේ ගමේම යාළුවෙක්ද.?."

මාලිගා ඒ කිසිම දෙයක් හැඟවුන්නැති විදිහටම ආයෙමත් සිනිදුත් එක්ක කතා කරන්න මුල පිරුවා...

"හ්ම්..."

සිනිදු තරප්පු පෙළ බහින ගමන් කෙටි උත්තරයක් දුන්නා.

"ඔයත් එයත් එක්කමද කැම්පස් එකට තේරුනේ.?."

"ඔව්..."

"අපරාදේ ඔයාට කැම්පස් යන්න බැරිවුනානේ නේද.?."

"හ්ම්..."

"මොකද හ්ම්... ගාන්නේ.?."

"නැත්තං මේ වගේ පෝසත් කෙල්ලන්ගේ පස්සෙන් වැටිලා සාප්පු සවාරි එන්න වෙන්නෑනේ..."

සිනිදු හිනාපොදක්වත් නැතුව අහක බලාගෙන කියපු ඒ වචන පෙළ මාලිගාගේ පපුව හිල් කරගෙන ඇතුළටම ගියා. ඉන් පස්සේ එම්. සී. එකෙන් පිටවෙලා ගෙදරට එනකම්ම දෙන්නත් එක්ක එක වචනයක්වත් කතා කලේ නෑ... සිනිදු කාරෙක පදවන ගමන් මාලිගා දිහා හොරෙන් බැලුවා. ඒත් මාලිගා සිනිදු දිහා චූට්ටක්වත් බැලුවේ නැහැ.

කාරෙක පෝටිකෝව යටට ඇවිත් නැවතුන ගමන්ම මාලිගා සිනිදු දිහා බලන්නැතුවම ඇඳුම් පාර්සලෙත් අරගෙන කාරෙකෙන් බැහැලා ගෙට ඇතුල් වෙන්න හැදුවා.

"මිස්!."

පෝටිකෝවෙන් පඩිදෙකක් උඩට නගිනකොටම ඇහුන ඒ හඬට කන්නොදී ඉන්න මාලිගාට පුලුවන් වුනේනෑ. මාලිගා ඉබේටම නැවතිලා වගේ හැරිලා බැලුවා. සිනිදු කාරෙකෙන් බැහැලා යතුර දික්කරගෙන



WWW.EXPRESSLANKA.TK 93

ඉස්සරහට එනවා. ආයෙමත් ඒ ඇස් හතර හමුවුනා... දෙන්නගෙන් එක්කෙනෙකුටවත් කතා කරගන්න බැහැ. මාලිගා සිනිදුගේ අතින් කාරෙක් යතුර ගන්නකොට මාලිගාගේ ඇස් දෙකෙන් නලියන කඳුළු බිංදු දෙක සිනිදුට පෙනුනා. ඒත් ඒ කඳුළු බිංදු සිනිදු ඉස්සරහ පිට කම්මුල් දිගේ පහලට ගලන්න කලින් මාලිගා එතනින් පිටවුනා... සිනිදුගෙ පපුව පිච්චිලා ගියා වගේ...

"මට සමාවෙන්න මාලිගා..."

සිනිදු හිතින් එහෙම කියනවා කාටවත් ඇහුන්නැහැ...

සිනිදු ගෙට ඇතුල් වුන ගමන්ම නාන කාමරයට වැදිලා වතුර මල යටට වුනා. ඒත් හීතියට හැලෙන සීතල වතුර බිංදුවලට සිනිදුගේ හිත ඇතුලේ තිබුණ ගින්දර නිවන්න පුළුවන් කමක් නැහැ. පහුගිය දවස් දෙක තුනේම අළුයට හැංගිලා තිබුණ ගිනි පුපුරු ආයෙමත් අද රවීව හමුවුණාට පස්සේ දළුදාන ගිණි ගොඩක් වුනා... රවී තමන් ගැන මොනව හිතන්නැද්ද...? රවී ගමේ ගියාම ගමේ අයට මොනවා කියාවිද...? සිනිදු හිතන්න පටන් ගත්තා...

"රවී මුතුගේ අයියගේ හොඳ යාලුවෙක්.!." ඒ එක්කම සිනිදුට මතක් වුනා. ඒත් ඇයි තමන් මාලිගායි තමනුයි ගැන වැරදියට හිතල රවී කියපු දේවල් ඉදිරියේ නිහඬව හිටියේ...? ඇයි මාලිගා තමන්ගේ පෙම්වතිය නෙමෙයි කියල රවීට නොකිව්වෙ..? සිනිදු තමන්ගේ හිතින්ම ප්‍රශ්න කෙරුවා... ඒත් උත්තර හම්බවුනේ නැ...

කොයිතරම් වේලාවක් වතුර මල යටට වෙලා ඔළුව අල්ලගෙන හිටියද කියල සිනිදුට දැනුනේ නැහැ. පැය භාගයකට විතර පස්සේ සිනිදු නාන කාමරයෙන් එළියට ඇවිත් ආපහු තමන්ගේ කාමරේට ඇතුල් වෙන්න දොර ඇරියා. එකපාරටම කාමරයට ඇතුල් වුන ගමන් දකපු දෙයින් සිනිදුගෙ ඇස් දෙක ලොකුවෙලා ගියා. මාලිගා එම්. සී. එකෙන් ගත්තු ෂර්ට් ටික ඒ බෑග් එකත් එක්කම සිනිදුගේ ඇඳ උඩ තියෙනවා. සිනිදුගේ පපුව ගැහෙන වේගය වැඩිවුනා. සිනිදු ඇඳ



WWW.EXPRESSLANKA.TK 94

උඩින් වාඩිවෙලා ඒ ඇඳුම් බෑග් එක අතට ගත්තා. ඒකේ කෙළවරක රවුම් අත් අකුරින් මොනවද ලියපු පුංචි කොළ කෑල්ලක් අමුණලා තියෙනවා සිනිදුගෙ ඇස්වලට අහුවුනේ එතකොට...

*සිනිදු,*

*මේ ඇඳුම් ගන්නෙ වෙන කාටවත් නෙමෙයි.*

*සතුටින් භාරගන්න.*

*මාලිගා.*

සිනිදු ෂර්ට් දාලා තියෙන බෑග් එක එහෙමම පපුවට තුරුළු කරගෙන ඇඳේ හාන්සි වුනා. මේ වෙගෙන යන්නේ මොනවද කියල හිතාගන්න සිනිදුට අමාරු වුනේ නෑ... ඒත් මේ සිදුවෙන දෙවල් වලට මුහුණ දෙන්නෙ කොහොමද කියල සිනිදුට එකපාරටම හිතාගන්න බැරිවුණා. සාප්පුව ඇතුළෙදි මාලිගා ඇඳුම් තෝරන කොට සිනිදු මාලිගාගෙන් අහපු දේ. සිනිදුට ආයෙමත් මතක් වුනා...

"බොයි ෆ්‍රෙන්ඩ්ටද...?"

"ඔව්...!"

මාලිගා එකපාරටම තමන් දිහාවට මූණ හරවලා අමුතු විදිහට බලල කියපු හැටි... ඒ රූප සටහන් හිත ඇතුළෙ ආයෙමත් ඇඳෙනකොට සිනිදුගෙ මුළු ඇඟම සීතල වෙලා ගියා. ඒ එක්කම කාමරෙන් එහා පැත්තේ ඇලින්දයේ ඉඳන් ගලාගෙන ආව වයලීන හඬ සිනිදුගේ කන් පතුල් ඇතුළටම රිංගුවෙ හීනෙන්වගේ...

**කුරුටු ගෑ ගී පොතේ..**

**කුරුටු ගී කෑ ගගා...**

**ගිලන් හද පාරවා...**

**ගෙනේ වද වේදනා...**

මාලිගා ආලින්දයේ ඉඳගෙන භාවනාවකට සම වැදිලා වගේ වයන ඒ දුක් ගී ස්වරය සිනිදුගේ හදවතේ ගැඹුරුම පතුලට ගියා. සිනිදු තව තවත් ඒ හඬට සමීප වෙන්න වගේ පපුවට තුරුළු කරගෙන හිටපු ඇඳුම් බෑග් එකත් එක්කම ඇස් දෙක පියාගත්තා...



WWW.EXPRESSLANKA.TK 95

ඔබෙන් පෙරදා
උගෙන කවිකම්
ලියූ කවි ගීතිකා...
ඔබේ නාමෙන්
හැඬූ කඳුලෙන්
ගයමි මම
කිවිඳුනේ...

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

දවස් ගානක්ම හිත ඇතුලේ තෙරපගෙන හිටපු පීඩනය තවදුරටත් විදගෙන ඉන්න මුතුගේ හිතට පුළුවන් වුනේ නැහැ. මුතු දවස් ගානක්ම හැමෝටම ' හොරෙන් ඇඩුවා. ඒත් තමන් සිතිදුව බොරුවට සැක කරලා කතා කරපු එක වැරදියි කියල හිතන්න දත් මුතුට පුළුවන් කමක් නෑ. තමන්ගේ හිත ඇතුලෙ ඇතිවෙලා තිබුණ සැකය නිවැරදියි. තමන් එහෙම හිතපු එක කොයිතරම් සාධාරණද...? එහෙම හිතන්න පුළුවන් සාක්ෂියක් මුතුට ලැබිලා තිබුණා... ඒත්... ඒත් තමන් පුංචි කාලෙ ඉඳන්ම අඳුනගෙන හිටපු සිතිදු තමන්ට මෙහෙම ද්‍රෝහිකමක් කරයි කියල හිතන්න පුළුවන්ද...? මුතු ඇඩුවා. ඇයෙමත් කඳුළු වලින් කොට්ටෙ පෙඟෙනකම්ම ඇඩුවා... ඒත් ඒ කඳුළු ගංගාවලට ආදරය නිසා හිතක උපදින ගින්දර නිවන්න පුළුවන් කමක් නැහැ.

මුතු අයෙමත් කම්යුනිකේෂන් එකකට ගිහින් සිතිදුට කෝල් එකක් ගන්න හැදුවා. සිතිදුගෙ දුරකථනය නාදවෙන හඬ මුතුට එහා කෙලවරින් ඇහුණා.

"හෙලෝ..."

"අයියේ... මේ මුතු.!."

මුතුට කියන්න ලැබුනේ ආයෙමත් ඒ වචන ටික විතරයි. සුපුරුදු විදිහට අයෙමත් එහා පැත්තෙන් දුරකථනය විසන්ධි කෙරුණා. පපුව

WWW.EXPRESSLANKA.TK 96

ඇතුලෙට උල් පිහියකින් අනිනවා වගේ මුතුට දැනිගෙන යනකොට කම්මුල් දෙපැත්තෙන් කඳුළු වැල් දෙකක් ගලාගෙන ආවා. මුතු කාටවත් පේන්නැති වෙන්න ඒ කඳුළු දුරකථන කුටිය ඇතුලෙදිම පිහදාගත්තා. ඒත් මේ ප්‍රශ්නෙට තව දුරටත් කඳුළු වලින් උත්තර හොයාගන්න බැහැ. කරන්න ඉතුරුවෙලා තිබුනේ තව එක දෙයයි. මුතු මිටමොලවගෙන හිටපු ඇඟිලි දිගහැරල අල්ලෙ ලියාගෙන ආව මාලිගාගේ ජංගම දුරකථන අංකය දිහා බැලුවා. ඊට පස්සෙ එකේ තිබුණු ඉලක්කම් ටික ඩයල් කළා...

"හෙලෝ..."

එහා කෙළවරින් මාලිගාගේ හඬ ඇහෙන්න තත්පර පහක්වත් ගියේ නෑ...

"මාලිගා මිස්ද කතා කරන්නේ...?"

"ඔව්... කව්ද කතා කාරන්නෙ?"

"මි.ස්... මං මේ මුතු..."

"මුතු...?"

මාලිගාට ඒ නම මතකෙට ගන්න ඒ තරම් අමාරු වුනේ නැහැ. "මල්කි නුවරින් හොයල දුන්න නැටුම් කණ්ඩායමේ හිටපු ඒ ලස්සනම කෙල්ල..." එකපාරටම අකුණක් වැදුනා වගේ මාලිගාගේ හිතට ආවා.

"හානේ මුතු..! කොහොමද...? ඔයාට මාව මතක් වුනාද... ආ...?"

මාලිගා කථාකලේ සතුටින්. ඒත් එහා කෙළවරින් ඇහුනේ මුතු හයියෙන් හුස්ම පිටකරන හඬ විතරයි.

"මුතු!"

"මිහ්..."

"මොකද ?"

මුතු කතාකලේ නැහැ. මාලිගාට ඇහුනේ මුතු ලතවෙව් හිමීට ඉකිබිඳින පුසුම් හඬ විතරයි.

"මුතු ඉක්මනට කතා කරන්න... මං මේ මියුසික් ක්ලාස් එකේ



WWW.EXPRESSLANKA.TK 97

ඉන්නේ..."

මාලිගා කතා කෙරුවේ තරමක් අපහසුතාවයට පත්වෙලා. වගේ...

"මාලිගා... මි... මිස්..."

"ඔව්... කතා කරන්න..."

"මි.. මිස් ඔයාලගෙ ගෙදර ඉන්න සි... සිනිදු අයියා....,"

මුතු කියන්න හදපු වචන පෙළ කියල ඉවරවෙන්න ඉස්සෙල්ල...

"ඔ... ඔව්... සිනිදු...?"

"අ... අනේ රත්තරං මිස් එයා මගේ!.. එයාව මගෙන් උදුරගන්න හදන්නෙපා මි..මිස්... මං වැඳල කියන්නං...මගේ සිනිදු අයියට මාව බලන්න එන්න කියන්න..."

"මු... මුතු... මොනවද ඔය කියන්නෙ.?."

ඒත් මාලිගාට අයෙමත් මුතුගේ හඬ ඇහුනේ, නෑ... මුතු රිසීවරය තියල ඇස්වලින් හෝ ගාලා එන කඳුළු ලේන්සුවට පෙහෙව්වා. මාලිගාට කිසිම දෙයක් හිතාගන්න බැරුව එකපාරටම හිටපු තැන පුටුවෙ ඉඳගැනුනා. හුස්ම වේගයෙන් ඉහළ පහළ වැටෙනකොට,.. මුළු ලෝකෙම තමන්ගේ වටේ කැරකෙනව වගේ දැනෙන කොට මාලිගා ළඟ තිබුණු මේසෙට ඔළුව තියාගත්තා...

"මාලිගා... මොකද...?"

පැත්තකට වෙලා වයලීනය පුහුණු වෙමින් උන්නු චමරි එකපාරටම මාලිගා ළඟට ඇවිත් ඇහුවා. මාස්ටර් ඇවිත් හිටපු නැති නිසා පන්තියේ හුඟක් ළමයි තැනින් තැන කියව කියව හිටියා.

"මගේ ඔළුව ටිකක් කැරකිගෙන වගේ ආවා චමරී.."

මාලිගා ඔළුව උස්සන්නැතුවම උත්තර දුන්නා. ඒත් මාලිගාගේ හිතේ මොකක් හරි ප්‍රශ්නයක් තියෙන බව තේරුම්ගන්න චමරිට අමාරුවුනේ නැහැ...

"උඹට ඉස්සෙල්ලා ආව කෝල් එකෙන් පස්සේ නේද ඔහොම වුනේ... ආ...?"

WWW.EXPRESSLANKA.TK 98

"න්... නැහැ..."

මාලිගා හිමීට කෙඳුරුවා... තව එක මොහොතක්වත් සංගීත පන්තියෙ ඇතුලේ ඉන්න මාලිගාගේ හිත ඉඩ දුන්නැහැ. මාලිගා ඔළුව උස්සලා චමරිගෙ මූණ දිහා බැලුවා.

"මං ගෙදර යනව චමරී..."

"උඹට පිස්සුද...? ඔළුව කැරකිල්ල තියාගෙන...?"

"න්... නෑ... දන් ඒක හොඳයි... මට ගෙදර ගිහින් ටිකක් රෙස්ට් කරන්න ඕන..."

මාලිගා පුටුවෙන් නැගිට්ටා. චමරි ඇස් ලොකුකරගෙන මාලිගාගේ මූණ දිහා බැලුවා.

"මාලිගා කියපං උඹට මුකුත් ප්‍රශ්නයක්ද...?"

"න්... නැහැ චමරි... එහෙම මුකුත් නෑ... මං යන්නං"

මාලිගා අඳුරු වුන මූණට යන්තම් හිනාවක් අරගෙන කිව්වා. ඒත් ඒ හිනාවට හිතේ තිබුණ නොසන්සුන්කම වහගන්න පුළුවන් වුන්නැහැ. මාලිගා අන්තිම වතාවට චමරිගේ මූණ දිහා බලලා ආපහු හැරෙනකොට චමරිගෙ හිත ඇතුල පිච්චිලා ගියා. තරු පොකුරු හිනාව නැතුව මාලිගා පන්තියෙන් පිටවෙලා යනවා දැකපු එකම දවස...

ඔළුව ඇතුලෙ අකුණු දස දහස් ගණතින් පුපුරනව වගේ දැනෙනකොට මාලිගා කාරෙක පණගැන්නුවා. කාරෙක තමන් ගෙනියන්නේ කොයිතරම් වේගයෙන්ද කියල මාලිගාට දැනුන් නෑ... මාලිගාගේ හිත ඊට වැඩි වේගයෙන් මුතු කියපු වචන පෙළ දිගේ ඈතට ගියා. තමන් ගැනම ඇතිවුන ආත්ම අනුකම්පාවෙන් මුළු හිතම කඩා වැටෙන කොට ඇස්වලින් බේරෙන කඳුළු බිංදු අතරේ හැම හීනයක්ම බොඳවෙලා යන හැටි මාලිගාට පෙනුනා... ඒත් ඒ අතරේ තමන්ගේ කාරෙක අනිත් වාහනවල ගෑවෙන නොගෑවෙන තරමට ළංවෙලා යන හැටි මාලිගාට දැනුන් නෑ... හැමදෙයක්ම දෛවය කුරිරු



WWW.EXPRESSLANKA.TK 99

විදිහට සැලසුම් කරල තිබුණා...

ඉස්සරහට හමුවුණ හැම වාහනයක්ම ගැවෙන නොගැවෙන තරමට ළඟින් බේරගෙන ආවට තව දුරටත් එහෙම ඉස්සරහට යන්න මාලිගාට වාසනාව තිබුන්නැහැ...

ද... ඩි... ං...!

දෛවයේ කුරිරු සැලසුම ක්‍රියාත්මක වුනා. ඉස්සරහට ආව බස් එකේ හැප්පුන මාලිගාගේ කාරෙක පාරෙන් එහා පැත්තට විසිවෙලා ගියා...



WWW.EXPRESSLANKA.TK 100

# 08

ඔපරේෂන් තියටර් එක ඉස්සරහ හැමෝම වටවෙලා උන්නා. රත්නායක, ශීලා, මිස්ටර් වැලිවිට, ඒ හැමෝගෙම මූණුවල් අඳුරුවෙලා... ඇස්වල කඳුළු බිංදු නලියනවා. නළලට අත තියාගෙන බිම බලාගෙන ඉන්න රත්නායකගේ ඇස්වලින් කඳුළු වැල් එකපිට එක කඩාගෙන වැටුණා. සිනිඳු කොරිඩෝ එකේ කෙළවරට වෙලා ඇස්වලින් එන කඳුළු පිහදනවා කවුරුවත් දක්කේ නෑ... මාලිගාට මොකද වුණේ කියල සිනිඳුට හිතාගන්න බෑ. මේක සාමාන්‍ය රිය අනතුරක් නෙමෙයි, "ඒ තරම් වේගයෙන් කාරය පදවන්න තරම් මාලිගාට තිබුණ උවමනාව.?. එහෙම නැත්නම් එයාට තිබුන මානසික පීඩනය මොකක්ද දෙයියනේ.?." කිසිම දෙයක් හිතාගන්න බැරුව සිනිඳු තමන්ගේ හිතින්ම කෑ ගහල එහෙම ඇහුවා. එතකොටම ඔපරේෂන් තියටර් එකේ ඉඳලා ලොකු ඩොක්ටර් එළියට ආවා. රත්නායක ඩොක්ටර් එන ඉස්සරහට ගියා....

"ඩොක්ටර් කොහොමද මගේ දුවට.?. කියන්න ඩොක්ට...ර්... මොකද...?"

ඩොක්ටර් එකපාරටම උත්තර දුන්නෑ. මූණෙ තිබුනෙ බැරෑරුම් පෙනුමත් එක්කම ඩොක්ටර් තව අඩි කිහිපයක් ඉස්සරහට ආවා.



WWW.EXPRESSLANKA.TK 101

හැමෝම ඩොක්ටර්ගේ මූණ දිහා බලන් උන්නා.

"බයවෙන්න එපා රත්නෙ ... අපිට ළමයගෙ ජීවිතේ බේරල දෙන්න පුළුවන් වෙයි. ළමයගේ පපුවටයි ඔලුවටයි දැනටනම් ජේන්න තරම් හානියක් වෙලා නෑ... ඒත්..."

ඩොක්ටර් එකපාරටම කියන්න හදපු දේ නොකියා මූණේ තිබුණ ගැඹුරු පෙනුමෙන්ම රත්නායකගේ මූණ දිහා බැලුවා. රත්නායකගේ ඇස් ලොකුවුනා.

"ඇයි... ඩොක්ටර් මොකද...?"

"දරුවගේ වම් කකුල හුහක්ම ඩැමේජ් වෙලා තියෙනවා රත්නෙ"

"ඒ... ඒ... කියන්නෙ.?."

රත්නායකගේ ඇස් වලින් ආයෙමත් කඳුළු වැල් ගලාගෙන ආවා... ඩොක්ටර් රත්නායකගේ උරහිසට අත තිබ්බා.

"රත්නෙ අපි විශ්ම කර්මයෝ නෙමෙයි..., ඒත් අපි කරන්න පුළුවන් හැම දෙයක්ම කරනවා. හිත කලබල කරගන්නැතුව ඉන්න."

"ඩොක්ටර් මට මගේ දරුවව හිටපු විදිහටම ආයෙත් ජීවත්වෙලා ඉන්නව දකින්න සලස්වල දෙන්න ඩොක්ටර්... අනේ මං ඔයාගෙන් ඉ... ඉල්ලන්නෙ එච්චරයි... ඩො... ක්ටර්..."

ඇස් දෙකෙන් නවතින්නැතුවම කඳුළු කඩා හැලෙනකොට රත්නායක ඩොක්ටර්ගේ අත්දෙකෙන්ම අල්ලගෙන කෙඳිරුවා. ඩොක්ටර් රත්නායක සනසන්න වගේ පිටට තට්ටු කළා. ශීලා ඇන්ටියි මිස්ටර් වැලිවිටයි ඩොක්ටර්ගෙන් තව මොන මොනවද ඇහුවා. සිනිඳු ටිකක් එහාට වෙන්න ඉඳගෙන ඒ අය දිහා බලාගෙන උන්නා. තමන්ගේ හිත ඇතුළෙ වේදනාව කොයිතරම් වුනත් සිනිඳුට ඩොක්ටර් ළඟට ගිහින් මොනවත් අහන්න පුළුවන් කමක් නෑ... එතන හිටපු හැමෝටම සිනිඳුව පෙනුනේ රත්නායකගේ ඇඩ්වර්ටයිසින් ෆර්ම් එකේ ඉන්න තවත් එක සේවකයෙක් හැටියට විතරයි. ඒත්... ඒත් එතන හිටපු හැමෝම අතරින් රත්නායක ළඟට මාලිගාට වැදගත් වුණේත්, මාලිගා වැඩියෙන්ම සමීප වෙලා තිබුණේත් සිනිඳු බණ්ඩාරට විතරයි...



WWW.EXPRESSLANKA.TK 102

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

මාලිගාට සිහිය එනකොට හුගක් රෑවුනා. හිමීට ඇරුන ඇස් පිහාටු ගැහෙන කොට මාලිගා දක්කා තමන්ගෙ ඇඳ වටේ කට්ටිය පිරිල ඉන්නවා... දොස්තරලා, නර්ස්ලා, රත්නායක, ශීලා ඇන්ටි, රොහාන්, රොහාන්ගේ තාත්තා වැලිවිට, ඒ හැමෝවම මාලිගා දැක්කා.

"අ... අප්පච් ... චි..."

මාලිගා හිමීට කෙඳිරුවා... රත්නායක මාලිගාගේ ඔළුවට අත තියල තළල සිපගන්න පාත්වුනා. ඒත් අඩ සඳක් වගේ ලස්සනට තිබුණ ඒ තළල් තලය අද රත්නායකට පෙනුණෙ නෑ. මාලිගාගේ තළල වෙළුම් පටිවලින් වෙලලා තිබ්බා. මාලිගා තමන්ගෙ පුරතින් රත්නායකගේ අත හෙමීට අල්ලගන්න හැදුවා. ඒත් එක්කම ආයෙමත් ඇඳ වටේටම ඇස් කරකවල බැලුවා. ආයෙමත් ඒ ඇස්වලට අහුවුණේ ඉස්සේල්ලා දැකපු අයවමයි... ඒත්...

"අ... අප්.... පච්... චි..."

මාලිගා ආයෙමත් රත්නායකගේ අත මිරිකගෙන හිමීට කෙඳිරුවා...

"ඇ... ඇයි මගේ දූ.?."

"අප්... ප... චි...චි... ක්... කෝ.?."

"ක... කවුද...දූ.?."

"ස්... සි... ති... දූ..."

ඇඳ වටේ උන්නු හැමෝම මූණට මූණ බලාගත්තා. සිහිය ආපු ගමන්ම මාලිගා අහපු සිතිදුව එතන උන්නු වෙන කාටවත් වැදගත් වුණේ නැහැ. ඒත් මාලිගාට අප්පච්චි හැරනම සිතිදූ තරමට තමන්ට සමීප වෙන කවුරුවත් මේ ලෝකේ නෑ. ඒක සංසාරේ ඈත පුරාණේ ඉඳන් ආව ආත්මීය බැඳීමක්. මේ ඒ වන්දනීය පාරමිතාවක අවාසනාවන්ත හමුවීමක්... රත්නායක වාට්ටුවෙන් පිට තනිවෙලා උන්නු සිතිදුව අතින්ම අල්ලගෙන මාලිගාගේ ඇඳ ළඟට එක්කරගෙන



WWW.EXPRESSLANKA.TK 103

ආවා. එතන හිටපු හැමෝම සිනිදූ දිහා බැලුවෙ අමුතු විදිහට. ඒත් සිනිදූ එතන උන්නු කා දිහාවත් බැලුවෙ නෑ... සිනිදූගේ ඇස් ඇඳේ වැතිරිලා ඉන්න මාලිගා දිහාවට ගියා..

"ම... මාලිගා..!"

හිතින් එහෙම එකපාරටම කියවුණාට කටින් ඒ වචන එළියට ආවේ නෑ... මාලිගාගේ නළල වෙළුම් පටිවලින් වෙළලා තියෙනවා සිනිදූගෙ ඇස්වලට අහුවුණා... ඒ ඇස් හතර හමුවුණා. වෙනදා වගේ මාලිගාගේ මූණට සුපුරුදු හිනාව ආවේ නෑ... ඒ වෙනුවට ඇස්වලට කඳුළු ආවා. ඒ රතුපාට වුන තොල්පෙති හරියට ඇරන්නැතුව මොනවදෝ කියාගන්න බැරුව වෙව්ලනව වගේ සිනිදූට පෙනෙනකොට. සිනිදූට මාලිගාව බදාගෙන අඬන්න හිතුනා. ඒත් හිත ඇතුළේ නෙරපෙන හැම හැඟීමක්ම හිරකරගෙන සිනිදූ මාලිගාගේ මූණ දිහා බලන් උන්නා. ඇස් පිහාටු ගහන්නැතුව සිනිදූ දිහා බලන් ඉන්න මාලිගාගේ ඇස්වල කියාගන්න බැරි හුඟක් දේවල් ලියවිලා ... තවත් ඒ මූණ දිහා බලන් ඉන්න සිනිදූට පුළුවන් වුනේ නෑ... සිනිදූ ඇස්වල කඳුලු පුරෝගෙන ආපහු එළියට එන්න හැරුණා. ඒ එක්කම මාලිගාගේ ඇස්දෙක ඇතුලෙ හලියපු කඳුළු බිංදු එකපාරටම කම්මුල් දිගේ පහළට කඩාගෙන වැටුනා.

❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊ ❊

ටික වෙලාවක් යනකොට ශීලා ඇන්ටියි, රොහානුයි, මිස්ටර් වැලිවිටයි මාලිගා හිටපු කාමරේ ඇතුලෙ ඉඳන් එළියට ආවා. රොහාන් ඉස්සරහ හිටගෙන උන්නු සිනිදූව දක්ක ගමන් සිනිදූ දිහා ඔරවල බලනව සිනිදූට පෙනුන් නෑ... සිනිදූ හිටියේ බිම බලාගෙන කල්පනා කර කර. ඒ එක්කම රත්නායකත් එළියට ආවා.

"අපි දැන් යමු පුතා... උදෙන්ම එමු..."

රත්නායක සිනිදූගෙ පිටට අත තියලා කිව්වා. මේ කරුණාවන්ත මනුස්සයගෙ දයාබරත්වය සිනිදූට දරාගන්න බැහැ. සිනිදූ වාඩිවෙලා



WWW.EXPRESSLANKA.TK 104

හිටපු තැනින් නැගිට්ටා.

"ස... සර් මං තව පාරක් මාලිගා මිස්ව බලල එන්නද.?."

සිනිදු බොහොම අමාරුවෙන් වචන එකතු කරගෙන රත්නායකගේ ඇස්දිහා බලාගෙනම ඇහුවා.

"යන්න පුතා..."

රත්නායක එහෙම කිව්වෙ හැමදෙයක්ම තේරුම් අරගෙන. මාලිගාගේ එකම පැතුම, එකම සැනසීම සිනිදු බව රත්නායකට අද හොඳටම තේරුම් ගියා. එත් මාලිගා හිතන්න බැරි තරම් වේගයකින් කාරෙක පැදගෙන එන්න තරම් මාලිගාට තිබුණ ප්‍රශ්නෙ මොකක්ද...?

රත්නායකට වගේම සිනිදුගේ හිතෙත් තාම උත්තරයක් හොයාගන්න බැරුව තිබුන එකම ප්‍රශ්නෙ ඒ...

සිනිදු මාලිගා ඉන්න ඇඳ ළඟට එනකොට මාලිගාගේ ඇස් බාගෙට පියවිලා තිබුණා. ඒ ඇස් පිහාටු හිමීට 'ආයෙමත් ඇරෙන කොට.....

"ස්... සිනිදු..."

මාලිගා සිනිදුගේ මූණ දිහා බලාගෙන හිමීට කෙඳිරුවා.

"ඔ.. ඔයාට මොකද වුනේ මාලිගා...?"

සිනිදු බිඳිලා ගිය කටහඬින් ඇහුවා... දෙන්නගෙම ඇස්වලින් කඳුළු කඩාවැටෙනකොට සිනිදුගේ ඇඟිලි තුඩු සිනිදුටත් නොදනීම මාලිගාගේ ඇඟිලි අතරට ගියා. මාලිගා ඒ ඇඟිලි තදින් මිරිකල අල්ල ගත්තා. සිනිදුව තමන්ගේ කරගන්න පෙරුම් පිරුව එක මොහොතක්වත් මෙහෙම සමීප වෙන්න මාලිගාට ලැබුනනම්..? ඒත්...

"ම... මාලිගා කි... කියන්න ඇයි ඔයා ඔය තරම් හයියෙන් ඩ්‍රයිව් කරගෙන ආවේ? මොකක්ද මාලිගා ඔයාට තිබුණ ප්‍රශ්නෙ...?"

සිනිදු එහෙම අහනකොට මාලිගාට තමන්ගේ ඇඟිලි තුඩුවලින් මිරිකගෙන හිටපු සිනිදුගේ ඇඟිලි අතහැරුනේ ඉබේටම. හිත ඇතුලේ තෙරපුන හැම හැඟුමක්ම කඳුළුත් එක්ක දියවෙලා ඇස්වලින් එළියට ආවා...



WWW.EXPRESSLANKA.TK 105

"මාලිගා... ඇ... ඇයි...? මං ඔයාගේ හිත රිදෙව්වා නේද...? කියන්න.?."

මාලිගාගේ කඳුළු බේරෙන ඇස් දිහා බලාගෙනම සිතිඳු ඇහුවෙ ආයෙමත් මාලිගාගේ අතින් අල්ලගන්න ගමන්. මාලිගා 'නැහැ' කියන්න වගේ ඔළුව දෙපැත්තට හෙලෙව්වා. ඒත් ඒ අහිංසක මූණේ තිබුණ වේදනාකාරී බව හංගන්න මාලිගාට පුළුවන් කමක් නැහැ.

"මාලිගා ඔයා බය වෙන්නපා... ඔයාට ඉක්මණට සනීප වෙනවා..."

"සිති... දූ..."

මාලිගා ආයෙමත් මොනවදෝ කියන්න තොල් මැතුරුවා...

"ම.... මට... ඔ... ඔයාගෙන්..."

"ඔ... ඔව්...."

ඒත් මාලිගාට හිමීට කොඳුරන්න ලැබුණේ ඒ වචන දෙක විතරයි. එතකොටම' කාමරේ භාරව හිටපු නර්ස් එකපාරටම සිතිඳු ළඟට ආවා.

"මිස්ටර් මේ පේෂන්ට දැන්ම කතා කරන්න දෙන්න හොඳ නෑ... මෙයාට දැන් නිදියන්න දෙන්න ඕන..."

නර්ස් කිව්වේ මොකක්ද කියල තෙරුම් ගන්න සිතිදුට අමාරු වුන් නැහැ. සිතිඳු ආයෙමත් මාලිගාගේ මූණ දිහා බලල...

"ම... මාලිගා අපි හෙට කතා කරමු... ඔයා දැන් නිදියගන්න..."

කිව්වේ දුක්බර විදිහට.

"මං උදෙන්ම එන්නං ඔයාව බලන්න..."

දෙන්නගෙම පැටලිලා තිබුණ ඇඟිලි තුඩු හිමීට ලිහිල් වුනා. සිතිඳුගෙ ඇඟිලිතුඩු වලින් මාලිගාගේ ඇඟිලි තුඩු අතහැරෙන කොට මාලිගාගේ මුණෙන් පෙනුන ආයාචනාත්මක බව... සිතිඳුගේ පපුව දාලා පිච්චිලා යනව වගේ වුණා. සිතිඳු තමන්ගේ ඇස් මාලිගාගේ ඇස් වලින් ඉවතට අරගෙන කාමරෙන් පිටවෙන්න හැරුණා. රතුපාට තොල් පෙති මොනවදෝ කෑ ගහලා කියන්න හදනව වගේ වෙව්ලද්දි මාලිගාගේ ඇස් ඇතුළට ආව කඳුළු වතුර රෝස කම්මුල් දිගේ පහළට



WWW.EXPRESSLANKA.TK 106

කඩාගෙන වැටුණා. සිනිදු කාමරයෙන් පිටවෙන තැනදී ආයෙමත් හැරිල බලන්නැතුවම එළියට එනකොට රත්නායක මාලිගාගේ තනියට තියපු ගෙදර වැඩ කරන මැගීට මොනවද කියමින් උන්නා... මැගී ඊට පස්සෙ කාමරේ ඇතුලට ගියා. මුවගේම එළිය කරපු මිණි පහන ඉස්පිරිතාලෙක ඇඳක් උඩ තියල කළුවර වුණ ගෙදරට යන්න රත්නායක සිනිදුත් එක්ක ආපහු හැරුණා.

❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈

කාරෙක පෝටිකෝව යටට ගෙනත් නතර කළාට රත්නායක වාහනෙන් බැස්සෙ නෑ. රත්නායක ස්ටියරින් වීල් එකට ඔළුව තියාගත්තා. සිනිදුත් කාරෙකෙන් බහින්නැතුව රත්නායක දිහා බැලුවා. රත්නායක ඉකි බිඳිනවා...

"දුක්වෙන්නෙපා සර්... මාලිගා මිස්ට ඉක්මණට සනීප වේවි..."

තමන්ගේ හිත ඇතුළෙ තියෙන දුක හංගගෙන සිනිදු රත්නායක සනසවන්න එහෙම කිව්වා.

"ම... මට මේ වාහනෙන් බැහැලා ගේ ඇතුළට යන්න හිතත් නෑ පුතා... මගේ රත්තරන් කෙල්ල ඉස්පිරිතාලෙ ඇඳක් උඩ තියලා ඇවිත් මට මේ ගෙයි ඇතුළෙ නිදිය ගන්න පුළුවන්ද...?"

රත්නායක හැඬුම්බර හඬින් කියවගෙන යන දේවල් දරාගන්න බැරුව සිනිදු අහක බලාගත්තා. සිනිදුගේ ඇස්වලට ආයෙම කඳුළු බිංදු පිරුණා.

"මං මොනවද දෙයියනේ දන් මගේ නංගිට කියන්නෙ.?. මං එයාට වුන පොරොන්දුව..?."

රත්නායක කියපු ඒ වචන පෙළත් එක්කම සිනිදුව එකපාරටම කරකවල අත ඇරියා වගේ වුනා. සිනිදු ඒ එක්කම රත්නායක දිහා බැලුවා. රත්නායක හිමීට ඔළුව ඉස්සුවා.

"ඇ... ඇයි පුතා... උ.. උඹ පුදුමෙන් වගේ මගේ දිහා බලන්නේ.?."



WWW.EXPRESSLANKA.TK 107

රත්නායක ඇහුවේ හිමීට... සිනිදු කතා නැතුව හිටපු ඉරියව්වෙන්ම බලන් උන්නා.

"උඹට මං කියපු දේවල් තේරුම්ගන්න බැරිවුණා නේද...?"

"ඔ... ඔව් සර්... මට තේරුන් නැහැ සර් මොනවද කිව්වෙ කියල..."

"මං උඹට තේරුම් කරල දෙන්නම් පුතා... උඹට පුළුවන්ද තව ටිකක් මාත් එක්ක එළියට වෙලා ඉන්න...?"

රත්නායක සිනිදුගෙ උරහිසට අත තියල ඇහුවා. රත්නායකගේ ඇස්වල කඳුළු සිනිදුට පැහැදිළිව පෙනුනා.

"එළිවෙනකම් වුණත් ඉන්නම් සර්... මටත් අද නින්ද යන්නැහැ..."

සිනිදුගේ හඬේ තිබුණ දුක්බර බව රත්නායකගේ පපුවට දැනුණා... දෙන්නා වාහනෙන් බැහැලා හිමින් හිමින් වත්ත කෙළවර තියෙන සුදුපාට ගල් බංකුව දිහාවට ඇදුණා... සිනිදුට එකපාරටම මතක් වුණේ මීට දවස් කිහිපයකට ඉස්සර වෙලා මාලිගා එක්ක මේ ගල් බංකුව උඩ රෑ තනිවෙලා හිටපු හැටි. ඒත් අද එදා වගේ මාලිගා මේ බිමේ නෑ... එදා ලස්සනට පායල තිබුණ හඳ අද කළු වලාකුළු වලින් වැහිලා ගිහිල්ලා...

"වාඩිවෙයන් පුතා..."

රත්නායක සිනිදුගේ උරහිසට අත තියල හිමීට කිව්වා. දෙන්නම ගල් බංකුව උඩින් ඉඳගත්තා.

"උඹේ හිතට ආව ප්‍රශ්නෙට මං දන් උත්තර දෙන්නම්... පුතා... ඒත් ඒ කතාව උඹට කොහොම කියන්නද කියල මං දන්නැහැ."

රත්නායක නළල රැළි කරගෙන තත්පර තුන හතරක් සිනිදුගේ මූණ දිහා බලන් උන්නා. ඒ එක්කම අයෙමත් රත්නායකගේ ඇස්වලට කඳුළු එන හැටි සිනිදුට පෙනුණා.

"පුතා උඹ අද වෙනකම්ම දනගෙන හිටියෙ මාලිගා මගේම දුව කියල නේද...? නෑ පුතා... මාලිගා මගේම ලේ වලින් ඉපදුන කෙනෙක් නෙමෙයි... මාලිගා මගේ එකම නංගිගේ දුව..."



WWW.EXPRESSLANKA.TK 108

රත්නායක එහෙම කියනවත් එක්කම සිහිදුගේ ඇස් ලොකුවෙලා ගියා. සිහිදු පුදුම වෙලා රත්නායකගේ මූණ දිහා බලන් උන්නා. රත්නායකගේ ඇස්වල තිබුණ කඳුළු කම්මුල් දිගේ පහළට වැටුණා.

"උඹට පුදුමද පුතා...? උඹ පුදුම වුණාට මං කිව්වේ ඇත්ත.. මං මගේ පණටත් වැඩිය මගේ නංගිට ආදරේ කෙරුවා. එයාව හොඳ මහත්තයෙකුට අපි කසාද බන්දලා දුන්නා. ඒ දෙන්නා ලස්සන කුරුළු ජෝඩුවක් වගේ ආදරෙන් හිටියේ. ඒ දෙන්නට ලස්සන කුරුළු පැටියෙක් හම්බවුණා. ඒ ගොල්ලන්ට හැම සැම සම්පතක්ම තිබුණ පුතා... ඒත්... ඒත් පුතා ඒ දෙන්නට වැඩි කාලයක් මේ ලෝකේ ජීවත් වෙන්න වාසනාවක් තිබුණේ නැහැ. මාලිකාට අවුරුදු තුනක් වෙද්දි ඒ දෙන්නම ඇක්සිඩන්ට් එකකින් නැතිවුණා පුතා... පුංචි මාලිකාව තනි කරල ඒ දෙන්නා මේ ලෝකෙන් ගියා..."

සිහිදුට රත්නායකගෙන් අහන්න තුනක් දේවල් හිතට ආවා. ඒත් සිහිදු මොනවත් ඇහුවේ නැ. සිහිදු අදහගන්න බැරි කතාවක් අහගෙන ඉන්නව වගේ රත්නායක කියන දේ අහගෙන උන්නෙ මූණ විශ්මයෙන් පුරවගෙන.

"මාලිකාගේ තාත්තා ඇක්සිඩන්ට් එක වුන තැනදීම නැතිවුණා. ඒත් මගේ නංගි හොස්පිටල් එකේ දවස් කීපයක් ජීවිතයත් මරණෙත් එක්ක සටන් කෙරුවා. එයා මගෙන් මැරෙන මොහොතෙදි ඉල්ලපු එකම ඉල්ලීම තමයි පුතා... මාලිකාව තමන්ගේ දරුවා විදිහට හදාගන්න කියන එක... එයාට කවදාවත් කිසිම දුකක් දෙන්න ඉඩ තියන්නෙපා කියලා මගෙ නංගී අන්තිම හුස්ම පිට කරන්න ඉස්සර වෙලා මගෙන් ඉල්ලුවා... මං ඒ ඉල්ලීම ඒ විදිහටම අද වෙනකම්ම ඉටු කලා පුතා... ඒත් මං අද ඉදන් මොනවද පුතා මගෙ නංගිගේ පින්තූරේ දිහා බලාගෙන එයාට කියන්නෙ.?."

රත්නායක අත් දෙකින්ම මූණ වහගෙන ඉකිබින්දා... පොඩි දරුවෙක් වගේ වැලපෙන මේ පාංශු දේහධාරී මිනිසා දිහා තව දුරටත් තිහඬව බලන් ඉන්න සිහිදුට පුළුවන් වුණේ නැ...



WWW.EXPRESSLANKA.TK 109

"දුක්වෙන්නෙපා සර්... මාලිගා මිස්ට අපි කොහොමහරි ඉක්මණට සනීප කර ගමු..."

සිතිදුගෙ දයාබර වචන රත්නායකගේ පපුව ඇතුළටම ගියා. ඒත්... රත්නායක හිමීට ඔළුව උස්සල ආයෙමත් සිතිදුගේ මූණ දිහා බැලුවා...

"න්... නෑ පුතා... මාලිගාව අපිට කවදාවත් සම්පූර්ණයෙන්ම සනීප කරගන්න ලැබෙන්නැහැ. මගෙ අහිංසක කෙල්ලට ආයෙමත් මේ මහ පොළොවේ පය ගහල ඇවිදින්න පුළුවන් වෙන එකක් නෑ පුතා..."

සිතිදුට එකපාරටම ගල් මංකුවෙන් නැගිටුණා. රත්නායක ආයෙමත් මූණ අත් දෙකින් වහගත්තා...

"සි... කියන්න සර්.!. මාලිනා මිස්ට මොකද වෙලා තියෙන්නේ?"

සිතිදු රත්නායකගේ උරහිස් දෙකින් 'අල්ලගෙන පාත්වෙන ගමන් ඇහුවා. රත්නායක ඔළුව උස්සලා සිතිදු දිහා බැලුවා.

"මාලිගාගේ වම් කකුල බෙහෙත්දාලා හොඳ කරන්න බැරි විදිහට වැමේජ් වෙලා... කකුලෙ දණ හියෙන් පල්ලෙහා කොටස කපලා අයින් කරන්න වෙනව කියල ඩොක්ටර් එදිරිසිංහ කියනවා පුතා... මගෙ සුරංගනාවියක් වගේ හිටපු කෙල්ල අබ්බගාතයෙක් වෙනව මං බලන් ඉන්නෙ කොහොමද කියල කියපං පුතා..."

රත්නායක සිතිදුව බදාගෙන ඉකිබින්දා... සිතිදු ඒ දුක රත්නායකත් එක්ක බෙදාගන්න තත්පර ගාණක්ම ඒ විදිහටම උන්නා... දෙන්නගෙම ඇස්වලින් වැටුණ කඳුළු බිංදු... කම්මුල් වලින් තණ පියස්ස උඩට වැටුණා... අකුණු සියදහස් ගණනින් ඔළුව ඇතුලෙ පුපුරනකොට තමන්ට ජීවිතය දුන්න දෙවිදුව ඉස්පිරිතාලේ ඇඳක තනිවෙලා ජීවිතය විඳවන හැටි සිතිදුට මැවිලා පෙනුණා...



WWW.EXPRESSLANKA.TK 110

# 09

උදේ ඉර පායගෙන ආවේ වෙනදා විදිහටම වුණාට සිනිදුට එහෙම හිතුන් නෑ... රත්නායකලගෙ ගෙදර නැවතුන දවසෙ ඉඳන්ම උදේට දකපු ඒ 'තරු පොකුරු හිනාව' අද දකින්න නෑ. අද මේ ගේ විතරක් නෙමෙයි, මුළු පරිසරයම පාළුයි. වත්ත පුරා මල් පිපිල තිබුණාට ඒ මලුත් වෙනදා වගේ පිපිල ඉන්නෙ සතුටින් නෙමෙයි කියලා සිනිදුට හිතුණා.

රත්නායකත් එක්ක ඉස්පිරිතාලෙට යන්න කාරෙකට නැග්ගම ආයෙමත් සිනිදුගෙ හිතට හුඟක් දේවල් ආවා. සිනිදුට වත්තෙන් එළියට ඇදෙන කාරෙකේ පැති වීදුරුවෙන් ඔළුව දාලා ගෙයි බැල්කනිය දිහා බැලුණේ ඉබේටම... අද ඒ බැල්කනිය පාළුයි... වෙනද වගේ උදේ රත්නායකත් එක්ක ඔෆිස් යනකොට බැල්කනියට ඇවිල්ල මූණ හිනාවෙන් පුරෝගෙන අත වනපු ඒ දඟකාරි අද මේ බිමේ නෑ...

කාරක වේගයෙන් ඉදිරියට ඇදුණා. සිනිදුට මාලිගා දකිනකම්, මාලිගා එක්ක ආයෙමත් කතා කරනකම් ඉවසුමක් තිබුන් නැහැ. ඒත්



WWW.EXPRESSLANKA.TK 111

ඉස්පිරිතාලෙට ආවට පස්සෙ ඒ හැම බලාපොරොත්තුවක්ම බිඳිලා ගියා. මාලිගාව දකින්න ලැබුණට එක වදනක්වත් නිදහසේ කතා කරන්න පුළුවන් කමක් නෑ... මාලිගා තමන්ව වටකරගෙන ඉන්න අය අතරින් සිතිදුව දකින්න ඇස් වෙහෙසෙන හැටි සිතිදුට පෙනුණා... සිතිදුගෙ හිත ඇවිලුණා... ඒත් එතකොටම මාලිගා ළඟ හිටපු රත්නායක සිතිදුගෙ පිටට අත තියාගෙන සිතිදුව එක්කගෙන ටිකක් ඉස්සරහට ආවා.

"පුතා... ඔයා දූන් ගිහින් අද දෙන්න තියෙන හදිස්සි වැඩ ටික ඉවර කරන්න... මං වාහනේ එවන්නං පුතාට හවසට හොස්පිට්ල් එකට එන්න..."

රත්නායක සිතිදුගෙ උරහිසට අත තියල කිව්වා. ඒ අණ කිරීමක් නෙමෙයි. සිතිදුට ඒ ඉල්ලීම ඉටුනොකර ඉන්න පුළුවන් කමක් නෑ... මාලිගා එක්ක කතාකරන්න, ඒ හිත සුවපත් කරන්න හිතේ පොදි ගහගෙන ආව බලාපොරොත්තුව ඉටුකර ගැනීම තව පැය ගාණකට කල්ගියා. සිතිදුට මාලිගා ළඟට ළංවෙලා යනවයි කියලා යන්න පුළුවන් කමක් තිබුන් නැහැ. සිතිදු මාලිගා දිහා නොබලාම ආපහු හැරිලා කාමරයෙන් පිටවුණා...

සිතිදු කාමරෙන් පිටවෙනවා මාලිගාගේ ඇස්වලට අහුවුනා. මාලිගා ගැස්සිලා වගේ රත්නායකගේ මූණ දිහා බැලුවා.

"අ... අප්පච්චී... ඈ... ඇයි සිතිදු යන්නේ.?."

"හදිස්සි වැඩ ටික ඉවර කරන්න මං සිතිදුව යැව්වා දූ... එයා හවසට එනවා..."

රත්නායක මාලිගාගේ ඔළුව අතගාන ගමන් කිව්වා. මාලිගාට ඉකිගහන්න ආවා. ඒත් මාලිගා ඒ හැඟීම් හැමෝම ඉදිරියේ හංගගත්තා. ඈ කොහොමත් ඇස් වලට කඳුළු පිරුණා. මියුසික් ක්ලාස් එකේ යාළුවෝ



WWW.EXPRESSLANKA.TK 112

මාලිගාව බලන්න ඇවිත් උන්නා. මාලිගා දිහා බලන් ඉන්න ඒ හැමෝගෙම මූණු මැලවිලා... සංගීත පන්තියෙම හිටපු කිසිම ආඩම්බරකමක් නැති දහකාර බෝනික්කී... අසරණ වෙලා ඉන්න හැටි බලන් ඉන්න එක ඒ අයට දරාගන්න අමාරුයි.

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄

සිනිදු ඔපිස් එකට ගිහින් වැඩ පටන් ගත්තේ හිතකින් නෙමෙයි... ඒ හිතේ වැඩ කරන්න පුළුවන් තරම් හොඳ මානසික මට්ටමක් කොහොමටත් තිබුන් නැහැ. ඒත් හවසට මාලිගා එක්ක කොහොම හරි කථා කරනව කියන බලාපොරොත්තුව හිත ඇතුළෙ තියාගෙන සිනිදු වැඩ ටික කොහොම හරි ඉවර කරගත්තා. හවස හතරයි තිහ වෙනකොට සිනිදුව එක්කගෙන යන්න රත්නායක වාහනේ එව්වා. වේගයෙන් ඉස්පිරිතාලේ වත්තට ඇතුල්වුණ කාරෙකෙන් සිනිදු බැහැගත්තේ ඉවසුම් නැතුව...

ඊට පස්සේ තරප්පු පෙළ නැගල කොරිඩෝව දිගේ සිනිදු වේගයෙන් ඉදිරියට ඇදුණා... මාලිගා හිටපු කාමරේට ඇතුල් වුණාට පස්සේ දකපු දෙයින් සිනිදුගෙ මුළු ඇඟම හිරිවැටිලා ගියා.

මාලිගා හිටපු ඇඳ හිස්වෙලා. සිනිදුගෙ පපුව ගැහෙන්න ගත්තා. සිනිදු කලබලයෙන් වටපිට බැලුවා. එතකොටම...

"මහත්තයා..."

සිනිදු පිටිපස්ස හැරිලා බැලුවා. මැගී..!

"කෝ මැගී මාලිගා නෝනා.?."

"බේබිව වෙන කාමරේකට මාරුකෙරුවා... ලොකු මහත්තයා කිව්වා මහත්තයව එක්කං එන්න කියලා..."



WWW.EXPRESSLANKA.TK 113

සිනිදුගෙ ඇහට ලේ ටිකක් ඉනුවේ එතකොට... සිනිදු මැගීගේ පුටුපස්සෙන් ඉස්සරහට ඇදුණා. මාලිගා ඉන්න කාමරේ දොර ඇරගෙන ඇතුල් වෙනකොට රත්නායක, ශීලා, මිස්ටර් වැලිවිට වගේම සිනිදු අඳුනන්නැති මාලිගාගේ තව නැදෑයෝ වගයකුත් මාලිගාගේ ඇඳ වටේ ඉන්නවා. සිනිදු මාලිගා ඉන්න ඇඳ ළඟට යන්නැතුව එකපාරටම දොර ළඟ නැවතුණා. රත්නායක පිටිපස්ස හැරිලා බැලුවා.

"එන්න පුතා..."

රත්නායක කතා කරනකොට මාලිගාගේ ඇඳ වටේ උන්නු අය මූණට මූණ බලාගත්තා...

"සි නි දූ.!."

මාලිගාට සිනිදුව දැක්ක ගමන් හිතින් ඉබේටම කියවුණා. සිනිදු මාලිගා ඉන්න ඇඳ ළඟට ආවා.

"පුතා වැඩටික ඔක්කොම ඉවර කළාද...?"

"ඔව් සර්..."

"ගුඩ්..."

රත්නායක සිනිදුගේ පිටට තට්ටුවක් දැම්මා. සිනිදු මාලිගාගේ මූණ දිහා බැලුවා. ඒ මූණ පරවෙලා යන රෝස මලක් වගේ...

"සිනිදූ... ඔ.. ඔයා ඔෆිස් එකේ ඉඳලමද ආවේ.?."

මාලිගා හිමීට කෙඳිරුවා.

"ඔව් මිස්"

ඇඳ වටේ උන්නු අය සිනිදුගේ මූණ දිහායි මාලිගාගේ මූණ දිහායි මාරුවෙන් මාරුවට බැලුවා. ශීලා, වැලිවිට දිහා බැලුවා.

"අපි යමුද...?"

"හ්ම්..."

වැලිවිටයි ශීලයි මාලිගාටයි රත්නායකටයි කියල ඉක්මණට කාමරෙන් පිටවුනා. ඇඳ වටේ උන්නු අනිත් අයත් ඒ එක්කම මාලිගාට කියල යන්න සැරසුණා. රත්නායක ඒ අයත් එක්ක කතා කර කරම



WWW.EXPRESSLANKA.TK 114

කාමරේ දොර වහගෙන එළියට ගියා. සිනිදු මාලිගා දිහා හරියටම බැලුවෙ ඊට පස්සේ. රියේ ලේ දෙන්න ගහපු සිරින්ජර් කටු තාමත් ඒ විදිහටම මාලිගාගේ අතේ ඇමිණිලා... ලේ බිංදු බටේ දිගේ මාලිගාගේ ඇඟට ඇතුල් වෙනවා. තරු පොකුරු හිනාව පිපුන්නැති අසරණ මූණෙන් තමන් දිහා බලන් ඉන්න මාලිගාව දක්කම සිනිදුගෙ පපුව ආයෙමත් ගිනි ඇවිලිලා ගියා.

"මං උදේ කියන්නැතුව ගියාට තරහද...?"

"න්... නැහැ..."

මාලිගා එහෙම කියල තත්පර ගාණක් ඇස් පිහාටු ගහන්නැතුව සිනිදුගේ මූණ දිහා බලන් උන්නා. සිනිදුට ඒ බැල්ම දරාගන්න බැහැ.

"සි... නිදු..."

"ම්..."

"මට මොකද සිනිදු වෙලා තියෙන්නේ...?"

"ඔයාට මුකුත් වෙලා නෑ..."

"එහෙනං මෙතනට එන හැමෝම මගේ දිහා අනුකම්පා විදිහට බලන්නේ ඇයි...? මට ඇයි මේ තරම් ලේ දෙන්නේ..? මට මෙ මුකුත් තේරෙන්නේ නෑ සිනිදු... මට මේ කකුල තියෙනවද නැද්ද කියල දනෙන් නෑ..."

මාලිගා කිව්වේ පොරෝනයෙන් වහලා තියෙන් වම් කකුල පැත්තට අත තියලා. සිනිදුගේ ඇවිලිලා තිබුණ පපුවේ ගින්දර තව තවත් ඇවිලිලා මුළු ඇඟම පිච්චිලා යනව වගේ දැනුණා.

"බයවෙන්න එපා... කකුල වුට්ටක් තුවාල වෙලා ඔයාගේ... බෙහෙත් දාල ඉන්ජෙක්ෂන් විදල නිසා ටිකක් හිරි වැටිලා තියෙන්නෙ..."

සිනිදු වගේම අප්පච්චියි, ඩොක්ටර් අංකලුයි අනිත් හැමෝමයි එහෙම කිව්වට තමන්ට ඊට වඩා ලොකු මොකක් හරි වෙලා තියෙන බව මාලිගාට දැනුණා.

"සි.. නි.. දු..."



WWW.EXPRESSLANKA.TK 115

"ම්."

"මට බයයි..."

"මොකටද...?"

මාලිගා තව මුකුත් කිව්වෙ නෑ. ඇස්වලින් ආව කඳුළු කම්මුල් තෙමාගෙන දෙපැත්තෙන් ගලාගෙන ආවා. සිනිදු තමන් ඉදිරියේ අසරණ වෙලා බලන් ඉන්න දෙව්දුව දිහා බලන් උන්නේ ඇස්වල කඳුළු පුරෝගෙන... සිනිදුට තමන්ගේ මුළු ඇඟම වෙව්ලනවා වගේ දැනුණා.

"බයවෙන්නෙපා මාලිගා... ඔයාට මුකුත් වෙන්නැහැ... ඔයාට ඉක්මණට සනීප වෙනවා..."

"න්... නැහැ... සිනිදු නෑ..."

මාලිගා සිනිදුගේ අතින් හයියෙන් අල්ලගෙන ඒ ඇඟිලි තුඩුවල තමන්ගේ ඇඟිලි තුඩු හිරකර ගත්තා. ඇස්වලින් එන කඳුළු වැල් වලට නැවතුමක් තිබුන් නැහැ. සිනිදුට මේ දුක දරාගන්න බැහැ. සිනිදු ජීවිතේ පළවෙනි වතාවට මාලිගාගේ රෝස කම්මුල් දෙක තමන්ගේ දෝතින්ම අල්ලගෙන මාලිගාගේ මූණට එබුණා...

"මාලිගා... ඔයා කාටවත් වරදක් කරපු කෙනෙක් නෙමෙයි... ඔයා දෙව්දුවක්... ඔයාට මුකුත් වෙන්නෑ..."

හීනෙකින්වත් නොහිතපු විදිහට සිනිදු තමන්ගේ කම්මුල් දෙකට අත තියලා කියනකොට මාලිගාට දරාගන්න බැරිවුණා. මේ දයාබර උණුසුම තමන්ට උරුම දෙයක් නෙමෙයි... දන් සිනිදු නියා තමන්ට තමන්ගේ ජීවිතේවත් උරුම නෑ... මාලිගාට හිතුණා.

"මාලිගා ඔයා මොකක්ද ඊයේ මගෙන් අහන්න හැදුවේ...?"

සිනිදු එහෙම ඇහුවට මාලිගා උත්තර දුන්නැහැ. ඇස් පිහාටු වේගයෙන් ගැහෙද්දි මාලිගා සිනිදුගේ මූණ දිහා එක එල්ලෙම බලාගෙන උන්නා.



WWW.EXPRESSLANKA.TK 116

"ඇයි කතා කරන්නැතුව ඔය විදිහට බලන් ඉන්නේ...? කියන්න මාලිගා ඔයා මොකක්ද ඊයේ මගෙන් අහන්න හැදුවේ...?"

සිනිදු ඇහුවෙ ආයෙමත් මාලිගාගේ අතින් අල්ලගන්න ගමන්. මාලිගාගේ ලේ නහරවැල් දිගේ දුවන වේදනාව සිනිදුගේ හදවතට දැනුණා.

"දැන් වැඩක් නැහැ සිනදූ..."

"ඒක ඊයේ කියන්න බැරි වුණාට පස්සෙ වැඩක් නැද්ද...?"

"න්... නැහැ..."

"එහෙනං.?."

"මට දැන් මාවවත් වැඩක් නැහැනේ"

"මොනවද ඔය ආයෙමත් කියන්නෙ? ඔයාට මුකුත් වෙලා නැහැ මාලිගා... කි... කියන්න ඔයා මොනාද ඊයේ මගෙන් අහන්න හැදුවේ.?."

මාලිගා ඇස් දෙක සිරින්ජ්ර් කටු 'විදපු නැති දකුණු අතින් වහගත්තා. ඒ අත යටින් ගලාගෙන එන කඳුළු කොට්ටෙ පොඟාවගෙන යන හැටි සිනිදුට පෙනුණා.

"මාලිගා ඔයාට කියන්න බැරිද? මං ආවේ ඔයාව අඬවන්න නෙමෙයි... ඔයාට මං මෙතන ඉන්න එක වේදනාවක් නම් මං යන්නං..."

සිනිදු ආපසු හැරුණා. මාලිගාගේ ඇස් දෙක වහගෙන හිටපු අත පහළට වැටුණා.

"සි.. නි.. දූ.!."

පපුව පැලෙන්න එන වේදනාවකින් අමතපු ඒ හඬ සිනිදුගේ හදවත හිල් කරගෙන ගියා. සිනිදු ආයෙමත් මාලිගා දිහාවට හැරුණා. ඒ ඇස් පිහාටු තාමත් වේගයෙන් ගැහෙනවා.

"සිනිදූ..."

මාලිගා ආයෙමත් ළඟට ආව සිනිදුගේ අත් දිගේ තමන් ගේ ඇඟිලිතුඩු යවන ගමන් මිමිණුවා. සිනිදු අහක බලාගෙන උන්නා...

"සිනිදු කි... කියන්න ඔයා මං අහන දේට කෙලින්ම උත්තර දෙනවද...?"



WWW.EXPRESSLANKA.TK 117

මාලිගා හුහාක් දුක්බර විදිහට අහනකොට සිනිදු ආයෙමත් මාලිගාගේ මූණ දිහා බැලුවා.

"ඔව..! අහන්න..."

මාලිගා ආයෙමත් කතා නැතුව තත්පර ගාණක් සිනිදුගෙ ඇස් දෙක දිහා බලන් උන්නා. ඊට පස්සේ...

"සිනිදු... කි... කියන්න සිනිදු ඔයා මට ඇලකුවෙ කවුරු විදිහටද...?"

මාලිගා එහෙම අහනකොට සිනිදුගෙ ඔළුවෙ අකුනු එක පිට එක පුපුරනවා වගේ දැනුණා. හදවත තත්පරයකට නැවතුණා වගේ... ඒත් ඒ අහපු දේට උත්තරයක් දෙන්න සිනිදුට අමාරු වුන් නැහැ...

"දෙව්දුවක් විදිහට..."

සිනිදු මාලිගාගේ ඇස් දිහා බලාගෙනම එකපාරටම කිව්වා. ඒ හඬ මාලිගාගේ පපුව හිල්කරගෙන ගියා.

"එ... එනකොට මං ඔයාගේ මිතුරියක් වෙලා හිටියෙ නැද්ද සිනිදු.?."

"හිටියා... ඒත් මං ඔයාට ඊට වඩා ගෞරව කළා මාලිගා..."

"ඔ... ඔයා ඒකද සිනිදු මට මුතු ගැන කිව්වෙ නැත්තේ...?"

"මු... මුතු.!?."

මුළු ලෝකෙම එක තත්පරයකට නැවතුනා වගේ සිනිදුට දැනුණා. සිනිදුගේ උගුරකට වේලිලා ගියා. හීනෙකින්වත් හිතපු නැති දෙයක් අහපු මාලිගාගේ මූණ දිහා සිනිදු බලන් උන්නේ ඇස් දෙක විශ්මයෙන් පුරෝගෙන. සිනිදුගේ අසරණ වුණ මූණ දිහා මාලිගා ඇස් පිය ගහන්නැතුව බලන් උන්නා. ඒ තොල්පෙති වෙව්ලනකොට...

"ම... ඔයා ඕකද ම... මාලිගා මගෙන් අහන්න හිටියේ...?"

සිනිදු ඇහුවේ ගැහෙන හදවතින්...

"ම... ඔව..."

මාලිගා ඒ ඇස් මගහරින් නැතුවම වේදනාවෙන් උත්තර දුන්නා.

"ඔයාට කවුද ඕව කිව්වේ?"



WWW.EXPRESSLANKA.TK 118

"කවුරු කිව්වත් ඒක ඇත්ත ත්... නේද...?"

"ඔ... ව්..."

සිනිඳු හුහක් අමාරුවෙන් ඒ වචනෙ පිටකළේ අහක බලාගෙන. ඒ එක්කම පපුව පැලිලා තමන් මැරෙන්න එනව වගේ වේදනාවක් මාලිගාට දැනෙනකොට...

"ඉ... ඉතිං... ඇයි මට මුතු ගැන කිව්වෙ නැත්තෙ සිනිඳු?"

මාලිගා වේදනාවෙන් එහෙම ඇහුවට සිනිඳුගෙ උගුරෙන් එකපාරටම වචන එළියට ආවේ නෑ... කඳුළු බිංදු ඇස් ඇතුලෙ නලියද්දි සිනිඳු අහක බලාගෙනම උන්නා. මාලිගා ආයෙමත් සිනිඳුගෙ අතින් අල්ලගන්න හැදුවා...

"ක... කථාකරන්න... සි... නි... ඳු... ඇයි ඔ... ඔයා.. මට ඒ ගැන කිව්වෙ නැත්තේ...?"

සිනිඳු මාලිගාගේ මූණ දිහා බැලුවෙ නෑ. ඒ ඇස් කඳුළු වලින් බොඳවෙලා තිබුණේ...

"මට සමාවෙන්න මාලිගා..."

"නැහැ... ඔයා සමාව ඉල්ලන්න වරදක් කරල නැහැ සිනිඳු..."

"නැහැ... මං වැරදියි"

"නෑ... ඔ... ඔයා මට වරදක් කරල නැහැ..."

මාලිගා දුක්බරව කියන ඒ වචන සිනිඳුට දරාගන්න බැහැ. සිනිඳු ආපහු මාලිගාගේ මූණ දිහා බැලුවා. ඇස්වලින් ගලාගෙන එන කඳුළු රෝස කම්මුල් තෙමාගෙන යනවා සිනිඳු ආයෙමත් දැක්කා. සිනිඳුගෙ ඇස් ඇතුළේ තිබුනු කඳුළු මාලිගාට පෙනුණා. දෙන්නම ආයෙමත් තත්පර ගාණක් කතා නැතුව මූණට මූණ බලන් උන්නා. කියාගන්න බැරි හුහක් දේවල් ඒ මූණු දෙකේ ඇඳිලා තිබුණා. ඒත්...

"සි.. නි.. ඳු..."

මාලිගා හිමීට කතා කරනකොටම සිනිඳුගෙ ඇස් ඇතුලෙ තිබුණ



WWW.EXPRESSLANKA.TK 119

කඳුළු බිංදුවක් මාලිගාගේ අත උඩට වැටුණා.

"ඇ... ඇයි සිනිදු ඔයා මුතුට රිද්දුවේ...? කියන්න... ඔයා ඇයි මුතුගෙන් ඈත්වෙලා ඉන්නේ කියලා...?"

"මං එයාට වරදක් කරලා නැහැ මාලිගා... එයයි මාව බොරුවට සැක හිතුවේ..."

"මො... මොකටද...?"

මාලිගා එහෙම ඇහුවට සිනිදුට එකපාරටම කතා කරගන්න පුළුවන් වුනේ නෑ... සිනිදුගෙ ඇස් පිහාටු වේගයෙන් ගැහෙද්දි මාලිගා ඒ ඇස් දිහාම බලන් උන්නා.

"කි... කියන්න සිනිදු... කවුරු හින්දද මුතු ඔයාව සැක කළේ...?"

"ඒකට කවුරුවත් වැරදි නැහැ... එ... ඒත් එයා අපි දෙන්නව සැක කළා.,."

"අ... පි... දෙන්නව.?.!"

"ඔ... ඔව්..."

මාලිගාට ආයෙමත් අතින් ඇස් දෙක වහගැනුනේ ඉබේටම. ඒ ඇස් යටින් කඳුළු ගලන් එනවා සිනිදුට ආයෙමත් පෙනුණා.

"මා.ලි.ගා..."

සිනිදු මාලිගාගේ ඒ අත උඩින් තමන්ගෙ අත තිබ්බා... මාලිගාගේ ඇස් වලින් ගලාගෙන එන උණු කඳුළු සිනිදුගෙ ඇඟිලි තුඩු සෝදගෙන පහළට වැටුණා.

"සිනි.. දු..."

"ම..."

"මි... මට සමාවෙන්න සිනිදු..."

"මොකටද...?"

"මං හින්දා නේද ඔයයි මුතුයි ඈත්වුණේ?.."

"න්... නැහැ"

"ඇයි එහෙම කියන්නේ...? මු... මුතු... මාව සැක කරපු එක



WWW.EXPRESSLANKA.TK 120

සාධාරණයි සි.. නි.. දූ..."

මාලිගාගේ ඒ වචන සිනිදූට දරාගන්න බෑ... සිනිදූ අසරණ වුණු මූණෙන් ඒ අහිංසක ඇස් දෙක දිහා බලන් ඉන්නවා....

"සි..නිදූ..."

"ම්..."

"මං ඔයාගෙන් එක ඉල්ලීමක් කරන්න ඔයා ඒක ඉටුකරනවද...?"

"මො... මොකක්ද?"

"ඔ... ඔයා මුහුව බලන්න යන්න...! යනවද...?

ඒ අහිංසක ළමයගේ හිතට දුකක් දෙන්නෙපා සිනිදූ... එයාට කියන්න සිනිදූ මං එයාට දැනගෙන වරදක් කළේ නෑ කියලා..."

තමන්ගෙ පපුව පැලෙන්න තව තත්පරයක්වත් නැහැ කියලා සිනිදූට හිතුණා. ඒ තරමටම හිතට ආව වේදනාව සිනිදූට දරාගන්න අමාරුයි...

"සි.. නිදූ..."

"ම්.."

"මගේ නළලට අත තියල පොරොන්දු වෙන්න සිනිදූ... ඔයා මුහුව බලන්න යනවා කියලා..."

මාලිගා ආයෙමත් සිනිදූගෙ අතින් අල්ලගත්තා. ජීවිතේ මේ තරම් අසරණ වුණ වේදනාබර මොහොතක් සිනිදූට තවත් තිබුන් නැහැ. තමන්ට ජීවිතේ හුහක් දේවල් දීපු දෙව්දුව තමන්ගේ අතින් අල්ලගෙන ඉල්ලන එකම ඉල්ලීමද මේ...?

"සිනිදූ... මං මේ ආත්මේ ඔ... ඔයාගෙන් ඉල්ලන එකම ඉල්ලීම..."

මාලිගා අල්ලගෙන උන්නු සිනිදූගෙ අත තමන්ගේ නළල ගාවට ළංකර ගන්න හැදුවා. ඒත් ඊට ඉස්සෙල්ලා...

"මාලිගා... ඔය නළලට අත තියලා ඔයා වෙනුවෙන් මගේ ජීවිතේ වුණත් පූජා කරනවා කියලා පොරොන්දු වෙන්නම්... ඒ... ඒත්... මට ඔය පොරොන්දුව වෙන්න බැහැ..."



WWW.EXPRESSLANKA.TK 121

"සී... සිනිදු ඔයාට බැරිද...?"

"බැහැ..."

දෙන්නම කඳුළු පුරෝගෙන මූණට මූණ බලන් උන්නා. මුළු කාමරය පුරාම තිබුණ නිහඬතාවය... දෙන්නා හුස්ම ගන්න හඬ පවා දෙන්නටම හොඳටම ඇහුණා. මාලිගාගේ අයාචනාත්මක ඇස් දෙක... ඒ රතු තොල් පෙති වෙව්ලනවා... කඳුළු නැතිව මේ දුක දරාගන්න තරම් සිනිදුගේ සංවේදී හිත ශක්තිමත් වුණේ නැහැ.

"මට සමාවෙන්න මාලිගා... මට දැන් මුතුට ආදරය කරන්න බැහැ..." සිනිදු අමාරුවෙන් කිව්වා... ඒ එක්කම කාමරේ දොර හිමීට ඇරුණා. සිනිදු, ඇස්වල තිබුණ කඳුළු ලේන්සුවෙන් පිහදානවා රත්නායකට පෙනුණා...

❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄ ❄



WWW.EXPRESSLANKA.TK 122

# 10

මාලිගාව තනිකරලා ඉස්පිරිතාලෙන් පිටවෙලා එනකොට සිනිදුගෙ' හිතට ආව දුක... ජීවිතේ මීට කලින් කොයිතරම් දුක් විඳලා තිබුණත් මේ දුක ඒ දුක්වලට සමකරන්න බෑ. ඒත්... කොයිතරම් වේදනාව හිත ඇතුලේ පිරිල තිබුනත් සිනිදු කාරෙක කල්පනාවෙන් පැදෙව්වා. රත්නායක කාරෙකේ පිටිපස්සේ සීට් එකට ඔළුව බරකරගෙන ඇස් දෙක පියාගෙන උන්නා. ඒ මූණේ තිබුණු දුක්බර බව කොයිතරම්ද කියල තේරුම් ගන්න සිනිදුට අමාරු වුනේ නැහැ. රත්නායක සැරෙන් සැරේ ඇස් ඇරල සිනිදු දිහා බැරෑරුම් විදිහට බැලුවා. කාරෙක වත්ත ඇතුලට ඇතුල් වෙනකම් දෙන්නා අතර කතා බහක් කෙරුණේ නෑ. ඒත් රත්නායකට සිනිදුට කියන්න ලොකු දෙයක් තිබුනා.

"පුතා..."

කාරෙක පෝටිකෝව යටට ඇවිත් නතරවුන ගමන්ම රත්නායක කතා කළා. සිනිදු පිටිපස්ස හැරිලා රත්නායකගේ මූණ දිහා බැලුවා. රත්නායක හිතට ආවදේ කියාගන්න බැරුව වගේ සිනිදුගේ මූණ දිහා බලන් ඉන්නවා. ඒ ඇස්වල නළියන කඳුළු සිනිදුට පෙණුනා.

"ඇයි සර්.?."



WWW.EXPRESSLANKA.TK 123

"පු... පුතා..."

රත්නායක ඔළුව කාරෙකේ ඉස්සරහ සීට් එකේ ගහගෙන ඉකිබිඳින්න පටන් ගත්තා. මෙතරම් වෙලා හිත ඇතුළෙ හිරකරගෙන ආව වේදනාව කඳුළු වෙලා ඇස් දෙපැත්තෙන් එළියට පැන්නා. පුංචි දරුවෙක් වගේ ඉකිබිඳින රත්නායක දිහා සිනිඳු බලන් උන්නේ කිසිම දෙයක් හිතාගන්න බැරුව...

"ක... කථා කරන්න සර්... මොකද...?"

"පු... පුතා..."

"ඔ... ඔව් සර්..."

"හෙට ඉඳන් මගේ කෙල්ල කකුලක් නැති අබ්බගාතයෙක් වෙනවා පුතා..."

සිනිඳුට ඇහුනේ රත්නායක ඔළුව උස්සගෙන කියපු ඒ වචන පෙළ විතරයි. ඉන් පසසේ කියපු කිසිම දෙයක් සිනිඳුට ඇහුන් නැහැ. සිනිඳුගේ මුළු ඇඟම හිරිවැටීගෙන ගියා වගේ වුණා. රත්නායක කියපු දේ ගැන මීට කලින් ඩොක්ටර් එදිරිසිංහ අනතුරු ඇඟවීමක් කරලා තිබුණට මේ තරම් ඉක්මණට එහෙම දෙයක් වෙයි කියලා සිනිඳු හීනෙකින්වත් හිතුවේ නෑ...

"එ... එතකොට මාලිගා මිස්ගේ කකුලට මොනවත් නොකර බේරගන්න බැරිද... ස්.. සර්...?"

සිනිඳු එහෙම ඇහුවෙ හිතලම නෙමෙයි, කිසිම දෙයක් හිතාගන්න බැරිවුණ සිනිඳුට ඉබේටම ඒ වචන පෙළ කියවුණා.

"නැහැ පුතා... වෙන කිසිම දෙයක් කරන්න ඉතුරු වෙලා නැහැ කියල ඩොක්ටර් එදිරිසිංහ කිව්වා..."

"ඉ... ඉතිං මොකද සර් අපි දැන් කරන්නේ...?"

"හෙට හවස මාලිගාව ඔපරේෂන් එකට ගන්නවා. ඒත් එයාට මෙහෙම දෙයක් වෙනව කියලා ඊට කලින් දැනගන්න ඉඩ තියන්න හොඳ නෑ පුතා... එයාව පුළුවන් තරං සතුටින් තියන්න අපි උත්සාහ කරන්න ඕනි..."



WWW.EXPRESSLANKA.TK 124

රත්නායක එහෙම කිව්වෙ සිනිදුගේ උරහිසට අත තියලා වේදනාවෙන්. රත්නායකට දෙවෙනි වෙන්නැති වේදනාවක් තමන්ටත් තිබුණාට රත්නායක ඉදිරියේ ඒ වේදනාව පිටකරන්න සිනිදුට පුළුවන් කමක් නෑ... සිනිදු ඒ හැම වේදනාවක්ම තමන්ගේ හිත ඇතුලේ හිරකරගෙන රත්නායක වේදනාවෙන් කියන දේවල් අහගෙන උන්නා.

❁ ❁ ❁ ❁ ❁ ❁ ❁ ❁ ❁ ❁

කොයිතරම් රෑ වෙලා තිබුණත් සිනිදුගේ ඇස්වලට නිදිමතක් ආවේ නැහැ. කිසිම දෙයක් හිතාගන්න බැරුව සිනිදුගේ හිත එහෙ මෙහෙ දිව්වා. තමන්ට ලස්සන ජීවිතයක් දෙන්න මේ ලෝකේ හිටපු දෙව්දුව හෙට්ත් පස්සේ කකුලක් නැති අබ්බගාතයෙක් වෙනව කියන එක පිළිගන්න පුළුවන්ද...? මීත් පස්සෙ ඒ දහකාර ඇස් පිහාටු වේගයෙන් ගහෙද්දී තමන් ළඟින් ඉඳගෙන මාලිගාට ඉස්සර වගේ හිනාවෙන්න පුළුවන් වෙයිද...? කවදාවත් ආයේ එහෙම වෙන එකක් නැහැ. අනිද්දාට තමන් කකුලක් නැති අබ්බගාතයෙක් කියල දැනගත්තම මාලිගා ඒ වේදනාව කොහොම දරාගනීවිද..?. සිනිදුගෙ හිතට ඒ වගේ ප්‍රශ්න හුඟක් ආවා. ඒත් ඒ කිසිම දේකට උත්තර තිබුන්නැහැ. ඒ වෙනුවට සිනිදුගේ ඇස් වලින් උණු කඳුළු කැට කඩාගෙන වැටුනා.

දිග රාත්‍රියක් ඉවර වෙලා පහුවෙනිදට එළිය වැටුනා. එළිවෙන කම්ම නිදි නැතුව කල්පනා කර කර හිටපු සිනිදු උදෙන්ම රත්නායකත් එක්ක ඉස්පිරිතාලෙට ආවා. ඒ එන අතරමගදී රත්නායක සිනිදුට හුඟක් දේවල් කිව්වා. ඒ අතරින් කියපු එක දෙයක් සිනිදුගේ හිත හිල්කරගෙන ඇතුළට ගිහින් තැන්පත් වුණා වගේ.

"සිනිදු... මාලිගාගේ හිත සතුටින් තියන්න පුතා... ඔයාට විතරයි මේ වෙලාවේ එයාගේ හිතට සැනසීමක් දෙන්න පුළුවන්..."

රත්නායක කියපු ඒ වචන සිනිදුගේ හිත ඇතුළෙ දෝංකාර



WWW.EXPRESSLANKA.TK 125

දුන්නා. උදේ මාලිගාව බලන්න පිට කවුරුවත් ඇවිල්ල උන්නේ නෑ. ඒ නිසා සිනිඳුට කෙලින්ම මාලිගා ළඟට යන්න පුළුවන් වුනා. රත්නායක ටික වෙලාවකින් කාමරයෙන් එළියට ගියා ඩොක්ටර් එදිරිසිංහ හමුවෙන්න. ඇඳෙන් නැගිට්ටින්න බැරුව සිනිඳු දිහා අහිංසක විදිහට බලන් ඉන්න මාලිගා සිනිඳුගේ අතකින් අල්ල ගත්තා. ඒ අතේ සීතල සිනිඳුට දැනුනා.

"සි.. නි.. දු..."

"ම්..."

"මොකද ඔය මූණ.?."

"ඈ.. ඇයි මගේ මූණට මොකද වෙලා තියෙන්නේ...?"

සිනිඳු එහෙම ඇහුවේ මාලිගා අහපු දේ නොතේරිලා නෙමෙයි. වෙන කියන්න දෙයක් තිබුනේ නැති හින්දා.

"උදේ කණ්ණාඩිය ළඟට ගිහින් මූණ බැලුවෙ නැද්ද.?."

"නැහැ..."

සිනිඳු එහෙම කියල යන්නමට හිතාවුණා... එත් ඒ හදවතින් නෙමෙයි, ගෙවුන දවස් දෙකේ සිනිඳුට තමන්ගැන හිතන්න වෙලාවක් තිබුනේ නැහැ. මාලිගා එහෙම ඇහුවෙ සිනිඳුගේ මූණ පුරා රැවුල් කොට වැවිලා තිබුණ නිසා.

"සිනිඳු... ඇයි ඔයා ඔහොම ඉන්නෙ...? මට පේන්න ඔහොම ඉන්නෙපා සිනිඳු... මට දුකයි. ඔයා හැමදාම ලස්සනට ඉන්න ඕනි සිනිඳු..."

"ඇයි මං විතරක්.?. එතකොට ඔයා... ඔයත් මට පේන්න හැමදාම පුංචි දෙව්දුවක් වගේ ඉන්න ඕනි... තේරුණාද...?"

සිනිඳු එහෙම කිව්වම මාලිගාට ඒ වචන දරාගන්න බැරිවුණා. මාලිගා ඇස් පිහාටු වේගයෙන් ගැහෙද්දී එකවල්ලේම සිනිඳු දිහා බලන් උන්නා. ඒ ඇස් ඇතුළට කඳුළු බිංදු ආයෙමත් එනවා සිනිඳුට පෙනුණා.

"ඇයි මාලිගා...?"



WWW.EXPRESSLANKA.TK 126

මාලිගා සිනිදුගේ ඇඟිලිතුඩු අතර තමන්ගේ ඇඟිලි තුඩු හිරකර ගත්තා.

"සිනි..දු..."

"ම්.?."

"ඔයා මං කරපු ඉල්ලීම ඉටු කරන්නැද්ද...?"

"න්... නැහැ..."

සිනිදු උත්තර දුන්නේ අහක බලාගෙන

"ඇයි සිනිදු... ඒ...?"

"මගෙන් ඒ ගැන අහන්නෙපා මාලිගා... මං ඔයාගෙන් එක ප්‍රශ්නයක් අහන්නද...?"

සිනිදු මාලිගා දිහාවට හැරිලා ඇහුවා. මාලිගා තොල්පෙති වෙව්ලද්දි ඔළුව දෙපැත්තට වැනුවා. ඒ ඇස් ඇතුලෙ තව කඳුළු බිංදු තියෙනවා.

"ඔයා කැමතිද මට රිද්දන්න...?"

සිනිදු ඇහුවෙ මාලිගාගේ ඇස් දිහා බලාගෙනම. මාලිගා උත්තර දුන්නැහැ. අත් දෙකින්ම මූණ වහගත්තා.

"මට රිද්දන්න කැමති නම් විතරක් ඔයා ඒ දේ ආයෙමත් කියන්න..."

"නෑ සිනිදු..., මං අයෙමත් ඔයාට එහෙම දෙයක් කියන්නෙ නැහැ... ඒත් ම.. මං ඔයාට එහෙම කිව්වේ මට කාටවත් රිදවන්න බැරි නිසා සිනිදු..."

මාලිගා ඇස්වලින් කඩාවැටෙන කඳුළු අතින් පිහිදාන ගමන් කිව්වා. සිනිදු ඒ අත තමන්ගේ අතින් පැත්තකට කරලා තමන්ගේ පුරතින් මාලිකාගේ කඳුළු වැටෙන කම්මුල් පිහිදුවා. ඒ රෝස කම්මුල්වල සුමුදු බව සිනිදුගෙ පුරතට දැනුණා. මාලිගා ඇස් පිහාටු වෙගයෙන් ගැහෙද්දී විශ්මයෙන් වගේ සිනිදු දිහා බලන් උන්නා. සිනිදු මාලිගාගේ ඇස්වලට එබුනා.

"මාලිගා... හිතට දුක හිතෙන දේවල් ගැන හිතන්නෙපා... ඔයා සතුටින් ඉන්නෝනි. ඔයා දුක් විඳින්න ඕනි කෙනෙක් නෙමෙයි... ඔයා කාටවත් වරදක් කරල නැහැ මාලිගා... ඔයා මගේ සතුට වෙනුවෙන්



WWW.EXPRESSLANKA.TK 127

හුඟක් දේවල් කළා නේද...? මං මොනවද ඔයාගේ සතුට වෙනුවෙන් කලේ...? මං මොනවද ඔයාගේ සතුට වෙනුවෙන් කිව්වේ? මං නිසා ඔයාට වුනේ හිත රිද්ද ගන්න එක විතරයි... ඒත්... ඒත්... මට දැන් ඔයාට යමක් කියන්න තියෙනවා... ඒත් ඊට ඉස්සෙල්ලා ඔයා මට මගේ සතුට වෙනුවෙන් හැමදෙයක්ම දුන්නා වගේ මං මේ ලෝකේ හැමදාම සතුටින් ඉන්නවට ඔයා කැමතිද කියල කියන්න...? කියන්න මාලිගා... ඔයා කැමතිද මං මේලෝකේ හැමදාම සතුටින් ඉන්නවට...?"

අඳහගන්න බැරුව සිතිදු දිහා බලන් ඉන්න මාලිගාගේ ඇස් පිහාටු හයියෙන් ගැහෙද්දී තොල්පෙති වෙව්ලුවා... රෝස කම්මුල් කඳුළු වලින් තෙමිලා යද්දි මාලිගාට කිසිම දෙයක් හිතාගන්න බැරිවුනා. ඒත්...

"ම... මගේ සතුට... හැමදාම ඔයාගේ සතුට තමයි සිතිදු..."

මාලිගා හුඟාක් අමාරුවෙන් ඒ වචන පිටකළා.

"මගේ සතුටත් ඒ වගේ තමයි මාලිගා... මගේ සතුට ඔයා...!"

"සි... තිදු..."

මාලිගා ඇස් විශ්මයෙන් පුරෝගෙන සිතිදුගෙ ඇස් දිහාම බලන් උන්නා. දෙන්නගෙම ඇස් තත්පරයකටවත් එහාට මෙහාට වුන්නැහැ. මාලිගාගේ පපුව ගැහෙන වේගය වැඩිවෙලා තිබුණා.

"සි..තිදු... ඒක එහෙම වෙන්නෝනෙ නැ සිතිදු..."

මාලිගා වේදනාවෙන් මිමුණුවා.

"ඒ... ඒ... ඇයි ...?"

"සි..සිතිදු... ඔයාගේ සතුට වෙන්නෝනි මං නෙමෙයි, මුතු..."

"මාලිගා නැ... දැන් ඒ හැම දෙයක්ම ඉවරයි..."

තවත් මුකුත් එකපාරටම කියන්න මාලිගාට පුළුවන් වුනේ නැහැ. මාලිගා ඇස් දෙක පියාගත්තා. පියවුණු ඇස් පිහාටු යටින් කඳුළු පේලි ගලාගෙන ගියා. ආත්ම ගානක් පෙරුම්පුරලා සිතිදුගෙන් අහගන්න උන්නු මිහිරිම වචනපෙළ ඇහුණු මේ මොහොත... මේ තරම් වේදනාත්මක, අවාසනාවන්ත මොහොතක් වෙයි කියල මාලිගා



WWW.EXPRESSLANKA.TK 128

තුන්හිතකින්වත් හිතල තිබුන් නැහැ. ඒත් ඒක අද අපූත දිනයක ආව සුන පැතුමක් විතරමද...?

"මාලිගා... ඇයි ඔයා ආදරය හිත ඇතුලේ හිරකරගෙන දුක් විඳින්නේ...? ම... ඔයා... මුකුට වරදක් කරල නෑ... මං කෙරුවෙත් නෑ... ඒත් එයා මාව බොරුවට සැක කළා. සැකය තියන තැන ආදරයට ඉඩක් නැහැ මාලිගා... මං මුකුට කෙරුවෙ වරදක් කියල ඔයාට හිතෙනව නම් ඒකට දඬුවම් මට ලැබේවි... ඒත් ඒකට ඔයාටවත් මටවත් වෙන කරන්න දෙයක් නැහැ..."

"ඒ වුනාට මං හිත්ද හෝද ඔය දෙන්නට එහෙම වුනේ...? ප්ලීස් සිතිදූ ... තව ටිකක් හිතල බලන්න..."

"මට තව හිතන්න දෙයක් නැහැ මාලිගා... මං තීරණය කරලා ඉවරයි... දැන් මට ඕනි ඔයාගේ තීරණේ... කි... කියන්න මාලිගා . මං ඔයාගේ වෙනවට ඔයා අකමැතිද? මාලිගා... මං ඔයාට ආදරය කරන්නේ ඔයාගේ දේපළවලට, කාර්වලට තියෙන ආශාවකට නෙමෙයි. මට ඒ කිසිම දෙයක් කවදාවත් ඕනි නෑ... මට ඕනි ඔයාව විතරයි.... ඔයාගේ සතුට මම නම් තවත් හිත ඇතුලේ ආදරය හිරකරගෙන දුක් විඳින්නෙපා මාලිගා... මං ඔයාගෙ... මේ සිතිදූ ඔයාගෙමයි..."

ආදරයේ උණු කඳුළු දෙන්නගෙම ඇස්වලින් පහලට කඩාගෙන වැටුණා. වෙන කවුරුවත් නැති රෝහල් කාමරේ ආදරේ උණුසුම් සුසුම් පාවෙලා ගියා. මාලිගාට තමුන්ගේ කායික වේදනාව අමතක වෙලා... තත්පර විනාඩි වෙලා, කාලය ගෙවිලා ගියා. සිතිදූ ඔෆිස් ගියේ නෑ. හවසට ජීවිතයේ තීරණාත්මක මොහොතකට මුහුණ දෙන්න ඉන්න දෙව්දූවව දාල යන්න සිතිදූට පුළුවන් වුන් නැහැ.

"සිතිදූ අද ඔයා ඔෆිස් යන්නැද්ද...?"

මාලිගා කඳුළු නැවතුණ ඇස්වලින් සිතිදූ දිහා බලලා ඇහුවා.

"නැහැ..."

"ඇයි...?"

"අද ඔයා ලෙහටම වෙලා ඉන්නවා..."



WWW.EXPRESSLANKA.TK 129

සිනිදුගෙ ඇස් දිහා බලාගෙනම මාලිගා යන්තමට හිනාවුනා. සිනිදුට ඒ ඇස්වල දීප්තිමත් බව පෙනුණෙ නුහක් කාලෙකට පස්සේ...

"සිනිදු මයාට බඩගිනියි නේද...?"

"නැහැ..."

"මෙයා බොරු නේද කියන්නේ...?"

"නැහැ මට බඩගිනි නෑ..."

"හොඳ මෙයා වගේ අර පිජ් එක අරින්න..."

"මින් නැහැ..."

සිනිදු පුංචි එකෙක් වගේ උත්තර දුන්නා.

"මත් නැහැ...? දන් විකකට ඉස්සෙල්ල කියපු වචන අමතක වුණාද...?"

"මොකක්ද...?"

"මයාගේ සතුට මගේ සතුට කියල...?"

"සමාවෙන්න..."

සිනිදු අහිංසක විදිහට මාලිගාගේ මූණ දිහා බලාගෙනම එකපාරටම මාලිගාගේ ඇඳ ළඟ තියෙන පුංචි ශීතකරණයෙ දොර ඇරියා. ඊට පස්සේ ඒක ඇතුළෙන් කිරිපැකට් එකකුයි ඇපල් ගෙඩියකුයි අරගෙන ඇපල් ගෙඩිය මාලිගාට දෙන්න හැදුවා. මාලිගා අහිංසක විදිහට හිනාවුණා.

"මට හොඳ නෑ සිනිදු අද මුකුත් කන්න..."

"ඇයි ...?"

සිනිදුට එකපාරටම එහෙම ඇහුණා. මාලිගා ඒකට උත්තර දෙන්නැතුව බිම බලා ගත්තා. සිනිදුට එතකොටයි ආයෙමත් මාලිගාගේ ඔපරේෂන් එක මතක් වුණේ. සිනිදු ආපහු අතට ගත්තු කිරි පැකට් එකයි ඇපල් ගෙඩියයි ආපහු ශීතකරණය ඇතුලෙන් තියන්න ඒකෙ දොර ඇරියා.

"සිනිදු...!"

සිනිදු මාලිගා දිහා බලන්නැතුව කිරි පැකට් එකයි ඇපල් ගෙඩියයි



WWW.EXPRESSLANKA.TK 130

ආපහු ශීතකරණෙ ඇතුළෙන් තියල දොර වැහුවා.

"මොකක්ද සිනිදු කළේ...? ඔයා කන්න... බඩගින්නෙ ඉන්න හොඳ නැහැ."

"ඔයාට බඩගින්නෙ ඉන්න හොඳ නම් මං එක වෙලක් බඩගින්නෙ හිටියම මොකද වෙන්නේ...?"

"එහෙනම් ඔයා ගත්තු අර කිරි පැකට් එකවත් බොන්න..."

"එපා දන් ඕන් නැහැ... ඔයා ළඟ ඉන්නකොට බඩගිනි නෑ... හිත හොඳටම පිරිලා..."

සිනිදු මාලිගාගේ හිසකෙස් අතරින් තමුන්ගේ ඇඟිලි තුඩු යවන ගමන් කිව්වා. මාලිගාගේ ආදරණීය ඇස් සිනිදු දිහා දයාබරව බලන් උන්නා. කඳුළු ගලපු පාරවල් මැකුන්නැති රෝස කම්මුල් ආදරයෙන් පිබිදුණා... තත්පරෙන් තත්පරේ මාලිගාගේ ජීවිතයේ තීරණාත්මක මොහොතකට වේලාව ළං වුණා...

"සිනිදු..."

"ම්.?."

"මොකක්ද සිනිදු අද මට කරන්නේ.?."

මාලිගා එහෙම අහපු විදිහට සිනිදුගෙ පපුව දාල පිච්චිලා ගියා. ඒත් ඒ බවක් මාලිගා ඉදිරියෙ පෙන්වන්න සිනිදුට පුළුවන් කමක් නෑ....

"බයවෙන්න එපා... පොඩි ඔපරේෂන් එකක් තියෙන්නේ..."

සිනිදු උත්තර දුන්නේ හැම වේදනාවක්ම යටකරගෙන.

"අප්පච්චියි, ඩොක්ටර් අන්කලුයි කියන්නෙත් ඔය ටිකමයි. ඒත් මට බයයි සිනිදු... මට මේ කකුල තියෙනවද කියලවත් තේරෙන් නෑ.. කියන්න ...ඔයාලා මගෙන් මුකුත් හංගනවද...?"

"න්... නැහැ රත්තරං... ඔයාව සනීප කරන්නනෙ ඔපරේෂන් එක කරන්නේ... ඔයාට මුකුත් වෙන්නැහැ... බය නැතුව ඉන්න..."

සිනිදු මාලිගාගේ කම්මුල් දෙපැත්ත දෝතින්ම අල්ලගෙන ඒ ඇස් දිහා බලාගෙන කියනකොට මාලිගා ඒ අත් දෙක තමන්ගේ අත්



WWW.EXPRESSLANKA.TK 131

දෙකෙන් හිමීට අල්ල ගත්තා.

"සිනි... දූ..."

"ම්...?"

"මාව හවසට තියටර් එකට ගන්නකම් ඔයා මගෙ ළඟ ඉන්නව නේද...?"

"ඔව්. අද විතරක් නෙමෙයි... අදින් පස්සේ හැමදාමත් මං ඉන්නෙ ඔයා ළඟ තමයි"

ආදරය උතුරල ගියපු හදවතින් කියපු ඒ වචන පෙළට මාලිගා උත්තර දුන්නෙ ඇස්වලින් එළියට පැන්න කඳුළු වලින්. ආදරයේ උණු කඳුළු වලින් සේදුන කම්මුල් ගැහෙද්දී මාලිගා තමුන්ගේ අත්දෙක බෙල්ල දිහාවට යැව්වා. සිනිදූ මුකුත් හිතාගන්න බැරුව මාලිගා දිහා බලන් උන්නා. ඊට පස්සේ...

"සිනිදූ... චුට්ටක් පාත්වෙන්න..."

"මොකටද...?"

"කියන දේ කරන්න..."

මාලිගා පුංචි එකියක් වගේ කිව්වා. දකින දෙයින් සිනිදූගේ ඇස් විශ්මයෙන් ලොකුවුණා. මාලිගා තමුන්ගෙ කරෙන් ගලව ගත්තු මාලේ අත් දෙකෙන්ම අල්ලගෙන සිනිදූගෙ මූණ දිහා බලන් ඉන්නවා.

"මොකද ඔය කරන්න හදන්නේ...?"

"ඔයාට ඒවයින් වැඩක් නැහැ... ඉතිං පාත්වෙන්න..."

ඒත් සිනිදූ පාත්වුන් නැහැ... මාලිගා දිහා ඇස්පිය ගහන්නැතුව බලන් උන්නා.

"සිනිදූ ඔයා මට බොරුවට නේද ආදරෙයි කිව්වෙ...? ම්...?"

මාලිගා ඊළඟට එහෙම ඇහුවා. සිනිදූට තවත් ඒ හිටපු ඉරියව්වෙන්ම ඉන්න පුළුවන්වුන් නැහැ. සිනිදූ මාලිගාගේ ඇස් මගහරින්නැතුවම මාලිගාගේ මූණට එබුනා. මාලිගා තමුන්ගේ දෝතින්ම අල්ලාගෙන උන්නු රත්තරන් මාලේ සිනිදූගේ කරට ලංකලා...

"සිනිදූ... මේ මාලේ අදින් පස්සේ මගේ නෙමෙයි... මේක ඔයාගේ..."



WWW.EXPRESSLANKA.TK 132

මේක ඔයා ජීවත්වෙලා ඉන්නකම්ම ඔයා ළඟ තියෙන්න ඕනි... එතකොට ඔයා කොහේ හිටියත් මං ඔයා ළඟ ඉන්නවා කියල ඔයාට දැනේවි සිනිදූ..."

"මාලිගා මං කොහේ හිටියත් ඔයත් එක්ක ඉන්නවා... මං ඉන්න තැනක ඔයත් ඉන්නෝනි..."

සිනිදූ මාලිගාගේ අත්දෙක දෝතින්ම අල්ලගෙන තමුන්ගේ කොල්පෙති වලට ලංකලා මාලිගාගේ ඇස් පියවුණා. ආත්ම ගාණක් විඳලා හුරුවුණු ආදරයක මතකය අවදිවෙලා තිබුණා. වේලාව වේගයෙන් යනව දෙන්නටම දැනුන් නැහැ. රත්නායක සිනිදූටයි මාලිගාටයි නිදහසේ ඉන්න ඉඩදීලා ඩොක්ටර් එදිරිසිංහගේ කාමරේට ගිහින් උන්නා. පුංචි කාලේ ඉඳන්ම මාලිගාව බලාගත්තු මැගී කාමරේට ඇතුල්වෙන තැන තිබුණ පුටුවක වාඩිවෙලා උන්නේ ඇස්වල කඳුළු පුරෝගෙන. ඔරලෝසු කටු වේගයෙන් කැරකුණා මාලිගාගේ කකුල කපන ඔපරේෂන් එකට සියල්ල සූදානම් වුණා. ඊත් ඊට ඉස්සෙල්ලා...

"සිනිදූ..."

"රත්තරං..."

"මං පව්කාරියෙක් නෙමෙයි නේද සිනිදූ..."

"මොනවද ඔය කියවන්නේ.?. හිත සතුටින් තියාගන්න... ඔයා කාටවත්ම වරදක් කරල නෑ... ඔයා දෙව්දූවක්..."

"එහෙනං සිනිදූ මං ඔයාට පුංචි බඩ්ඩක් කියන්නද...?"

"හ්ම්... කියන්න..."

සිනිදූ පුංචි එකෙක් වගේ හිනාවෙලා ඔළුව දෙපැත්තට වැනුවා. දෙන්නගෙම ඇඟිලිතුඩු එකට පැටලිලා තිබුණා.

"මාව ඔපරේෂන් කලාට පස්සේ සිහිය එනකොට... ඔයා ඔය රැවුල කපල ලස්සනට කොණ්ඩෙ පීරලා... අර ඔයා මාත් එක්ක මුලින්ම අපේ ගෙදරට ආව දවසේ ඇඳගෙන ආව ලා රෝසපාට ෂර්ට් එකයි, කළුපාට කලිසමයි ඇඳගෙන එනවද මට පේන්න.?."

මාලිගාගේ ඒ වචන සිනිදූගෙ පපුව පුච්චගෙන ගියා. ඊත්...



WWW.EXPRESSLANKA.TK 133

"හ්ම්... මං ඒ ඇඳුමට ලස්සනද...?"

"ගොඩාක්..."

සිනිඳු අහිංසක විදිහට හිනාවුණා මාලිගා හැමදෙයක්ම අමතක වෙලා වගේ පුංචි එකියක් විදිහට සිනිඳු දිහා ආදරෙන් බලන් උන්නා.

"සිනිඳු... තව බඩ්ඩක් තීනව කියන්න..."

"ඒ මොකක්ද...?"

"අද රෑට ඔයා ගෙදර ගියාම ඔයාගේ කාමරේ නැතුව මගේ කාමරේ නිදිය ගන්නෝනි. හොඳද...?"

සිනිඳුගේ ඇස් එකපාරටම ආයෙමත් ලොකුවුණා.

"ඒ... ඒ... මොකටද...?"

"ඒ මොකටද කියල ඔයාට වැඩක් නැහැ... කියන්න යනව කියලා.?."

"හ්ම්... හැබැයි ඔයා නැතුව ඒ කාමරේ පාළුවෙලා ඇති..."

"නැහැ... පාළු නෑ... ඔයා අද ඒ කාමරේම නිදියන්න... මං පුළුවන් වුණොත් හීනෙන් ඔයා ළඟට එන්නම්... හොඳද...?"

මාලිගා ඇස් දෙක බාගෙට පියාගෙන සිනිඳුගේ මූණ දිහා බලාගෙනම කිව්වා. මාලිගාගේ මූණ තිබුනේ ශාන්ත බවෙන් පිරිලා. තව ටික වේලාවකින් මාලිගාව ඔපරේෂන් තියටර් එකට ගෙනියන ට්‍රොලි එක කාමරේට ඇතුල් වුණා.

රත්නායක මාලිගා ළඟට ඇවිත් මාලිගාගේ නළල හිමීට සිපගත්තා. මාලිගාගේ ඇස්වලින් කඳුළු පැන්නා. මැගී ඇස්වල කඳුළු පුරෝගෙන බලන් උන්නා. ට්‍රොලියෙ හාන්සි කරපු මාලිගා මාරුවෙන් මාරුවට සිනිඳු දිහායි රත්නායක දිහායි බැලුවා. සිනිඳු මාලිගා ළඟට ළංවුනේ ඉබේටම වගේ. නොදැනුවත්වම මාලිගාගේ ඇඟිලි තුඩුවලට සිනිඳුගේ අත ඇල්ලුණා...

"සිනි... ඳු... ම මං කියපු දේ කරනව... න්... නේද...?"

කඳුළු පැනපු ඇස්වලින් සිනිඳු දිහා බලාගෙන මාලිගා හිමීට මිමිණුවා. සිනිඳු ඒ ඇස් දිහා බලාගෙනම 'හා' කියන්න මගේ ඔලුව හෙලෙව්වා. සිනිඳුගේ ඇස් වලින් කඳුළු පනින්න ඔන්න මෙන්න



WWW.EXPRESSLANKA.TK 134

වගේ... එතන උන්න හැමෝගෙම මූණුවල වේදනාව පිරිලා තිබුණා. මාලිගාගේ ඇඟිලි තුඩු හිමීට සිනිදුගේ අතින් ගිලිහුණා...

සිනිදුයි, රත්නායකයි, මැගියි මාලිගාව ගෙනියන ට්‍රොලිය පිටිපස්සෙන් තියටර් එක ළඟටම ගියා. ට්‍රොලියෙ හාන්සිවෙලා තමන් දිහා බලාගෙන යන මාලිගාගෙ මූණ සිනිදුට බලන්ඉන්න පුළුවන් වුන්නැහැ. සිනිදු අහක බලාගත්තේ වේදනාව දරාගන්න බැරුව. සිනිදුට මුළු ඉස්පිරිතාලෙම දෙදරලා යන්න කෑගහලා අඬන්න හිතුණා ඒත්... මාලිගා නර්ස්ලත් එක්ක තනියම ඔපරේෂන් තියටර් එකට ඇතුල් වුණා. සිනිදුටයි, රත්නායකටයි, මැගීටයි තියටර් එකේ දොර ළඟින් එහාට යන්න අවසර නැති බව තුන්දෙනාම දැනගෙන උන්නා.

❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈ ❈

රත්නායකයි, සිනිදුයි ගෙදරට ආවේ කොහොමද කියල දෙන්නටම තේරුමක් තිබුන් නැහැ. සිනිදු කවදාවත් නැති විදිහට කාරෙක වේගයෙන් පදවගෙන ආවා. රත්නායක මුකුත් කිව්වේ නෑ. කියන්න තරම් ජීවිත ආශාවක්වත්, කල්පනාවක්වත් රත්නායකටත් තිබුන් නැහැ. මාලිගාට සිහිය ආවට පස්සේ ආයෙමත් කාමරේට ගේන්නේ උදේ කියලා ඩොක්ටර් කියලා තිබුණා. ඒත් ඒ අද හවස ඔපරේෂන් තියටර් එකට ඇතුල් වුණ විදිහට නෙමෙයි. ඉපදුනදා ඉඳන්ම අද වෙනකම්ම හිටපු විදිහට නෙමෙයි, ආයේ මුළු ජීවිතේටම එක කකුලක් විතරක් හිමිවුණ අසරණියක් විදිහට මාලිගා හෙට උදේට තියටර් එකෙන් එළියට එන බව මාලිගා හැර හැමෝම දැනගෙන උන්නා...

මේ රැය තරම් දිගු රාත්‍රියක් සිනිදුගේ ජීවිතේ තවත් තිබුනේ නැහැ. රත්නායක කවදාවත් නැති විදිහට බිව්වා. පුංචි දරුවෙක් වගේ අඬ අඬා වැලපුණා. රත්නායකට බීමතටම වාඩිවෙලා උන්න කවිච්චිය උඩම නින්ද ගියා. ඒත් සිනිදුට නින්ද ගියේ නෑ. සිනිදු ඇස්වලින් කඩා වැටෙන උණු කඳුළුවලට නිදහසේ පහළට වැටෙන්න ඉඩදීලා



WWW.EXPRESSLANKA.TK 135

කල්පනා කළා... හෙටින් පස්සේ එක තත්පරයක් විතරක් හිමංසෙවෙ දෙව් දූවව බලාගන්න හැටි ගැන හිතුවා. කඳුළු මැද්දෙන් රස සිහින හිතේ ඇඳුණා... සිනිඳුගේ ඔළුව ඇතුළෙ අකුණක් කෙටුවෙ එතකොට...

"මාලිගා කරපු ඉල්ලීම...!"

සිනිඳු මාලිගාගේ ගෙදරට ආවට පස්සේ ජීවිතේ පළවෙනි වතාවට මාලිගාගෙ කාමරේට ඇතුල්වෙන්න හිමීට හිමීට තරප්පු පෙළ නැග්ගා. සිනිඳු කාමරේ දොර හිමීට තල්ලු කළා... කාමරය පුරාම තිබුණේ ආත්මීය සුගන්ධයක්. සිනිඳු කාමරේ ලයිට් එක දැම්මා. සිනිඳුගේ ඇස්වලට එකපාරටම පෙනුණේ බිත්තියේ කෙළවරේ බිම තියල තිබුණ මාලිගාගේ ලොකු පින්තූරේ. මාලිගා තරු පොකුරු හිනාවෙන් මූණ පුරෝගෙන බලන් ඉන්නවා. සිනිඳු ඒ පින්තූරේ දෝතින්ම අරගෙන ඒ මූණ දිහා ඇසිපිය ගහන්නැතුව බලන් උන්නා. කඳුළු ඇස් ඇතුළෙන් පහළට කඩාගෙන වැටුණා. සිනිඳු පින්තූරේ පපුවට තුරුළු කරගෙන මාලිගාගේ ඇඳ උඩ වැතිරුණා. එතකොටම... එකපාරටම කාමරේ ලයිට් එක නිවුණා...!

"සිනිඳු... නිදියන්නැද්ද...? මට ඔයා ළඟට එන්න ඕනි..."

මාලිගා දුහුල් සුදු දිග ගවොමකින් සැරසිලා ඇඳේ වැතිරිලා ඇස් පියාගෙන ඉන්න සිනිඳු ළඟින් ඉඳගත්තා. ජීවිතේ පළවෙනි වතාවට මාලිගා සිනිඳුගේ මූණට හිමීට පාත්වෙලා ඒ නළල සිපගත්තා. සිනිඳුගෙ ඇස් පිහාටු හිමීට ඇරුණා. ඒ මූණ මදහසින් පිරිලා... සිනිඳු ආදරය උතුරන ඇස් වලින් මාලිගා දිහා බලන් උන්නා.

"සිනිඳු... ජීවිතේ හරි පුදුමයි නේද...?"

මාලිගා පිහාටු ගැහෙන්නැති ඇස් වලින් බලාගෙන ඇහුවා.

"ඔව්... ජීවිතේ ඒ සිද්දවෙන පුදුම දේවල් නිසාම තමයි ලස්සන..."

"එදා ඔයාව මුලින්ම ලොතරැයි කුඩුව ඇතුළෙදි දකපු වෙලාවෙදි මං හීනෙකින්වත් හිතුවෙ නෑ අපි මේ වගේ හමුවෙයි කියලා..."

"මමත් හීනෙකින්වත් එහෙම හිතුවේ නෑ... එත් මට ඔයාගේ ඔය මූණ දක්කම මොකක්දෝ හුරු ගතියක් දැනුණා..."



WWW.EXPRESSLANKA.TK 136

"ඒ සංසාර පුරුද්ද..."

මාලිගා කම්මුල් වලගැහෙන හිනාවෙන් මූණ පුරෝගෙන කිව්වා.

"අපි මීට ඉස්සෙල්ලා ආත්ම වලදීත් හමුවෙලා තියෙනව කියලා ඔයාට හිතෙනවද?"

"ඔව්...! හිතෙනවා විතරක් නෙවෙයි. මට දැනෙනවා..."

"ඇත්තට.?."

"ම්...."

"මේ වගේද...?"

"මට තේරුන් නැහැ... කෝ.?."

"සොඳුරු අතීතයේ නිමල පැතුම වී
මගෙ හද තුළ ඔබ ඉන්න ඇති...
ඒ හින්දා යළි සොහොන සිහින් අපි
ආදරයෙන් හමුවෙන්න ඇති..."

සිනිදු මාලිගාගේ ඇස් දිහා බලාගෙනම ඒ සිංදුව හිමීට මිමිණුවා. ඊට පස්සෙ මාලිගා ආයෙමත් හිමීට පාත්වෙලා සිනිදුගෙ කම්මුලක් සිපගත්තා. මේ මංගල රාත්‍රියේ උණුසුම් නිමේෂයේ දෙන්නගෙම හදවත් ගැහෙන රිද්මය දෙන්නටම දැනුණා. සිනිදු තමන්ගේ ඇඟිලි තුඩුවලින් මාලිගාගේ හිස හිමීට පිරිමැද්දා.

"මාලිගා..."

"ම්..."

"මං ඔයාට ලස්සන කතාවක් කියන්නද.?."

"කතාවක්...!"

"ඔව්..."

"දුක හිතෙන එකක් නෙමෙයිනේ.?."

"අපෝ නැහැ..."

"එහෙනං ජෝක්නේ... කියන්න..."



WWW.EXPRESSLANKA.TK 137

මාලිගා සිනිදුගේ උණුහුමින් මිදිලා ඇඳ උඩ එරමිණියා ගොතාගෙන කම්මුල් දෙකට අත්දෙක තියාගත්තා. ඊට පස්සෙ ආදරය උතුරල යන මූණෙන් සිනිදුගෙ මූණ දිහා බලාගෙන...

"හරි කියන්න..."

"ඉන්න එහෙනං හොඳට අහගන්න..."

"හ්ම්..."

"ඔයා අහල තියෙනව නේද රාධා ක්‍රිෂ්ණා ගැන.?."

"ඔ... ඔව්..."

"මේ කියන කතාවේ ප්‍රධාන චරිත දෙක ඒ දෙන්නා හොඳද...?"

"හ්ම්..."

මාලිගා හුඟක් ඕනකමින් සිනිදුගේ මූණ දිහා බලාගෙනම කම්මුල් දෙකට අත් දෙක තියාගෙන අහගෙන උන්නා.

"ඉතින් ඒ රාධායි ක්‍රිෂ්ණයි විවාහ වුණ දවස තියෙනවනේ... එදා ඒ දෙන්නා එයාලගේ මංගල රාත්‍රිය ගත කරන්න ඒ දෙන්නට වෙන් කරලා තිබුණ ලස්සන කුටියක තනිවුණා කියමුකො... හරිද.?. ඉතිං ඊට පස්සේ මොකද දන්නවද වුණේ...?"

"මං දන්නැහැ..."

මාලිගා මූණ තරු පොකුරු හිනාවෙන් පුරෝගෙන කිව්වා.

"ඉතිං ඒක තමයි මේ කියන්නේ..."

"කියන්න ඉක්මනට මට අගේ කරන්නැතුව..."

"එහෙම බෑ... රසවත් දේවල් කියනකොට එකපාරටම කියන්න... හම්... ඔන්න එහෙනං අහගන්න... ඉතිං, ඔය රාධායි ක්‍රිෂ්ණයි ඒ දෙන්නගේ මංගල යහන් ගැබට ගොඩවුණානේ... එතනදි ක්‍රිෂ්ණටයි, රාධාටයි අපූරු සිතුවිල්ලක් පහළ වුණා. ඒ දෙන්නට ඕන වුණා මෙතෙක් කාලයක් ඒ දෙන්නා අතරේ තිබුණෙ දිව්‍යමය ප්‍රේමයක් කියලා ඔප්පු කරන්න. ඉතිං ඒ දෙන්නගේ මුල්ම මංගල රාත්‍රියේදී ඒ දෙන්නා ඒකට ලස්සන වැඩක් කළා..."

මාලිගා ඇස් පිහාටු ගහන්නැතුව වගේ සිනිදුගෙ මූණ දිහා



WWW.EXPRESSLANKA.TK 138

බලන් ඉන්නවා...

"රාධයි, ක්‍රිෂ්ණයි ඒ දෙන්නාගෙ මංගල යහනේ හරියටම මැද්දෙන් පිච්චමල් පේළියක් තිබ්බා. ඊට පස්සේ ඒ දෙන්නා කතාවුණා අපි හෙට එළිවෙනකොට මේ එක පිච්චමලක්වත් පොඩිනොවන විදිහට මේ යහන් ගැබේ දෙපැත්තට වෙලා නිදියගමු කියලා."

"ඉතිං ඒක ඒ විදිහටම උනාද?"

"ඔව් ඒක ඒ විදිහටම සිද්ධ වුනා. උදේ එ දෙන්නා අවදිවෙලා බලනකොට අර පිච්චමල් එකකටවත් මොනවත් වෙලා තිබුන්නැහැ... ඔයාට තේරුණා නේද ඒකට හේතුව මොකක්ද කියලා.?."

"හ්ම්... හ්ම්... ඉතිං.?."

"ඉතිං ඒ දෙන්නගේ ආදරය දිව්‍යමය ප්‍රේමයක් කියලා ඒකෙන් ඔප්පු වුණා..."

"හරි ෂෝක් වැඩක් ඒ දෙන්නා කරල තියෙන්නේ නේද...?"

"ඔව්..."

"මේ..., සිනිදු... මං ඔයාට බඩ්ඩක් කියන්නද...?"

"මොකක්ද...?"

"අපි දෙන්නත් ඒ වගේ ඉඳිමුද අද...?"

"ඉමු... ඔයාට පුළුවන්ද පිච්චමල් ටිකක් හොයාගෙන එන්න.?."

"පිච්චමල් හොයාගෙන එන්න...? මේ මහ රෑ මං කොහෙන්ද පිච්ච මල් හොයන්නේ.?." මාලිගා කිව්වේ ඇස් ලොකුකරගෙන...

"එහෙනං කරන්න දෙයක් නෑ..."

දෙන්නටම හයියෙන් හිනාගියා. ඒ අතරේ සිනිදු මාලිගාව තමන්ගේ පපුවට තුරුළු කරගත්තා. ආදරයේ රස හැඟුම්... උණුසුම් සුසුම්... සුගන්ධවත් නිමේෂයකට ආරාධනා කරලා තිබුණා... ඒත්...

සිනිදුගේ ඇස් පිහාටු එකපාරටම දිග හැරුණා. හැමදෙයක්ම සිහිනයක් විතරක් බව සිනිදුට දැනුණේ එතකොට... හැබැහින් සිනිදුට ඇහුණේ ගෙයි ආලින්දයේ දිගටම නාදවෙන දුරකථනයේ සීනු හඬ... සිනිදු ඇඳෙන් නැගිටලා එකපාරටම දුරකථනය ළඟට දුවගෙන ගියා...



WWW.EXPRESSLANKA.TK 139

"හලෝ..."

"හලෝ.. ඔය මිස්ටර් රත්නායකලාගෙ ගෙදරද...?"

"ඔ... ඔව්..."

"පොඩි හදිස්සියක්..! ඉක්මණට මිස්ට රත්නායකට හොස්පිටල් එකට එන්න කියන්න..."

කිසිම දෙයක් හිතාගන්න පුළුවන් වුනේ නැහැ. සිහිදුයි රත්නායකයි වැඩි වෙලාවක් යන්න කලින් හොස්පිටලෙට ආවා. ඒත් එනකොට සිදුවෙන්න ඕන සියල්ල සිදුවී අවසන් වෙලා. ඔපරේෂන් එකට ගන්න මාලිගාට ආපහු සිහිය ගන්න පුළුවන් වෙලා තිබුණේ නැහැ. වෛද්‍ය විද්‍යාවට ආත්මයක ආයුෂ කෙළවර වීම වළක්වන්න බැරිවෙලා. ලස්සන හිතක් තිබුණු දෙව්දුව තමන්වත් රහසෙම තමුන්ගේ අන්තිම හුස්ම පොද පවන් රොදට එක්කරලා සමුගෙන ගිහින්.

සුදු පොරෝනයෙන් වහලා තිබුණු මාලිගාගේ සුදු මූණ ඩොක්ටර් එදිරිසිංහ ආයෙමත් නිරාවරණය කළා. සිහිදුට මුළු ලෝකෙම අඳුරු වෙලා යනව වගේ දැනුණා. ඇස් දෙක නිලංකාර වෙගෙන එනකොට සිහිදු බිත්තියට වාරුවුණා. සට සට ගාලා කඳුළු කැට කඩාගෙන වැටුණා. රත්නායක වේදනාව දරාගන්න බැරුව මුළු හොස්පිටලෙම දෙදරලා යන්න කෑ ගහලා අඬන්න පටන් ගත්තා. මාලිගා මරණයේ වේදනාව අත් නොවිඳම අවසන් නින්දට ගිය බව ඒ ශාන්ත මූණේ සටහන් වෙලා තිබුණා.

"කකුල විතරක් කපලා මට භාරදෙනව කියල කියපු මගෙ කෙල්ලට මොකද කලේ ඩොක්ටර්.?."

රත්නායක දරාගන්න බැරි වේදනාවෙන් ඩොක්ටර් එදිරිසිංහගේ උරහිස් දෙකෙන් අල්ලගෙන හෙලෙව්වා. ඩොක්ටර්, රත්නායක සනසවන්න වගේ පිටට තට්ටු කළා...

"මේක වෛද්‍ය විද්‍යාවේ දුර්වල කමක් නෙමෙයි රත්නෙ... දුව ගෙනාපු ආයුෂ මෙච්චරයි.. අයෑම් සොරි..."



WWW.EXPRESSLANKA.TK 140

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

ඒ මුසල හැන්දෑවෙ ආකාසේ කළු වලාවලින් වැහිලා ගිහින් තිබුණා. දෙනෝදාහක් රැස්වෙලා උන්නත් මුළු පරිසරයම පාළුවෙලා ගිහින් වගේ පෙනුණා. කොහුවල සුසාන භූමියට ඇවිල්ල උන්නු හැමෝගෙම ඇස්වලින් කඳුළු කඩා හැලෙද්දි මාලිගාගේ චිතකය ඇවිලෙන ගිනි පුළිඟු අහසට මුහුවුණා. පාසලේ, සංගීත පන්තියේ මිතුරු මිතුරියන්, මල්කි, ආත්තම්මා, චන්ද්‍ර ඒ හැමෝවම හඬවමින් තරු පොකුරු හිනාව මැකිලා ගියා.

සිනිඳු හැම වේදනාවක්ම හිතේ හිරකරගෙන මාලිගාගේ අවසන් කටයුතු වල හැමදෙයක්ම කරන්න වෙහෙසුණා... මුළු ලෝකෙම දැනගෙන නොහිටියට තමන්ට ජීවිතය දුන්න ආත්මීය ආදරයේ පෙම්වතිය චිතකයේ දැවිලා යන දර්ශනය සිනිඳු පසුව පැලෙන්න එන වේදනාවෙන් බලන් උන්නා...

❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋ ❋

අහස කළුවරම කළුවරයි... එකම තරුවක්වත් පායල තිබුන් නැහැ. සිනිඳු හැමෝටම හොරෙන් පෝටිකෝව යට නතර කරලා තිබුණු මාලිගාගේ බී. එම්. ඩබ්ලිව්. එකට ගොඩවුණා. සිනිඳු මාලිගා ආදර කතාව මේ හිතක් පපුවක් නැති කාරෙක දන්න තරම් කවුරුවත් දැනගෙන උන්නැහැ... කාරෙක වේගයෙන් මාලිගාලගේ වත්තෙන් පිටවුණා. හයිලෙවල් පාරේ පහන් කණු එකින් එක වේගයෙන් පහුවෙලා ගියා. සිනිඳු නුගේගොඩින් කාරෙක කොහුවල පැත්තට හැරෙව්වා. කාරෙක සුසාන භූමියේ යෝධ ගේට්ටුව ළඟ නතර වුණා. සිනිඳු ඇතුළට යන්න බැරුව යෝධ ගේට්ටුවේ යකඩ කූරු අල්ලගෙන පාළු සුසානයේ ඈත බලන් උන්නා. මෙච්චර කාලයක් පපුව ඇතුළෙ



WWW.EXPRESSLANKA.TK 141

හිරකරගෙන උන්නු හැම හැඟීමක්ම කඳුළුත් එක්ක එළියට පැන්නා... ඒ ඉකිබිඳුම් හඬ සුසාන භූමිය පුරාම විහිදිලා ගියා... වැහිපොද එකින් එක අහසින් බිමට කඩන් වැටුණා. සිරිපොද මොරගෙඩි වුණා. ඒත් සිනිදු ගේට්ටුවේ යකඩ කූරු අත්හැරියේ නෑ...

"සිනිදු...!"

ඒ ආත්මීය හඬ දිගේ සිනිදු එකපාරටම පිටිපස්ස බැලුවා... සිනිදුගේ ඇස් ලොකුවුණා... මාලිගා සුදු සාරියකින් සැරසිලා දේව දූතිකාවක් වගේම බී. එම්. ඩබ්ලිව්. එක ළඟ හිටගෙන ඉන්නවා...

"සිනිදු අඬන්නැතුව මතනින් යන්න..., මං මතන නෑ සිනිදු... ඔයා අඬන්නෙපා... මට දුක හිතෙනවා..."

"ම... මාලිගා..!."

යකඩ ගේට්ටුව එකපාරටම සිනිදුට අතහැරුණා. සිනිදු අත්දෙකම දික්කරගෙන ඉස්සරහට ආවා... ඒත් මාලිගා උන්නේ නෑ...

"මාලි.. ගා...!"

සිනිදු මුළු මහපාරම දෙදරවලා යන්න කෑ ගහගෙන පාත්වුණා... ඊට පස්සේ ඔලුව කාරෙකේ බොනට්ටුව උඩ ගහගත්තා. අකුණු පුපුරලා මහ වැසි වැටුණා... සිනිදුගේ ඇස් වලින් හෝස්ගාලා කඩා ගෙන ආව උණු කඳුළු සීතල වැහි වතුරට එකතුවෙලා ගලාගෙන ගියා...

අවසානයි...



WWW.EXPRESSLANKA.TK 142